විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ශ්‍රී ලංකාව

තිස් හතරවැනි වාර්ෂික වාර්තාව

பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு

இலங்கை

முப்பத்தி நான்காவது வருடாந்த அறிக்கை

UNIVERSITY GRANTS COMMISSION

SRI LANKA

THIRTY FOURTH ANNUAL REPORT

2012

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

හැඳින්වීම

විශ්වවිද්‍යාල පද්ධතියේ ප්‍රධාන ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 1978 දෙසැම්බර් මස 22 වන දින පිහිටුවන ලදී. විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය, උසස් අධ්‍යාපන ආයතන වලට අරමුදල් වෙන් කිරීම, අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම, උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලන නියාමක සහ උසස් අධ්‍යාපන ආයතනවලට ශිෂ්‍යයන් ඇතුලත් කිරීමේ නියාමක තීරණය කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යයන් වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්ම

සමස්ථ ලෝක ප්‍රවනතාවන් සමග යමින් ජාතියේ අවශ්‍යතාවයන් සහ අපේක්ෂාවන් ඉටුවන ආකාරයෙන් උසස් අධ්‍යාපන පද්ධතිය තුළ 'විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථාන' ජාලයක් නියාමනය කරමින්, සංවර්ධනය කර පවත්වා ගෙන යන විශිෂ්ඨ පාලක ආයතනයක් වීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙහෙවර

උසස් අධ්‍යාපනය සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශව සමග සම්බන්ධ වී ජාතික සහ ගෝලීය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි අධ්‍යයන පාඨමාලාවන්ගේ විවිධත්වය, ප්‍රමිතිය සහ එහි ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සහ අදාලත්වය සහතික කිරීම තුලින් ප්‍රශස්ථ මට්ටමේ ඉගැන්වීමේ පර්යේෂණ පැවැත්වීමේ නව සොයාගැනීම් සහ ගෝලීය මට්ටමේ සේවාවන් හි නිරත "විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථාන" ජාලයක් බවට උසස් අධ්‍යාපන පද්ධතිය පත්කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදෙමින්, පෝෂණය කරමින් සහ/ හෝ පහසුකම් සලසමින් රටේ අවශ්‍යතාවන්ට අදාළ වන ඉහළම මට්ටමේ ඉගෙනීම, පර්යේෂණ පැවැත්වීම සහ නව්‍යකරණය වෙත කැපවුණු සහ මහජනයාට වගකිව හැකි ආකාරයේ, පුළුල් පිළිගැනීමක් සහ වැඩි ඉඩ ප්‍රස්ථාවන් සහිත උසස් අධ්‍යාපන පද්ධතියක්, අවශ්‍ය සම්පත් වෙන් කිරීම සහ යහපත් පාලනය සහ කළමනාකරණය තුළින් ස්ථාපිත කර නිසි මග පෙන්වීමක් ඔස්සේ, සංවර්ධනය කොට පවත්වාගෙන යෑම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙහෙවරයි.

සභාපතිතුමියගේ කාර්ය සාධන සමාලෝචනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 1978 වර්ෂයේ පිහිටුවන ලද අතර එය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල පද්ධතියේ ප්‍රධාන ආයතනය බවට පත්විය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම සහ සම්බන්ධීකරණය විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතනවලට අරමුදල් වෙන් කිරීම, අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගෙන යාම, උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලනය නියාමනය කිරීම, උසස් අධ්‍යාපන ආයතනවලට ශිෂ්‍යයන් ඇතුලත් කිරීමේ නියාමක තීරණය කිරීම සහ කොමිෂන් සභාව යටතේ පවත්නා සෑම ආයතනයකටම ප්‍රගතිය සහ සංවර්ධනය සඳහා සහාය ලබාදීම එහි වගකීම වේ.

2012 වර්ෂය තුල දී විශ්වවිද්‍යාලවල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉටුකරන ලද කාර්යයන් සමාලෝචනය මෙම වාර්ෂික වාර්තාවෙන් සිදුකෙරේ. ඒ අනුව 2012 වර්ෂය තුල දී සිදු වූ ප්‍රධානතම ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණයන් ලෙස ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම, අධ්‍යයන විශිෂ්ඨතා, ශිෂ්‍ය කටයුතු, කාර්යමණ්ඩල සංවර්ධනය, කාර්මික ආරවුල්, යටිතල පහසුකම් සංවර්ධනය, තොරතුරු තාක්ෂණ සංවර්ධනය, තත්ත්ව සහතික මූල්‍ය පරිපාලනය සහ කළමනාකරණය ආදී ක්ෂේත්‍ර යටතේ සංක්ෂිප්තව පහත දක්වා ඇත.

විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන වෙත සිසුන් ඇතුලත් කිරීම

2011 වර්ෂයේ දී පැවති අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් නව නිර්දේශය සහ පැරණි නිර්දේශය යටතේ පෙනී සිටි බැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විභාග දෙපාර්තමේන්තුවේද උපදෙස් පරිදි විද්වත් කමිටුවක් පත් කරන ලද අතර එකී කමිටුවේ නිර්දේශ සහ උපදෙස් පරිදි ශිෂ්‍ය කණ්ඩායම් දෙක ඒකාබද්ධ කොට එකක් ලෙස සලකා ලකුණු ගණනය කිරීමටත් කුසලතා අනුපිළිවෙලට අනුව සිසුන් පෙළ ගැස්වීමටත් කටයුතු කර විභාග දෙපාර්තමේන්තුව මගින් අදල ප්‍රතිඵල නිකුත් කරන ලදී.

ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව මෙම තීරණය ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් වු අතර ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පැරණි විෂය නිර්දේශය සහ නව විෂය නිර්දේශය සඳහා පෙනී සිටි සිසුන් එකිනෙකට වෙනස් වූ ජනගහන දෙකක් ලෙස සලකා විශ්වවිද්‍යාල පනතේ 15 (vii) වගන්තියට අනුකූල වෙමින් සෑම අයදුම්කරුවෙකු වෙතම නැවත z ලකුණු නිකුත් කරන ලෙසට උපදෙස් දෙන ලදී. කෙසේ වෙතත් විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගැනීමට අවශ්‍ය කුසලතා ලේඛණය සකස් කිරීම සඳහා භාවිතා කළ යුතු ක්‍රමවේදය ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයේ විශේෂයෙන් සඳහන් කොට නොතිබූ බැවින් ඒ සඳහා ක්‍රමවේදයක් යෝජනා කිරීමට අතිගරු ජනාධිපතිතුමා විසින් නම් කරන ලද විද්වත් කමිටුවක් පත් කෙරිණි. එකී කමිටුවේ නිර්දේශ අනුව පැරණි සහ නව නිර්දේශ සඳහා පෙනී සිටි සිසුන් එකිනෙකට වෙනස් ජනගහන දෙකක් සේ සලකා z ලකුණු ගණනය කර පසුව එම ලකුණු ලේඛණ දෙක ඒකාබද්ධ කර අවරෝහණ පටිපාටියට සකස් කර එක් ලේඛණයක් ලෙස සකසා ගැනීමට අවශ්‍ය කටයුතු කෙරිණි.

කෙසේ වෙතත් දෙවන කුසලතා ලේඛණය ද, පෙත්සම් 08 ක් ගොනු කිරීම හේතුවෙන් අභියෝගයට ලක් විය. ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වූයේ අයදුම්කරුවන් එකිනෙකට වෙනස් වු ජනගහන දෙකක් සේ සලකා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරාගැනීම සඳහා කුසලතා ලේඛණ පිළියෙල කිරීම නීතිපතිවරයාගේ ද උපදෙස් පරිදි අදල සියළු පාර්ශවයන් එකතු වී කළ යුතු බව ය.

මෙකී ගැටළුව විසඳීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විකල්ප ක්‍රම හතරක් යෝජනා කරන ලද අතර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එයින් තුන්වන විකල්පය තෝරා ගන්නා ලද අතර එම විකල්පයට අනුව ශිෂ්‍යයින් තෝරා ගැනීම, සෑම දිස්ත්‍රික්කයකින් ම එක් එක් පාඨමාලාව සඳහා පසුගිය වසර පහ තුල දී විශ්වවිද්‍යාලවලට තෝරා ගන්නා ලද පළමු වරට සහ දෙවන හෝ තුන්වනවරට විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවේ උපරිම අනුපාතය පදනම් කරගෙන සකස් වී ඇත. මෙකී විකල්පය අනුව අපේක්ෂිත 21,500 ක් වන ශිෂ්‍ය ප්‍රමාණයට අමතරව සිසුන් 5,609 ක් ඇතුළත් කරගැනීමට විශ්වවිද්‍යාලවල ප්‍රතිපාදන කොමිෂන් සභාව අපේක්ෂා කරන ලදී.

එසේම පසුගිය වසරවල දී සමහර විශ්වවිද්‍යාල පාඨමාලාවලට ප්‍රවේශය සඳහා මූලික අවශ්‍යතාවයන් වූ අදල ප්‍රායෝගික/අභියෝගතා පරීක්ෂණවලින් සමත් වීම මෙම වසරේ ද ඒ ආකාරයෙන් ම පවත්වා ගෙන යා යුතු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විශ්වවිද්‍යාලවල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නියෝග කරන ලදී. කෙසේ වෙතත් අදල පරීක්ෂණ පවත්වා 2012.12.31 දින වනතුරුත් එකී පරීක්ෂණ ප්‍රතිඵල විශ්වවිද්‍යාලවල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී නොතිබුණු බැවින් වර්ෂය අවසාන වන තුරුත් 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් තෝරා ගැනීමේ කටයුතු අවසාන කරගැනීමට නොහැකි විය.

2011 වර්ෂයේ දී පැවති අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල පදනම් කරගෙන 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට සුදුසුකම් ලැබූ මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව 141,411 ක් විය.

උපාධිධාරී නිමැවුම

2012 වර්ෂයේ විශ්වවිද්‍යාලවලින් පිට වූ මුළු උපාධිධාරී සංඛ්‍යාව 8,847 ක් වූ අතර මින් බහුතරය එනම් 37.5% ක් කලා විෂය ධාරාවෙන් විය. 2012 වර්ෂයේ පිට වූ මුළු පශ්චාත් උපාධිධාරී සංඛ්‍යාව 7,887 ක් වේ.

අධ්‍යයන සංවර්ධනය සහ අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාම

පසුගිය වර්ෂයේ දී හඳුන්වා දුන් උපාධි අධ්‍යයන පාඨමාලා පහට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී විශේෂ අවශ්‍යතා අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව විශ්වවිද්‍යාල පද්ධතිය වෙත හඳුන්වා දෙන ලදී. එමෙන් ම උසස් / වැඩිදුර අධ්‍යාපන අවස්ථා වැඩි කිරීම අරමුණ කරගෙන පසුගිය වර්ෂයේ දී හඳුන්වා දුන් අධ්‍යයන පාඨමාලා 23 ට සාපේක්ෂව නව පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා 06 ක් මෙම වසරේ දී නියමිත පරිපාටි අනුගමනය කරමින් හඳුන්වා දෙන ලදී.

ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා වන ස්ථාවර කමිටුව විසින් විශ්වවිද්‍යාල සිසුන් අතර ඉංග්‍රීසි භාෂා නිපුණතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇති අතර විශ්වවිද්‍යාලවල ප්‍රතිපාදන කොමිෂන් සභාව උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ සහයෝගය ඇතිව පරිවර්තනය ත්‍රිත්ව භාෂාවෙන් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපාධි අධ්‍යයන පාඨමාලා කලා පීඨවලට හඳුන්වා දීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කමිටු විසින් වෘත්තිය මාර්ගෝපදේශ උපදේශකයන් වෙත පුහුණුව ලබාදීම, විශ්වවිද්‍යාල සිසුන්ගේ මෘදු කුසලතා සංවර්ධනය කිරීම, ඇතැම් ප්‍රථම උපාධි අධ්‍යයන පාඨමාලාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම යනාදි අංශ සම්බන්ධව වැඩමුළු සංවිධානය කරන ලදී.

ඉහත සඳහන් වැඩමුළුවලට අමතර ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් HETC ලෝක බැංකු ව්‍යාපෘතියෙත්, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයෙත්, ජෝන් කීල්ස් සමාගම ආදී රාජ්‍ය නොවන සංවිධානවලත් සහයෝගය ඇතිව ජාතික වැදගත්කමකින් සපිරි කරුණු ඉලක්ක කරගත් විවිධ වැඩමුළු පැවැත්වීමට කටයුතු කරන ලදී.

සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තෝරාගත් උපාධි පාඨමාලා සඳහා උසස් අධ්‍යාපන ආයතන හතරක් වෙත උපාධි පිරිනැමීමේ තත්ත්වය ලබාදීම සඳහා උසස් අධ්‍යාපන ගරු අමාත්‍යතුමා වෙත නිර්දේශ කරන ලදී.

ශිෂ්‍ය කටයුතු

රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි අත්‍යවශ්‍ය භූමිකාව ක්‍රියාත්මක කිරීම සහ ආයතනයේ සාරධර්ම සහ ප්‍රතිපත්ති සුරක්ෂිත කිරීමට සහ පවත්වාගෙන යාමට දායකවීම පිණිස සිසුන් පෙළඹවීමේ අපේක්ෂාව ඇතිව 2012 වර්ෂයේදී කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තියක් හඳුන්වා දෙන ලදී.

මෙම වසර තුලදී විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මහපොළ ශිෂ්‍යත්වලාභීන් 33,089 ක් ද ශිෂ්‍යාධාරලාභීන් 23,446 ක් ද පරිත්‍යාග ශිෂ්‍යත්ව ලාභීන් 35 ක් ද විය. පසුගිය වසර සමග සැසඳීමේදී ප්‍රතිශතයක් ලෙස ශිෂ්‍යාධාරලාභීන් සංඛ්‍යාවේ 30% ක වර්ධනයක් දක්නට ලැබෙන අතර පෙර වර්ෂයට අනුරූපව මහපොළ ශිෂ්‍යත්වලාභී වර්ධනය 2.5% කි.

කාර්යමණ්ඩල සංවර්ධනය

2012 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරය විසින් නව කාර්යමණ්ඩල තනතුරු 751 ක් අනුමත කරනු ලැබූ අතර, ඒ අනුව විශ්වවිද්‍යාල පද්ධතියේ අනුමත මුළු කාර්යමණ්ඩල තනතුරු සංඛ්‍යාව 21,043 දක්වා ඉහළ යන ලදී. අනුමත නව කාර්යමණ්ඩල තනතුරු 751 න් 294 ක් අධ්‍යයන කාර්යමණ්ඩල තනතුරු සඳහා වේ.

සමාලෝචිත වර්ෂයේ දී, විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දළ වශයෙන් රුපියල් මිලියන 65 ක් වෙන් කරන ලද අතර කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයන් හි මෙහෙයුම් ක්‍රියාකාරකම් පහසු කිරීම සහ නව කාර්යමණ්ඩල වැඩසටහන් සැලසුම් කිරීම සඳහා මෙම අරමුදල් මුදාහරින ලදී. එසේ ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති අනුව යමින් ඉගැන්වීම සහ අධ්‍යයන කටයුතු පරිපාලනය යන අංශයන්හි විශිෂ්ඨත්වයක් ඇති කිරීමේ පුළුල් අරමුණ පෙරදැරි කොටගෙන, විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන කාර්යමණ්ඩල සඳහා පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගැනීමට විදේශගත වීම සඳහා රුපියල් මිලියන 7.046 ක් ලබාදෙන ලදී. මීට අමතරව, දේශීය පර්යේෂණ ප්‍රදාන ක්‍රමය යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන සුදුසුකම් ලබාගැනීම සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලය වෙත රුපියල් මිලියන 5.62 ක් ලබාදෙන ලදී.

වැටුප් විෂමතා පිළිබඳ කාර්මික ආරවුල

සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය (FUTA) සහ අනධ්‍යයන කාර්යමණ්ඩල වෘත්තීය සමිති මගින් විවිධ වෘත්තීය ක්‍රියාමාර්ග ගනු ලැබිණි.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය තමන් කරනු ලැබූ ඉල්ලීම්වලට යහපත් ප්‍රතිචාරයන් නොදැක්වීම සහ රජය මගින් දෙන ලද පොරොන්දු ඉටු නොකිරීම මුල්කර ගෙන මාස හතරක් පුරා තම වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය කර ගෙන යන ලදී.

අනධ්‍යයන කාර්යමණ්ඩල වෘත්තීය සමිති මගින් දියත් කරන ලද වෘත්තීය සමිති ක්‍රියාමාර්ග මාස 1 1/2 ක් පුරාවට පැවති අතර එම ක්‍රියාමාර්ග ගැනීමට සාධක වූ අරමුණු ලෙස වැටුප් විෂමතා සහ දීමනා මුල්කර ගෙන තිබිණි.

යටිතල පහසුකම් සංවර්ධනය

මහා භාණ්ඩාගාරය විසින් පනවන ලද විවිධ කපාහැරීම් වලින් අනතුරුව 2011 වර්ෂයේ දී මුදාහරින ලද රුපියල් මිලියන 4,290 ට සාපේක්ෂව 2012 වර්ෂය අවසාන වන විට නව ඉදිකිරීම් සහ අඛණ්ඩ ව්‍යාපෘති, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත්පත් කරගැනීම්, අලුතෙන් ස්ථාපිත කරන ලද විශ්වවිද්‍යාලයන්හි යටිතල පහසුකම් ව්‍යාපෘති සහ 2012 වර්ෂය සඳහා ශිෂ්‍යයන්ගේ නිපුණතා ගොඩනැගීම වැනි ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 5,504 ක් පමණ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන් වෙත ලැබී ඇත. මෙම වර්ෂය තුල දී දැඩි පරීක්ෂාවකින් සහ ඇගයීමකින් පසුව කොමිෂන් සභාව විසින් නව ඉදිකිරීම් ව්‍යාපෘති 22 ක් අනුමත කරන ලදී. 2012 වර්ෂයේ දී විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ව්‍යාපෘති 11 ක් භෞතිකව ආරම්භ කර තිබූ අතර රුපියල් මිලියන 13,672 ක් වටිනා ඉදිකිරීම් ව්‍යාපෘති 44 ක්, සැලසුම් සහ ඉදිකිරීම් ක්‍රියාවලියේ විවිධ මට්ටම්වල පැවතුනි. එසේ ම රුපියල් මිලියන 2,778 ක් වටිනා ව්‍යාපෘති 13 ක් (පසුගිය වර්ෂයේ ව්‍යාපෘති 12 ට සාපේක්ෂව) අවසන් කර විශ්වවිද්‍යාල පද්ධතියට බාරදෙනු ලැබීය.

තොරතුරු තාක්ෂණ සංවර්ධනය

2012 වර්ෂයේ දී විශ්වවිද්‍යාල පද්ධතියේ පුස්තකාලවල තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 08 ක ආයෝජනයක් සිදුකෙරිණි. එසේම විශ්වවිද්‍යාල පද්ධතියේ තොරතුරු තාක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීමට සහ ශක්තිමත් කිරීමට පෙර වර්ෂයේ දී වෙන් කරන ලද රුපියල් මිලියන 15 ආයෝජනයට සාපේක්ෂව, රුපියල් මිලියන 50 ක් (දළ වශයෙන්) මෙම වර්ෂයේ දී වෙන් කෙරිණි.

ඉහත කරුණු වලට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල අතර සන්නිවේදනයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා කොමිෂන් සභා රැස්වීම් ශාලාවේ තොරතුරු තාක්ෂණ/දෘෂ්‍ය සම්මන්ත්‍රණ පහසුකම් ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව ඉහළ නැංවීමට කටයුතු කරන ලදී.

තත්ත්ව සහතික සහ ප්‍රතීතන

සමාලෝචිත වර්ෂයේ දී, තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලයේ බාහිර තත්ත්ව ඇගයීම් වැඩසටහන් යටතේ ආයතනික සමාලෝචන 10 ක් විෂය/වැඩසටහන් සමාලෝචන 07 ක් සහ පුස්තකාල සමාලෝචන 01 ක් මෙන්ම උපාධි පාඨමාලා 99 ක් ඇගයීමකට ලක් කරන ලද අතර ඉහත අනුපිළිවෙලට අනුව පෙර වසරේ දී පවත්වන ලද සමාලෝචන/ ඇගයීම් සංඛ්‍යාව 6, 13, 1 සහ 47 කි. 2012 වර්ෂයේ දී, උසස් අධ්‍යාපන ආයතනයන්හි තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ජාතික සහ විශ්වවිද්‍යාල/පීඨ මට්ටමෙන් වැඩමුළු 274 ක් පැවැත්විණි.

විශ්වවිද්‍යාලයන්හි අභ්‍යන්තර තත්ත්ව සහතික ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් අත්පොතක් පිළියෙල කර ඇත. අභ්‍යන්තර තත්ත්ව සහතික ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතීතන ක්‍රියාවලිය ආරම්භ කිරීම උදෙසා සහ රටේ සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම (රාජ්‍ය සහ පුද්ගලික) සහ වැඩසටහන් ප්‍රතීතනය කිරීමට සහාය කරගැනීම සඳහා ප්‍රතීතන අත්පොතක් පිළියෙළ කිරීම සඳහා වැඩමුළු 3 ක් පැවැත්විණි. 2012 වර්ෂයේ දී බාහිර තත්ත්ව ඇගයීම සඳහා අන්තර්ජාලය හරහා උපදේශන සහ ඇගයීම් පද්ධතියක් සංවර්ධනය කිරීම මෙම ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස සලකුණු වේ.

මූල්‍ය පරිපාලනය සහ කළමනාකරණය

2012 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඇස්තමේතු ගත කළ පරිදි රුපියල් මිලියන 28,363 ක් ඉල්ලා සිටින ලද අතර පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරය විසින් ප්‍රථමයෙන් රුපියල් මිලියන 20,283 ක් අනුමත කරන ලදී.

වැඩිවන ලද ආරක්ෂක සේවා පිරිවැය මූලයකරණය කිරීම සඳහා රුපියල් මිලියන 215 ක් අතිරේක ප්‍රතිපාදන ලෙස වෙන් කිරීමට පසුව අනුමැතිය ලබාදෙන ලදි. පෙර වර්ෂය සමග සැසඳීමේදී 2012 වර්ෂයේ දී විශ්වවිද්‍යාල පද්ධතියේ පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රතිපාදන වෙන් කිරීම 12% න් වැඩි වු අතර යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අදාලව මහා භාණ්ඩාගාරය විසින් පනවන ලද විවිධ සීමාවන් හේතුවෙන් ප්‍රාග්ධන වියදම් 19% කින් පහත වැටුණි.

මහා භාණ්ඩාගාරය විසින් හඳුන්වාදෙන ලද යහපාලනය සහ කළමනාකරණ ප්‍රතිපත්ති හරහා මූලය කළමනාකරණය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල වැඩිදියුණු කිරීමට අවශ්‍ය සහාය දැක්වීම සඳහා ඊට අදාල කරුණු පරීක්ෂා කිරීමට 2012 වර්ෂය තුළ දී අවස්ථා 29 ක දී විගණන කාර්ය සහ උපදේශක කමිටුව මුණ ගැසී ඇත.

ඉදිරි වසරවල දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි මනා ක්‍රියාකාරීත්වය තහවුරු කරනු වස් උසස් අධ්‍යාපනය පිළිබඳ ඉහළම උපදේශක සහ නියාමන ආයතනය ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමාලෝචිත වර්ෂයේ දී චක්‍රලේඛ 25 ක් සහ ආයතන චක්‍රලේඛ 16 ක් නිකුත් කර ඇත.

1 **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කළමනාකරණය**

කොමිෂන් සභාවේ සභාපති, උප සභාපති සහ සාමාජිකයන් පහත පරිදි වේ;

සභාපති

මහාචාර්ය එස්.වී.ඩී.ජී.සමරනායක

බී.ඒ.(පේරාදෙණිය) ශ්‍රී ලංකා, එම්. ඒ.(පේරාදෙණිය) ශ්‍රී ලංකා, පී.එච්.ඩී. (ශා. ඇන්ඩෲස්-ස්කොට්ලන්තය)

දේශපාලන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය

උප සභාපති

මහාචාර්ය රංජිත් සේනාරත්න

බී. එස්. සී. එම්ෆිල්, පී.එච්.ඩී. (වියනා), පී.එච්.ඩී එච්. සී. (ඩර්හැම්)

භෝග විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය

සාමාජිකයන්

මහාචාර්ය එච්. අබේගුණවර්ධන

බී.එස්.සී. (පේරාදෙණිය) ශ්‍රී ලංකා, එම්.එස්.සී. සහ පී. එච්. ඩී. (ඉලිනොයිස් ඇ.එ.ජ.)

ගොවිපළ සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය එස් මෝහනදාස්

බී.එස්.සී. (ගෞරව) කොළඹ , පී.එච්.ඩී.(ඇඩිලේඩ්) එෆ් අයි රසායන, සී. රසායන

විශ්‍රාමලත් උපකුලපති, යාපනය විශ්වවිද්‍යාලය

මහාචාර්ය මල්කාන්ති චන්ද්‍රසේකර

බී.ඩී.එස්. (ලංකා), පී එච්. ඩී. (නිව්කාසල් එ.රා.)

වසූහ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය

විජය මලලසේකර මයා

එම්.ඒ. (කැන්ටබරි), අධිනීතිඥ (ඉනර් ටෙම්පල්), නීතිඥ

මහාචාර්ය සම්පත් අමරතුංග

බී. ඒ. ආර්ථික විද්‍යාව (විශේෂ) (ශ්‍රී ජපුර), එම් ඒ ආර්ථික විද්‍යාව (කොළඹ), එම්. එස්. සී.

ග්‍රාමීය සංවර්ධන ආර්ථිකවිද්‍යාව (සාගා), පී. එච්. ඩී. (කගොෂිමා)

මහා භාණ්ඩාගාර නියෝජිත

පී. ඒ. අබේසේකර මහතා

ශ්‍රී ලංකා පරිපාලන සේවය - 1 පංතිය,

බී.ඒ. (ලංකා) (පේරාදෙණිය), රාජ්‍ය පරිපාලනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (SLIDA) ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

NIRD, (ඉන්දියාව),

මහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මුල්‍ය හා සැලසුම් අමාත්‍යාංශය

ලේකම්

කේ. පී. ටී. එල්. නන්දසේන මහතා

බී.කොම් (විශේෂ), එම්.බී.ඒ. (ශ්‍රී ජයවර්ධනපුර)

2 **විශ්වවිද්‍යාල කළමණාකරණය**

2.1 **කොළඹ විශ්වවිද්‍යාලය**

කුලපති

අති උතුම් ඔස්වල්ඩ් ගෝමස් අගරදගුරු හිමිපාණන්

උප කුලපති

මහාචාර්ය ක්ෂනිකා හිරිඹුරේගම

ලේඛකාධිකාරී

ටී. එල්. ආර්. සිල්වා මයා (වැඩ බලන)

2.2 පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කුලපති
ආචාර්ය ප්‍රේමදාස උඩගම (2012.02.22 දක්වා)
මහාචාර්ය පී. ඩබ්ලිව්. ඇපාසිංහ (2012.02.23 සිට)

උපකුලපති
මහාචාර්ය එස්.බී.එස්. අබයකෝන් (2012.07.31 දක්වා)
මහාචාර්ය ඒ. සේනාරත්න (2012.08.01 සිට)

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය වී. එස්. වීරසිංහ (2012.11.30 දක්වා)
මහාචාර්ය එච්. එම්. එස්. කේ. හෙන්නායක (2012.12.01 දක්වා)

ලේඛකාධිකාරී
යූ. ඩී. දොඩන්වල මයා (2012.06.14 දක්වා) (වැඩ බලන)
ආචාර්ය එම්. එන්. ජයවර්ධන (2012.06.15 දක්වා)

2.3 කැළණිය විශ්වවිද්‍යාලය

කුලපති
අති පූජ්‍ය ගෞරවාචාර්ය වැලමිටියාවේ ධර්මකීර්ති ශ්‍රී කුසලධම්ම හිමි

උප කුලපති
මහාචාර්ය සරත් අමුණුගම

ලේඛකාධිකාරී
ඩබ්. එම්. කරුණාරත්න

2.4 **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

කුලපති
ගෞරවාචාර්ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමි

උප කුලපති
ආචාර්ය එන්. එල්. ඒ. කරුණාරත්න

ලේඛකාධිකාරී
ජයලත් මුත්තෙට්ටුවේගෙදර මයා (2012.02.14 දක්වා)
කේ. පී. බ්‍රිටෝ මයා (2012.02.15 සිට)

2.5 මොරටුව විශ්වවිද්‍යාලය

කුලපති
දේශමාන්‍ය ආචාර්ය එස්. රෝලන්ඩ් සිල්වා

උප කුලපති
මහාචාර්ය ඒ. කේ. ඩබ්. ජයවර්ධන

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය එන්.ඩී. ගුණවර්ධන (2012.01.04 දක්වා)
මහාචාර්ය ආර්. ඒ. අත්තලගේ (2012.01.05 සිට)

ලේඛකාධිකාරී
ඒ. එල්. ජවුෆර් සාදික් මයා

2.6 **යාපනය විශ්වවිද්‍යාලය**

කුලපති
මහාචාර්ය එම්. සිවසූරිය

උප කුලපති
මහාචාර්ය වසන්ති අරසරත්නම් මිය

ලේඛකාධිකාරී
වී. කන්දීපන් මයා

2.7 **රුහුණු විශ්වවිද්‍යාලය**

කුලපති
අති පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලත්තර සුමනජෝති නායක හිමි

උප කුලපති
මහාචාර්ය ජ්. එල්. එස්. මෙන්ඩිස්

නියෝජ්‍ය උපකුලපති
මහාචාර්ය එස්. පී. ජේ.එන්. සේනානායක

ලේඛකාධිකාරී
පී. එස්. කළුගම මිය

2.8 **ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

කුලපති
සෑම් එස්. විජේසිංහ මයා

උප කුලපති
මහාචාර්ය උපාලි විදානපතිරණ (2012-06-16 දක්වා)
ආචාර්ය විජිත නානායක්කාර (2012-06-17 සිට)

නියෝජ්‍ය උපකුලපති
ආචාර්ය ජේ. ලියනගම

ලේඛකාධිකාරී
ඩබ්. එල්. චින්ද්‍රා ජයසේන මෙය

2.9 **ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය**

කුලපති
මහාචාර්ය යෝගා රාසනායගම්

උප කුලපති
ආචාර්ය කේ. ප්‍රේමකුමාර් (2012-02-12 දක්වා) (වැඩ බලන)
ආචාර්ය කේ. කෝවින්දරාජා (2012-02-13 සිට)

ලේඛකාධිකාරී
කේ. මහේෂන් මයා

2.10 **ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය**

කුලපති
මහාචාර්ය ආච් එම්. ඉෂාක්

උප කුලපති
ආචාර්ය එස්. එම්. එම්. ස්මයිල්

ලේඛකාධිකාරී
එච්. ඒ. සත්තාර් මයා

2.11 ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය ඒ. වී. සුරවීර

උප කුලපති
මහාචාර්ය කේ. ඒ. නන්දසේන (2012-10-12 දක්වා)
මහාචාර්ය කේ. ඒ. නන්දසේන (2012-10-12 සිට 2012-12-14 දක්වා) (වැඩ බලන)
මහාචාර්ය කේ. එච්. රංජිත් විජයවර්ධන (2012-12-15)

ලේඛකාධිකාරී
ඒ. පී. කරුණාරත්න මයා

2.12 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කුලපති
ගෞරවාචාර්ය මහාචාර්ය කඹුරුගමුවේ වජිර හිමි

උප කුලපති
මහාචාර්ය එම්. එස්. රූපසිංහ

ලේඛකාධිකාරී

කේ. එම්. නවරත්න බංඩා (2012-02-29 දක්වා) (වැඩ බලන)
එම්. එම්. විමලසිරි මයා (2012-03-01 සිට)

2.13 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

කුලපති
මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක

උප කුලපති
මහාචාර්ය ඒ. එන්. එෆ්. පෙරේරා

ලේඛකාධිකාරී
ර්. එම්. පී. ඒකනායක මයා

2.14 ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

කුලපති
ගරු ආචාර්ය අළුත්වැව සෝරත හිමි

උප කුලපති
මහාචාර්ය ඩබ්. පී. ආර්. පී ද සිල්වා

ලේඛකාධිකාරී
ආර්. වී. එස්. පී. රාජපක්ෂ මයා (2012-02-14 දක්වා) (වැඩ බලන)
නිල්මිණී දියබෙදනගේ මෙය (2012-02-15 සිට)

2.15 සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

කුලපති
පණ්ඩිත් ආචාර්ය ඩබ්. ඩී. අමරදේව

උප කුලපති
මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ

ලේඛකාධිකාරී
සේදර හෙට්ටිගේ මයා (වැඩ බලන)

3 ආයතන

3. 1 කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය කොලින් එන් පීරිස්

3.2 පාලි හා බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය සුමනපාල ගල්මන්ගොඩ

3.3 දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය ආර්. ඒ. ජයසිංහ (2012-04-15 දක්වා) (වැඩ බලන)
සුනිමල් සේනාරත්න මයා (2012-05-16 සිට)

3.4 මානව සම්පත් අභිවර්ධන ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය ඩබ්. කේ. හිරිඹුරේගම (2012-05-13 දක්වා)
ආචාර්ය රොහාන් ඩී. පෙරේරා (2012-05-14 සිට)

3.5 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය ජයන්ත ජයවර්ධන

3.6 පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය ජගත් වීරසිංහ

3.7 කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය උදිත පී. ලියනගේ

3.8 කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයනායතනය

අධ්‍යක්ෂ
ආචාර්ය පී. එන්. වික්‍රමනායක

3.9 ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය ජේ. ඒ. ලියනගේ මිය

3.10 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය බී. එස්. බී. කරුණාරත්න

3.11 ජාතික පුස්තකාල හා විඥාපන අධ්‍යයන ආයතනය

අධ්‍යක්ෂ
එම් එස්. යූ. අමරසිරි මයා

3.12 තාක්ෂණ විද්‍යා ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

අධ්‍යක්ෂ
ආචාර්ය ටී. ඒ. පී. ගුණසේකර

3.13 ජෛව රසායන, අනුක ජෛව විද්‍යා හා ජෛව තාක්ෂණ ආයතනය

අධ්‍යක්ෂ
මහාචාර්ය කේ. එච්. තෙන්නකෝන්

3.14 ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයනායතනය

අධ්‍යක්ෂ
බී. රාජේශ්වරන් මිය (2012-04-16 දක්වා) (වැඩ බලන)
ආචාර්ය කේ. ප්‍රේමකුමාර් (2012-04-17 සිට)

3.15 ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය එච්.වී.එම්. රත්වත්තේ මිය (වැඩ බලන) (2012-02-29 දක්වා)
ආචාර්ය එච්.වී.එම්. රත්වත්තේ මිය (2012-03-01 සිට)

3.16 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

අධ්‍යක්ෂ
ආචාර්ය ආර්. එම්. කේ. රත්නායක (වැඩ බලන)

3.17 කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය

අධ්‍යක්ෂ
ආචාර්ය නිශාන්ත පෙරේරා (2012 දෙසැම්බර් දක්වා) (වැඩ බලන)

4. විශ්වවිද්‍යාල ප්‍රවේශය

2011 වර්ෂයේ පැවති අ. පො. ස (උ/පෙළ) විභාගය සඳහා අයදුම්කරුවන් කණ්ඩායම් දෙකක් නව විෂය නිර්දේශය සහ පැරණි විෂය නිර්දේශය යටතේ පෙනී සිටින ලදී. එසේ හෙයින්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තේරීමේ දී පැරණි සහ නව විෂය නිර්දේශ යටතේ ලැබෙන විභාග ප්‍රතිඵල ඒකාබද්ධ කිරීමේ හැකියාව සලකා බැලීම සඳහා උපදෙස් ලබාගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විභාග දෙපාර්තමේන්තුව සමග එක්ව විද්වත් කමිටුවක් පත් කෙරිණි.

එකී කමිටුවේ නිර්දේශ අනුව Z ලකුණු ගණනය කර ශිෂ්‍ය කණ්ඩායම් දෙක ඒකාබද්ධ කර එක් කුසලතා ලේඛණයක් පිළියෙල කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලැබී තිබිණි.

ප්‍රතිඵල නිකුත්වීමත් සමගම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙම තීරණය, ලංකා ගුරු සංගමය සහ 2011 වර්ෂයේ අ. පො. ස (උ/පෙළ) විභාගයට පෙනී සිටින ලද අයදුම්කරුවන් 16 දෙනෙකු විසින් ගොනු කරන ලද අංක 29/2012 දරන ශ්‍රේෂ්ඨාධිකරණ (මා.හි.) නඩුව මගින් අභියෝගයට ලක්විය. ඉහත නඩුවේ තීන්දුව 2012.06.25 දින ප්‍රකාශයට පත් කළ අතර එමගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 15 (vii) වගන්තිය සමග අනුගත විය යුතු බවත්, 2011 වර්ෂයේ අ. පො. ස (උ/පෙළ) විභාගයට පැරණි සහ නව නිර්දේශ යටතේ පෙනී සිටි සිසුන් එකිනෙකට වෙනස් ජනගහනයන් දෙකක් සේ සළකා Z ලකුණු ගණනය කිරීම සඳහා පිළිගත් සංඛ්‍යාන න්‍යායන් සහ මූලධර්ම පදනම් කොටගෙන අවශ්‍ය පියවර ගැනීමටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත නියෝග කරන ලදී.

තවද ඉහත සඳහන් කරන ලද දුර්වලතා හා විෂමතා නිවැරදි කොට ප්‍රමාදයකින් තොරව 2011 අ. පො. ස (උ/පෙළ) විභාගය සඳහා පෙනී සිටින ලද අයදුම්කරුවන් වෙත Z ලකුණු නැවත නිකුත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත උපදෙස් ලැබිණි.

2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් තෝරා ගැනීම සඳහා වන කුසලතා අනුපිළිවෙලට අනුකූලව ලේඛණය සකස් කිරීමේදී භාවිතා කළ යුතු ක්‍රමය තීන්දුවේ විශේෂයෙන් සඳහන් කර නොතිබූ බැවින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තෝරාගැනීමේදී පැරණි සහ නව නිර්දේශ යටතේ වන ශිෂ්‍ය කණ්ඩායම් දෙක පෙළ ගැස්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් යෝජනා කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් විද්වත් කමිටුවක් පත් කරන ලදී.

එකී කමිටුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝග ප්‍රකාර විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුලත් කිරීම සඳහා 2011 වර්ෂයේ අ. පො. ස (උ/පෙළ) විභාගයේදී පැරණි සහ නව නිර්දේශ යටතේ පෙනී සිටින ලද අයදුම්කරුවන් කණ්ඩායම් දෙක එකිනෙකට වෙනස් වූ ජනගහනයන් දෙකක් ලෙස සලකා Z ලකුණු ගණනය කළ පසු එය ඒකාබද්ධ කොට අවරෝහණ පිළිවෙලට එක් ලේඛණයක් සැකසිය යුතුයැයි නිර්දේශ කරන ලදී. ඒ අනුව Z ලකුණු ගණනය කර දිස්ත්‍රික් සහ සමස්ථ දිවයින් කුසලතා මට්ටම් නැවත නිකුත් කරන ලෙසට විභාග කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දෙනු ලැබිය.

දෙවන කුසලතා ලේඛණය සැකසීමේ ක්‍රමවේදය ද, ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරන ලද නඩු අටක් (08 ක්) (නඩු අංක 560/2012, 459/2012, 462/2012, 445/2012, 441/2012, 418/2012, 466/2012 480/2012) මගින් අභියෝගයට ලක්විය. මෙකී පෙත්සම ඉදිරිපත් කරන ලද පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන්ගේ පොදු තර්කය වුයේ අයදුම්කරුවන්ගේ දක්ෂතාවය නිර්ණය කිරීම සඳහා පැරණි සහ නව නිර්දේශ යටතේ පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල තනි ඇගයීමක් ලෙස සැලකිය නොහැකි බවයි; මක් නිසාද යත්, මෙම විභාග දෙකේ දුෂ්කර මට්ටම් සාපේක්ෂ වශයෙන් එකිනෙකට වෙනස් බැවිනි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වුයේ ද අයදුම්කරුවන් එකිනෙකට වෙනස් වූ ජනගහන දෙකක් ලෙස සලකා විශ්වවිද්‍යාල සඳහා සිසුන් තේරීම සඳහා වන කුසලතා ලේඛණය සැකසීම බැවින්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මේ සඳහා අදාල පාර්ශව ගරු නීතිපතිවරයාගේද උපදෙස් සහිතව වඩා සුදුසු විසඳුමකට එළැඹීමට අවසර ලබා දුන්නේ ය.

මෙම ගැටළුව විසඳීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විකල්ප හතරක් පිළියෙල කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් යෝජිත ක්‍රම හතරෙන්, සෑම දිස්ත්‍රික්කයකින්ම එක් එක් පාඨමාලාව සඳහා පසුගිය වසර 05 තුළදී, විශ්වවිද්‍යාලවලට තෝරා ගන්නා ලද, පළමුවරට සහ දෙවැනි හෝ තුන්වෙනිවරට විභාගයට පෙනී සිටින ලද අයදුම්කරුවන්ගේ උපරිම අනුපාතය පදනම් කර ගනිමින් සාදන ලද සිසුන් ඇතුලත් කිරීමේ අනුපාතය යටතේ ඉදිරිපත් කරන ලද තුන්වැනි ක්‍රමය යොදා ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය සහ අදාළ අනෙකුත් පාර්ශවද එකඟ විය. ඒ අනුව එකී ක්‍රමය භාවිතා කරමින්, මෙම වසර සඳහා වන යෝජිත ශිෂ්‍ය ප්‍රවේශය වන සිසුන් 21,500 ට අතිරේකව සිසුන් 5609 ක් තෝරා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව බලාපොරොත්තු විය.

තවද, 2012.07.22 දින නිකුත් කරන ලද ශ්‍රේණිගත කිරීම් අවලංගු කර සිසුන් විශ්වවිද්‍යාල සඳහා තෝරාගැනීමේ දී එක් එක් පාඨමාලාව සඳහා සෑම දිස්ත්‍රික්කයටම පැරණි සහ නව නිර්දේශ යටතේ කඩඉම් ලකුණු දෙකක් නිකුත් විය යුතු බවටද ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කරන ලදී.

එසේම ප්‍රවේශය සඳහා තෝරාගත් සිසුන් විශ්වවිද්‍යාල වලට අනුයුක්ත කිරීමේ දී යම් පාඨමාලාවක් සඳහා තෝරාගනු ලබන සිසුන්ගේ දිවයින් කුසලතා මත තෝරා ගැනෙන පළමු 10 % 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා අදාල ප්‍රවේශ අත්පොතේ II වන කොටසට අනුව තෝරා ගැනීමටත්; කුසලතා පංගුවේ ඉතිරි 30 % ඉහත සඳහන් ප්‍රවේශ සඳහා සිසුන් තෝරා ගැනීමට පදනම් වූ 3 වන ක්‍රමය යටතේ පළමුවරට සහ දෙවන හෝ තුන්වන වරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් අතර අනුපාතය පදනම් කොට ගෙන සිදුකිරීමට තීරණය විය. ඊට අමතරව, දිස්ත්‍රික් පංගුව යටතේ තෝරාගන්නා ලද ස්ථාන වලින් 60 % ක් පිරවීම සඳහා කුසලතා පංගුව යටතේ තෝරාගන්නා ලද ඉහළම 40 % (10% + 30%) වෙන් කිරීමෙන් අනතුරුව ඉතුරු වූ ස්ථාන පළමුවරට හෝ දෙවන සහ තුන්වනවරට පෙනී සිටින ලද සිසුන්ගේ අනුපාතය පදනම් කොට ගෙන කිරීමට තීරණය විය.

එසේම, පෙර වර්ෂවල දී ප්‍රායෝගික පරීක්ෂණ/අභියෝගතා පරීක්ෂණ සමත්වීම විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා පූර්ව අවශ්‍යතාවයක් ලෙස සැලකූ අධ්‍යයන පාඨමාලා සඳහා එකී පරීක්ෂණයන් මෙම වර්ෂයේ දී

ද පැවැත්විය යුතු බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කරන ලදී.

ඒ අනුව, එවැනි පාඨමාලා සම්බන්ධව අවශ්‍ය ප්‍රායෝගික/අභියෝගතා පරීක්ෂණ පැවැත්වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සියළුම විශ්වවිද්‍යාල දැනුවත් කරන ලදී. එකී පරීක්ෂණ ප්‍රතිඵල 2012.12.31 දින වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබී නොතිබුණු බැවින් වර්ෂය අවසාන වන විටත් 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් තෝරා ගැනිම අවසන් කිරීමට නොහැකි විය.

2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය වෙනුවෙන් අයදුම් කිරිමට 141,411 ක අයදුම්කරුවන් පිරිසකට සුදුසුකම් ලැබී තිබිණ.

5. අධ්‍යයන සංවර්ධනය සහ අධ්‍යයන ප්‍රමිතිය පවත්වාගෙන යාම

5.1 ස්ථාවර කමිටු

සංශෝධනය කළ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 4 (2) ජේදයේ විධි විධාන අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විවිධ ක්ෂේත්‍ර සඳහා ස්ථාවර කමිටු පත් කර ඇත. අදාල ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට වාර්තා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම එක් එක් ස්ථාවර කමිටුවේ වගකීම වේ. ඒ අනුව 2012 වසරේ දී විවිධ විෂයන් සම්බන්ධ ස්ථාවර කමිටු 15 ක් සහ වෙනත් කමිටු එකක් (1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ක්‍රියාත්මක වු අතර එම වර්ෂයේ දී එක් එක් ස්ථාවර කමිටු විසින් පවත්වන ලද රැස්වීම් වාර ගණන පහත දැක්වේ;

	ස්ථාවර කමිටුවේ නම	රැස්වීම් පවත්වන ලද වාර ගණන
1.	කෘෂි කර්ම පශු වෛද්‍ය සහ සත්ව විද්‍යාව	05
2.	පුස්තකාල සහ විඥාපන විද්‍යා	04
3.	ඉංග්‍රීසි ඉගැන්වීම	06
4.	විශ්වවිද්‍යාල වල වෘත්තිය මාර්ගෝපදේශනය	06
5.	විද්‍යා	06
6.	පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ	04
7.	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	02
8.	කළමණාකරන අධ්‍යයනය	06
9.	ඉංජිනේරු හා වාස්තු විද්‍යාව	06
10.	වෛද්‍ය විද්‍යා හා දන්ත ශල්‍ය විද්‍යා	05
11.	තොරතුරු තාක්ෂණ සංවර්ධන	06
12.	තත්ව සහතික හා ප්‍රතිතන	05
13.	දේශීය වෛද්‍ය විද්‍යා	06
14.	බාහිර උපාධි	02
15.	විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල සංවර්ධනය	03

වෙනත් කමිටු

සුදුසුකම්/ උපාධි ප්‍රදාන ආයතන පිළිගැනිම සඳහා වන ඉල්ලීම් අධ්‍යයනය කිරීම සඳහා වන කමිටුව	04

5.2 ප්‍රථම උපාධි අධ්‍යයන පාඨමාලාවන් ආරම්භ කිරීම/ප්‍රතිව්‍යුහගත කිරීම

විවිධ පීඨ / විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන මගින් කරන ලද යෝජනා සැලකිල්ලට ගෙන කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී පහත සඳහන් උපාධි අධ්‍යයන පාඨමාලාව අනුමත කරන ලදී.

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනවේදී විශේෂ උපාධිය

5.3 පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පශ්චාත් උපාධි පාඨමාලා අනුමත කිරීම සඳහා අදාල නියමිත පරිපාටි අනුගමනය කරමින් 2012 වර්ෂයේ දී පහත සඳහන් පශ්චාත් උපාධි පාඨමාලා 06 අනුමත කරන ලදී.

1. රුහුණු විශ්වවිද්‍යාලයේ භෝග නිෂ්පාදන තාක්ෂණ විද්‍යාපති උපාධි/පශ්චාත් ඩිප්ලෝමා අධ්‍යයන පාඨමාලාව
2. මොරටුව විශ්වවිද්‍යාලයේ, බහුඅවයවික තාක්ෂණ විද්‍යාපති උපාධි/ පශ්චාත් ඩිප්ලෝමා අධ්‍යයන පාඨමාලාව
3. මොරටුව විශ්වවිද්‍යාලයේ, අභ්‍යන්තර ගෘහ අලංකරණ විද්‍යාපති උපාධි/ පශ්චාත් ඩිප්ලෝමා අධ්‍යයන පාඨමාලාව
4. කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රතිජනක වෛද්‍ය විද්‍යාපති උපාධි/ පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාව
5. කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල ශාස්ත්‍රපති උපාධිය
6. කැළණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර ගණකාධිකරණ විද්‍යාපති උපාධිය සහ ව්‍යාපාර මූල්‍ය විද්‍යාපති උපාධිය

ඉහත පාඨමාලාවන්ට අමතරව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාවල (MBA/MPA/ විද්‍යාපති) සිදුකරන ලද වෙනස්කම් සඳහා ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

5.4 ස්ථාපිත නව පීඨ

ජාතික අවශ්‍යතා අනුව අදාල අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි අධ්‍යයන කටයුතු ව්‍යාප්ත කිරීමේ අදහසින්, රටේ උතුරු සහ නැගෙනහිර පළාත්වල ඉංජිනේරු පීඨ ස්ථාපිත කිරීමේ දැඩි අවශ්‍යතාවය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හඳුනාගත් හෙයින් පහත සඳහන් නව පීඨ ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

- යාපනය විශ්වවිද්‍යාලය

  පහත සඳහන් අධ්‍යයනාංශ 04 ද සමග ඉංජිනේරු පීඨය කිලිනොච්චියේ ස්ථාපිත විය.

  1. සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය
  2. විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය
  3. පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශය
  4. අන්තර් විෂය අධ්‍යයන අධ්‍යයනාංශය

- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

  පහත සඳහන් අධ්‍යනාංශ 05 ද සමග ඉංජිනේරු පීඨය ස්ථාපිත විය.

  1. සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය
  2. පරිගණක විද්‍යා සහ ඉංජිනේරු අධ්‍යයනාංශය
  3. කාර්මික ඉංජිනේරු අධ්‍යයනාංශය
  4. විද්‍යුත් සහ විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය
  5. අන්තර් විෂය අධ්‍යනාංශය

5.5 ස්ථාපිත නව අධ්‍යයනාංශ

අදාල ස්ථාවර කමිටුවේ නිර්දේශ සලකා බලා එකී අධ්‍යයන ක්ෂේත්‍රයේ අධ්‍යයන ක්‍රියාකාරකම් ව්‍යාප්ත කිරීමේ අරමුණ ද සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පහත සඳහන් නව අධ්‍යයනාංශය ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

- යාපනය විශ්වවිද්‍යාලය

  කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍යය පීඨයේ වාණිජ්‍යය අධ්‍යයනාංශය

5.6 (1) විදේශ විශ්වවිද්‍යාල පිළිගැනීම

ශ්‍රී ලාංකීය සිසුන් තමන් අධ්‍යාපනය ලැබූ විදේශ විශ්වවිද්‍යාල, පිළිගත් විශ්වවිද්‍යාල ලෙස සහතික කර දෙන ලෙසට මසකට ඉල්ලීම් 150 කට වැඩි ප්‍රමාණයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලැබෙන අතර ඒ සියල්ල සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කටයුතු අංශය විසින් ඉතාමත් කාර්යක්ෂමව ඉටුකරන ලදී.

(2) රාජ්‍ය නොවන උපාධි පිරිනමන ආයතන සමාලෝචනය

උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උපාධි පිරිනමන ආයතනයක් ලෙස ඕනෑම ආයතනයක් පිළිගැනීම සඳහා අමාත්‍යතුමා හට 1978 අංක දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය මගින් විධිවිධාන සලසා ඇත.
2012 වර්ෂයේදී, සෑම උපාධි පාඨමාලාවකටම අදාළව ආයතනික සහ පාඨමාලා සමාලෝචන පවත්වා උපාධි පිරිනැමීමේ තත්ත්වය ලබා දීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පහත සඳහන් උපාධි පාඨමාලා ගරු අමාත්‍යතුමා වෙත නිර්දේශ කර ඇත.

ආයතනයේ නම	උපාධි පාඨමාලාවේ නම
ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය	විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය කාර්මික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය මූලද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය	විද්‍යාවේදී උපාධිය (ව්‍යවහාරික ගණකාධිකරණය)
ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය	ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලාව පරිගණක ජාල පශ්චාත් ඩිප්ලෝමාව මානව සම්පත් කළමනාකරණ පශ්චාත් ඩිප්ලෝමාව කාර්මික කළමනාකරණ පශ්චාත් ඩිප්ලෝමාව ව්‍යාපෘති කළමනාකරණ පශ්චාත් ඩිප්ලෝමාව මෘදුකාංග ඉංජිනේරු පශ්චාත් ඩිප්ලෝමාව
ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ විද්‍යායතනය	බෞද්ධ නායකත්ව ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය

එසේම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2012 ජූලි 26 දින පැවති 854 වන රැස්වීමේදී, ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ (NIBM) වෙත ලබා දී තිබූ උපාධි පිරිනැමීමේ තත්ත්වය නිෂ්ප්‍රභා කර, එහි උපාධි පිරිනමන ආයතනය වන ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යායතනය (NSBM) වෙත උපාධි පිරිනැමීමේ තත්ත්වය ලබා දීම සඳහා ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙත නිර්දේශ කිරීමට තීරණය කරන ලදී.

5.7 භාෂා නිපුණතා, තොරතුරු තාක්ෂණ සහ මෘදු කුසලතා සංවර්ධනය

භාෂා, තොරතුරු තාක්ෂණ සහ මෘදු කුසලතාවන් හි ඉහල නිපුණතාවයක් සහිත උපාධිධාරීන් සඳහා ඉතා විශාල වෙළඳපොල ඉල්ලුමක් ඇති බැවින්, ඔවුන්ගේ ප්‍රථම උපාධි අපේක්ෂක කාලපරිච්ඡේදයේදී, එකී කුසලතා සංවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

ඒ අනුව, 2011 සිට විශ්වවිද්‍යාල වලට ඇතුළු වන නවක සිසුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහනක් සහ පූර්ව නම්‍යතා වැඩසටහනක්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පවත්වනු ලබයි. මීට අමතරව ශිෂ්‍යයන්ගේ සහජ දක්ෂතා (කවිතා වැඩසටහන) සහ ක්‍රීඩා කුසලතා සංවර්ධනය කිරීමේ අරමුණින් ඒවාට අදාල සංවර්ධන වැඩසටහන් අමාත්‍යාංශය මගින් පවත්වනු ලැබේ.

අ) භාෂා නිපුණතා කුසලතා

සමාලෝචිත වර්ෂයේදී, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා වන ස්ථාවර කමිටුව විසින් විශ්වවිද්‍යාල සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා නිපුණතා ශක්තිමත් කිරීම සම්බන්ධව සාකච්ඡා වට කිහිපයක් පැවැත්විණ. මේ සම්බන්ධව ගෙන ඇති ප්‍රධානතම ක්‍රියාකාරකමක් වුයේ විශ්වවිද්‍යාල පද්ධතියේ තිබෙන සෑම ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයක්ම ශක්තිමත් කිරීමය.

සිසුන්ගේ භාෂා නිපුණතා වැඩිදියුණු කිරීමේ අරමුණින්, හැකි සෑම අවස්ථාවකදීම ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස උපාධි පාඨමාලාවලදී හඳුන්වා දීමට අවශ්‍ය ක්‍රියාවන් ද ගෙන ඇත. ද්වි භාෂා ඉගැන්වීම සහ සිංහල/ දෙමළ මාධ්‍යයෙන් ඉගැන්වීම් කෙරෙන ඇතැම් පාඨමාලා ඒකක ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වීමටද විශ්වවිද්‍යාල මගින් හඳුන්වා දී ඇත.

එසේම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමග එක්ව පරිවර්තන අධ්‍යයන පාඨමාලා සම්බන්ධීකාරකවරු සමග සාකච්ඡා කිහිපයක් පැවත්වූ අතර එහිදී විශ්වවිද්‍යාල සිසුන් සඳහා වෘත්තිමය පුහුණුවත් සමගම පරිවර්තන ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවක් හඳුන්වාදීම සඳහා විෂය නිර්දේශ ආකෘතියක් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමට තීරණය කරන ලදී.

ආ) තොරතුරු තාක්ෂණ කුසලතා

සෑම උපාධි පාඨමාලාවකටම අනිවාර්ය විෂයක් ලෙස තොරතුරු තාක්ෂණය විෂය ඉගැන්වීම සඳහා පොදු විෂය මාලාවක් සැකසීමට අවශ්‍ය මාර්ගෝපදේශ පිළියෙල කිරීම සඳහා අදාල ස්ථාවර කමිටුව පියවර ගෙන ඇත.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාස්ත්‍රවේදී විශේෂ උපාධි පාඨමාලාවක් සඳහා විෂය මාලා ආකෘතියක් සංවර්ධනය කර ඇති අතර කලා පීඨයන්හි පීඨාධිපතිවරුන් ඇතුළු සියලු අධ්‍යයන කාර්යමණ්ඩලවලට ඊට අදාල පුහුණුව ලබා දී ඇත. මෙම උපාධි පාඨමාලාව 2014 වර්ෂයේ දී විශ්වවිද්‍යාල විසින් හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ.

ඇ) මෘදු කුසලතා සහ ප්‍රායෝගික පුහුණුව

වෘත්තිය මාර්ගෝපදේශනය සඳහා වන ස්ථාවර කමිටුව, ජෝන් කීල්ස් සමාජ වගකීමේ ව්‍යාපෘතිය සමග එක්ව ශිෂ්‍යයන්ගේ මෘදු කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දී වැඩමුළුවක් පවත්වන ලදී. එසේම මෙම වැඩසටහන අනෙක් විශ්වවිද්‍යාල වලද පැවැත්වීමට තීරණය කර ඇත.

විශ්වවිද්‍යාල සිසුන් හට රාජ්‍ය/ පෞද්ගලික අංශයේ ප්‍රායෝගික පුහුණුව ලබාදීම ප්‍රධානතම අංගයක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව බොහොමයක් විශ්වවිද්‍යාල වල වෛද්‍ය විද්‍යා සහ ඉංජිනේරු පාඨමාලාවලට අමතරව කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණ පාඨමාලා සඳහා ද ප්‍රායෝගික පුහුණුව හඳුන්වා දී ඇත. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා සහ විද්‍යා පාඨමාලාවන් සඳහා ද ප්‍රායෝගික පුහුණුව හඳුන්වා දීමට ඇති හැකියාව, කොමිෂන් සභාවේ අදාල ස්ථාවර කමිටුව විසින් ගවේශණය කරමින් පැවතුනි.

5.8 පවත්වන ලද වැඩමුළු

- ***වෘත්තිය මාර්ගෝපදේශ උපදේශකවරු/අධ්‍යයන වෘත්තිය මාර්ගෝපදේශකවරු සඳහා වෘත්තිය මාර්ගෝපදේශ උපදේශනය සහ අධ්‍යයන වෘත්තිය මාර්ගෝපදේශනය පිළිබඳ පැවැත් වූ දෙදින පුහුණු වැඩමුළුව***

  කොමිෂන් සභා චක්‍රලේඛ අංක 934 මගින් හඳුන්වා දුන් වෘත්තිය මාර්ගෝපදේශන ඒකකවල පුහුණු කිරීම් අංගය ශක්තිමත් කිරීම සහ අනුකූලනය කිරීම පිණිස වෘත්තිය මාර්ගෝපදේශනය සඳහා වන ස්ථාවර කමිටුව විසින් 21වන සියවස සඳහා උසස්

අධ්‍යාපන ව්‍යාපෘතිය සහ EDEX වෘත්තිය සේවා සමග එක්ව 2012 දෙසැම්බර් 4 සහ 5 දිනයන්හිදී කොළඹ ජානකී හෝටලයේ දී වෘත්තිය මාර්ගෝපදේශ උපදේශනය හා අධ්‍යයන වෘත්තිය මාර්ගෝපදේශන පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුවක් පවත්වන ලද අතර එය සම්පූර්ණ සහභාගීත්වය සහිත සාර්ථක වැඩමුළුවක් විය.

- ***වෘත්තිය මාර්ගෝපදේශ සඳහා වන ස්ථාවර කමිටුව ජෝන් කීල්ස් සමාජ වගකීමේ ව්‍යාපෘතිය සමග එක්ව සිසුන් සඳහා මෘදු කුසලතා සංවර්ධනය කිරීම සඳහා පැවැත් වූ තෙදින වැඩමුළුව***

  වෘත්තිය මාර්ගෝපදේශන සඳහා වන ස්ථාවර කමිටුව විසින් සිසුන්ගේ මෘදු කුසලතා වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් ජෝන් කීල්ස් සමාජ වගකීමේ ව්‍යාපෘතිය සමග එක්ව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දී මෘදු කුසලතා සංවර්ධනය කිරීම සඳහා වන තෙදින වැඩමුළුවක් පවත්වන ලදී. මේ සඳහා කීර්තිමත් පුද්ගලයන්ගේ සම්පත් දායකත්වයක් තිබූ අතර වැඩමුළුවට සෑම පීඨයක්ම නියෝජනය වන පරිදි සිසුන් 500 කගේ සහභාගිත්වයක් විය.

- ***21 වන සියවස සඳහා සෞඛ්‍ය වෘත්තිකයන්ගේ අධ්‍යාපනය සඳහා වන ගෝලීය කමිටුවේ කෙටි වාර්තාව එළි දැක්වීම***

  වෛද්‍ය විද්‍යාව සහ දන්ත වෛද්‍ය විද්‍යාව ස්ථාවර කමිටුව විසින් 2012 ජුනි 08 වන දින, හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ සහ පුහුණු ආයතනයේදී සෞඛ්‍ය වෘත්තිකයන්ගේ අධ්‍යාපනය සඳහා වන ගෝලීය කමිටුවේ කෙටි වාර්තාව එළි දැක්වීම සඳහා කටයුතු කරන ලදී. මෙම කෙටි වාර්තාව එළි දැක්වීමේ අරමුණ වූයේ ලොව පුරා සෞඛ්‍ය වෘත්තිකයන්ගේ අධ්‍යාපනය දෙවන සියවසට අදාල වන ලෙස ප්‍රතිසැකසීම සඳහා අදාල වන සොයා ගැනීම් සහ නිර්දේශ සම්බන්ධව සෞඛ්‍ය වෘත්තිකයන්ගේ දැනුවත් භාවය ඇති කිරීමයි. මෙය අන්තර් අධ්‍යයන වෛද්‍ය මඩුල්ලේ සහ ශ්‍රී ලංකා විද්‍යා ජාතික විද්‍යායතනයේ සහයෝගය ඇතිව පවත්වන ලදී.

- ***MBBS (මනෝ විද්‍යා) විභාගයේ, මනෝවිද්‍යාව සඳහා පොදු විභාග ආකෘතියක් සකස් කිරීම පිළිබඳව පැවත් වූ සාකච්ඡා - මනෝවිද්‍යා කණ්ඩායම***

  වෛද්‍ය විද්‍යාව සහ දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳව වන ස්ථාවර කමිටුව විසින්, MBBS පොදු අවසාන බහුවරණ ප්‍රශ්න පත්‍ර විභාගයේ දී මනෝවිද්‍යාව ක්ෂේත්‍රය ගැන වඩාත්ම නිවැරදි තනි පිළිතුරක් සහිත බහුවරණ ප්‍රශ්න පිළියෙල කිරීම ගැන සාකච්ඡාවක් 2012 සැප්තැම්බර් 13 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේදී පවත්වන ලදී.

- ***දේශීය වෛද්‍ය විද්‍යා විෂයමාලාව පුනරීක්ෂණය කිරීම සඳහා වැඩමුළුව***

  පවත්නා දේශීය වෛද්‍ය විද්‍යා විෂයමාලාව සමාලෝචනය කිරීමට සහ "ආයුර්වේද/යුනානි/සිද්ධ වෛද්‍ය විද්‍යා කොටස් සඳහා පොදු බහුවරණ ප්‍රශ්න පත්‍රයක් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රධාන විෂයමාලාවක් සැකසීම" සඳහා 2012 අගෝස්තු 28 වන දින කොළඹ ජානකී හෝටලයේ දී වැඩමුළුවක් පවත්වන ලදී.

- ***විශ්වවිද්‍යාලයන්හි ආයුර්වේද/යුනානි/සිද්ධ වෛද්‍ය විද්‍යා පාඨමාලාවන්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා නේවාසික වැඩමුළුව***

  HETC ව්‍යාපෘතිය, දේශීය වෛද්‍ය විද්‍යා සඳහා වන ස්ථාවර කමිටුව සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලය එක්ව උස්වැටකෙයියාවේ, පාම් විලේජ් හෝටලයේදී 2012 ඔක්තෝම්බර් 15-16 යන දිනයන්වල දී ඉහත කරුණ ගැන වැඩමුළුවක් පවත්වන ලදී.

- ***ගෝලීය පරිසරයක නැගී එන අවශ්‍යතා සහ අභියෝග ජය ගැනීම සඳහා ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල නැවත නිර්මාණය කිරීම සහ නැවත ස්ථාපිත කිරීම ගැන වැඩමුළුව***

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2012 ජුනි 18-19 දිනයන්වලදී වාද්දුව සැන්ඩ්ස් බීච් හෝටලයේදී "ගෝලීය පරිසරයක නැගී එන අවශ්‍යතා සහ අභියෝග ජය ගැනීම සඳහා ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල නැවත නිර්මාණය කිරීම සහ නැවත ස්ථාපිත කිරීම" යන මැයෙන් වැඩමුළුවක්, HETC ව්‍යාපෘතියේ මූලාධාර ඇතිව පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්, රාජ්‍ය නිලධාරීන්, පෞද්ගලික අංශයේ සහ විදේශීය සම්පත් දායකයන් ඇතුළුව පුද්ගලයන් 80ක් පමණ සහභාගී විය. මෙම

වැඩමුළුවේ අරමුණ වූයේ උසස් අධ්‍යාපනයේ ග්‍රහණය කරගැනීමට තිබෙන අවස්ථා ලබාගැනීමට සහ ඉතාමත් උග්‍ර තරගකාරී ගෝලීය පරිසරයක අභියෝගයන් ගැන සාකච්ඡා කිරීම ය.

වැඩමුළුවේ වාර්තා සටහන් ප්‍රකාශයට පත් කර ඇති අතර එහි නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමාට සහ උසස් අධ්‍යාපන ගරු අමාත්‍යතුමාට භාරදෙන ලදී.

5.9 ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි සංරක්ෂණ සහ ආරක්ෂණ ඒකක පිහිටුවීම

ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි සංරක්ෂණ සහ ආරක්ෂණ ඒකක පිහිටුවීම සම්බන්ධයෙන් අදාල ස්ථාවර කමිටුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා කොමිෂන් සභා අනුමැතිය ලබා දෙන ලදී. මේ සඳහා ආරම්භක පියවර ලෙස 2012 වර්ෂයේ දී කොළඹ, පේරාදෙණිය, යාපනය සහ නැගෙනහිර යන විශ්වවිද්‍යාලවල පුස්තකාල සඳහා රුපියල් මිලියනය බැගින් වෙන් කර ඇත.

5.10 කණිෂ්ඨ ආචාර්යවරුන් සඳහා වන කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහනට තොරතුරු සාක්ෂරතා ඒකකයන් හඳුන්වා දීම

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා දැනට පවත්වනු ලබන කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහනට තොරතුරු සාක්ෂරතාවය පිළිබඳ ඒකකයන් ඇතුලත් කිරීමටත් එය කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන සහ පුස්තකාලවල ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ අනුග්‍රහයෙන් පැවැත්විය යුතු බවටත් කොමිෂන් සභාව තීරණය කරනු ලදුව ක්‍රියාත්මක වේ.

5.11 ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ ලකුණු සහ ශ්‍රේණි නැවත පරීක්ෂා කිරීම සඳහා විධිවිධාන සැලසීම

ප්‍රථම උපාධි අපේක්ෂකයන් තම විභාග ලකුණු සහ ශ්‍රේණි නැවත පරීක්ෂා කිරීම සඳහා බලාපොරොත්තුවේ නම් ඒ සඳහා අවසර ලබාදීම පිණිස පවත්නා විභාග අතුරු නීති සංශෝධනය කිරීම සඳහා සෑම විශ්වවිද්‍යාලයකින්ම සහ උසස් අධ්‍යාපන ආයතනයකින්ම ඉල්ලා සිටිමට 2011 නොවැම්බර් 17 වන දින පැවති 838 වන කොමිෂන් සභා රැස්වීමේදි ගන්නා ලද තිරණය අනුව පවත්නා විභාග අතුරු නීති/ මාර්ගෝපදේශ සංශෝධනය කර ඒ ඒ අදාල සනාතන සභාවට සහ පාලක සභාවට අනුමැතිය සඳහා යොමු කිරීමට උපදෙස් දී ඇත.

5.12 ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග පෙළ ගැසීම සඳහා පරිගණක විද්‍යා උපාධි වර්ගීකරණය කිරීම

වර්ෂයක කාල පරිච්ඡේදයක් තුළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග පරිගණක විද්‍යා උපාධි පෙල ගැස්වීම සඳහා විශ්වවිද්‍යාලවලට, ACM/IEEE මාර්ගෝපදේශවලට අනුකූලව තම පරිගණක විද්‍යා උපාධි පාඨමාලා නිර්මාණය කරගැනීමට අවශ්‍ය උපදෙස් චක්‍රලේඛ මගින් ලබාදීමට කටයුතු කරන ලදී.

5.13 උපාධිධාරී/පශ්චාත් උපාධිධාරී නිමැවුම

උපාධිධාරී නිමැවුම

2012 වර්ෂයේදී මුළු උපාධිධාරී නිමැවුම 8,847 කි. මුළු උපාධිධාරී නිමැවුමේන් 37.5% ක් පමණ වූ බහුතරය කලා විෂය ධාරාවෙන් පිටවූ උපාධිධාරීන්ය. 2012 වර්ෂය සඳහා වන මුළු උපාධිධාරී නිමැවුමේ ව්‍යාප්තිය පහත පරිදි වේ.

2010 සහ 2012(1) වර්ෂය සඳහා උපාධිධාරී නිමැවුම

අධ්‍යයන ක්ෂේත්‍රය	2010	2011	2012(2)
කලා	4,432	6,882	3116
කළමනාකරණ සහ වානිජ්‍ය	2,704	2,849	1625
නීතිය	392	348	445
වෛද්‍ය විද්‍යාව	797	1,061	820
දන්ත ශල්‍ය විද්‍යාව	64	65	
පශු වෛද්‍ය විද්‍යාව	60	58	54

කෘෂිකර්මය	540	595	515
ඉංජිනේරු	1,285	1,346	167
වාස්තු විද්‍යාව සහ ප්‍රමාණ සමීක්ෂණය	140	211	150
විද්‍යාව	2,420	2,750	1627
අතුරු වෛද්‍ය විද්‍යාව	-	340	191
දේශීය වෛද්‍ය විද්‍යාව	208	181	137
එකතුව	**13,042**	**16,686**	**8,847**

සටහන (1) බාහිර උපාධි ඇතුලත් නොවේ.
(2) 2012 වර්ෂයේ උපාධිධාරී නිමැවුම පසුගිය වර්ෂ වලට සාපේක්ෂව අඩුවීමට පිඨයන් කිහිපයකම අවසාන විභාගයන්, 2012 වර්ෂයේ ඇතිවු අධයපන අනධයපන කාර්යමණ්ඩලයේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතු කරගෙන පැවත්වීමට නොහැකිවීම හේතු විය.

පශ්චාත් උපාධි නිමැවුම

රැකියා වෙළඳපලේ පවත්නා ඉහල තරගකාරීත්වය සමග එක්ව ගමන් කරනු පිණිස පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි වීමේ ඉහල නැඹුරුවක් දක්නට ඇත. 2012 වසරේ මුළු පශ්චාත් උපාධි නිමැවුම 7,887 ක් විය. මෙය පෙර වසර සමග සැසදීමේදී 2,649 ක වැඩිවීමකි.

2012 වර්ෂය සඳහා පශ්චාත් උපාධි නිමැවුම

අධ්‍යයන ක්ෂේත්‍රය	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	ශාස්ත්‍රපති / විද්‍යාපති/දර්ශනපති	ආචාර්ය උපාධි
කලා	4047	1219	21
කළමනාකරණ සහ වාණිජ්‍යය	293	1015	-
නීතිය	-	2	-
වෛද්‍ය විද්‍යාව හා දන්ත ශල්‍ය විද්‍යාව	152	72	229
පශු වෛද්‍ය විද්‍යාව හා කෘෂිකර්මය	-	200	7
ඉංජිනේරු	18	110	2
වාස්තු විද්‍යාව සහ ප්‍රමාණ සමීක්ෂණය	2	3	2
විද්‍යාව	144	329	8
දේශීය වෛද්‍ය විද්‍යාව	12	-	-
එකතුව	**4668**	**2950**	**269**
මුළු එකතුව		**7887**	

6. මුල්‍ය පරිපාලනය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 15 (ii) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලට සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන අයවැය ඇස්තමේන්තු එම ආයතනවල සහයෝගය ඇතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළියෙල කරන ලදී.

2012 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත හා අනුමත කරන ලද අයවැය

කාණ්ඩය/අරමුණ	ඇස්තමේන්තුගත අයවැය (මිලි)	අනුමත අයවැය (මිලි)	අනුමත %
පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන	16,762	14,504	79.1%
ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන	11,601	5,779	49.8%

එකතුව	**28,363**	**20,283**	
ආරක්ෂක සේවා සඳහා පුනරාවර්තන ලැබීම් යටතේ අතිරේක වෙන් කිරීම්	-	215	-
මුළු ප්‍රතිපාදන	**28,363**	**20,498**	-
අභ්‍යන්තර ආදායම්	1,560	1,560	100%

එම වසරේ මුළු ප්‍රතිපාදන (අතිරේක වෙන් කිරීම් සමග) සහ මුදාහරින ලද/ ප්‍රයෝජනයට ගන්නා ලද ප්‍රමාණය පෙර වසර සමග සැසඳීමක් ලෙස පහත දක්වා ඇත.

විශ්වවිද්‍යාල පද්ධතියේ අරමුදල් වෙන්කිරීම්/ප්‍රයෝජනයට ගැනීම්

ප්‍රදාන	2011				2012		
	මුළු අරමුදල් වෙන් කිරීම්	**මුදා හරින ලද මුළු අරමුදල රුපි මිලි**	**මුදා හැරීම්/ භාවිතා කිරීම්, මුළු වෙන් කිරීම් වලින් % ලෙස**		**මුළු අරමුදල් වෙන් කිරීම් රුපි මිලි**	**මුළු අරමුදල් වෙන් කිරීම් රුපි මිලි**	**මුදා හැරීම් /භාවිතා කිරීම් මුළු වෙන් කිරීම් වලින් % ලෙස**
පුනරාවර්තන ප්‍රදාන	13,161.2	12,961.1	98%		14,719.0	14,611.0	99%
ප්‍රාග්ධන ප්‍රදාන	7,100.0	4,278.7	60%		5,778.5	4,340.8	75%
එකතුව	**20,261.2**	**17,239.8**	**85%**		**20,497.5**	**18,951.8**	**92%**

පසුගිය වසර හා සැසඳීමේදී 2012 වර්ෂයේ දී පුනරාවර්තන ප්‍රදාන සඳහා වෙන් කිරීම් 12% න් ඉහළ ගොස් ඇති නමුත් ප්‍රාග්ධන වියදම් සඳහා වන වෙන් කිරීම් 19% න් පහළ ගොස් ඇත. (රුපියල් මිලියන 7,100 සිට රුපියල් මිලියන 5778.5 දක්වා)

ඉහළ වගුවෙන් පෙන්වා ඇති පරිදි 2012 වර්ෂයේ දී ප්‍රාග්ධන ප්‍රදාන භාවිතය / මුදා හැරීම්, මුළු ප්‍රාග්ධන වෙන් කිරීම වන රුපියල් මිලියන 5778.5 න් 75% ක් වන අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 15% වැඩිවීමකි. කෙසේ වුවද වියදම් පිළිබඳව සැළකීමේදී එය පෙර වර්ෂයට වඩා 1.5 % ක වැඩිවීමකි. (2011 - රුපි මිලි 4278.7, 2012 - රුපි මිලි 4,340.8).

6.1 අරමුදල් බෙද හැරීමේ ප්‍රතිපත්තිය – පුනරාවර්තන වියදම් වෙන් කිරීම්

විශ්වවිද්‍යාල සහ ප්‍රථම උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතන වෙත පුනරාවර්තන වියදම් වෙන් කිරීම පහත සඳහන් සූත්‍රය මත පදනම්ව සිදු කර ඇත.

පුනරාවර්තන වියදම් = එක් ශිෂ්‍යයෙකු සඳහා සකස් කරන ලද පිරිවැය x ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව

එක් ශිෂ්‍යයකු සඳහා සකස් කරන ලද පිරිවැය පහත සඳහන් ප්‍රතිපත්තිමය සාධක සලකා බලා ගණනය කර ඇත.

- 2011 වර්ෂයේදී වැඩි වූ අධ්‍යයන දීමනාව
- 2011 වර්ෂයේදී හඳුන්වා දෙන ලද අධ්‍යයන පර්යේෂණ දීමනාව
- පුද්ගල වේතනවල වාර්ෂික වර්ධක

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 43 (BP 2011) මගින් ක්‍රියාත්මක කරන ලද වැටුප් සහ ජීවන වියදම් දීමනා
- ජීවන වියදම් දීමනාව මත විශ්වවිද්‍යාල අර්ධසාධක අරමුදලට සහ සේවා නියුක්ති භාරකාර අරමුදලට දායක මුදල් වෙන් කිරීම (යොමුව : ආයතන චක්‍රලේඛ අංක 14/2011)
- අනෙකුත් පුනරාවර්තන සඳහා උද්ධමන ගැලපීම්

6.2 අරමුදල් ප්‍රතිපත්ති – ප්‍රාග්ධන ප්‍රදාන සඳහා වෙන් කිරීම

අ) ප්‍රමුඛතාව පදනම් කරගෙන අරමුදල් ලබාදීම.

ප්‍රමුඛතාව පදනම් කරගෙන අරමුදල් ලබාදීමේ ප්‍රතිපත්තියට අනුව ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම සඳහා මිණුම් 05 ක් සළකා බලන ලදී;

i. කෙරෙමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති

ii. දස වසරක මධ්‍ය කාලීන වැඩසටහන යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති

iii. පීඨ භාරය / බර තැබීම - විශ්වවිද්‍යාල සඳහා බර තැබීම ගණනය කිරීම සඳහා එක් විෂය ක්ෂෙත්‍රයක ඒක පුද්ගල සාපේක්ෂ ශිෂ්‍ය පිරිවැය පදනම් කරගත් අතර ඒ අනුව සෑම විශ්වවිද්‍යාලයක් සඳහාම අළුත්වැඩියා හා යෝජිත ස්ථාවර වත්කම් අත්පත් කරගැනීමේ ප්‍රදාන වෙන් කිරීම ගණනය කරන ලදී.

යෝජිත සාපේක්ෂ පිරිවැය ගුණක – වෛද්‍ය විද්‍යා - 5, විද්‍යා - 3, කළමනාකරණ - 1, නීති - 1, කලා - 1, අධ්‍යාපනය - 1, ඉංජිනේරු විද්‍යාව - 3, පශු වෛද්‍ය විද්‍යා - 4, කෘෂි විද්‍යා - 3, පරිපූරක වෛද්‍ය විද්‍යාව - 2.

iv. පහත යෝජිත පරිදි ස්ථර තුනක් සඳහා උපරිම සහ අවම ප්‍රාග්ධන ප්‍රදාන හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය විශේෂ කුවේට් ප්‍රදාන මගින් මූල්‍ය සහාය සපයන ලද බැවින් උතුරු - නැගෙනහිර ස්ථරය යටතේ සලකා බලන ලදී.

ස්ථරය (T)		**විශ්වවිද්‍යාල**	**එක් ශිෂ්‍යයකු සඳහා වන උපරිම ප්‍රාග්ධන ප්‍රදාන රුපි. 000**	**එක් ශිෂ්‍යයකු සඳහා වන අවම ප්‍රාග්ධන ප්‍රදාන රුපි. 000**
T-1	ස්ථාපිත විශ්වවිද්‍යාල	පේරාදෙණිය, කොළඹ, ජ'පුර,කැළණිය, මොරටුව, රුහුණ	රුපි. 30 - රුපි. 40	කුඩා විශ්වවිද්‍යාල සඳහා අවමය රුපියල් 200/- ක් වන පරිදි එක් විශ්වවිද්‍යාලකට රුපියල් 200/-
T-2	උතුරු හා නැගෙනහිර විශ්වවිද්‍යාල	යාපනය, නැගෙනහිර	රුපි. 120 - රුපි. 130	
T-3	නව විශ්වවිද්‍යාල	රජරට, වයඹ,සබරගමුව, අග්නිදිග,ඌව වෙල්ලස්ස, සෞන්දර්ය කලා	රුපි. 100 - රුපි. 113	

v. ව්‍යාපෘති ඇගයීම් හා නිරීක්ෂණ කමිටුව (PEMC) විසින් අනුමත පරිදි, උසස් අධ්‍යාපන ආයතනයන්හී අවශ්‍යතා සහ ප්‍රමුඛතා පදනම් කොට ගෙන පශ්චාත් උපාධි ආයතන සහ අනෙකුත් සෑම උසස් අධ්‍යාපන ආයතනයක් සඳහාම අරමුදල් සපයන ලදී.

ආ) කාර්ය ඵලය පදනම් කරගෙන අරමුදල් සැපයීම

ප්‍රාග්ධන වියදම් භාවිතයේ ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා දෙවන කාර්තුවේදී (2012 ජුනි) සහ හතරවන කාර්තුවේදී (2012 ඔක්තෝම්බර්) ප්‍රගති සමාලෝචන රැස්වීම් දෙකක් පැවැත්වීමට යෝජනා විය. ඒ අනුව විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනවල කාර්ය සාධනය පදනම් කොට ගෙන අතිරේක අරමුදල් ඒවාට වෙන් කිරීම/නැවත වෙන් කිරීම සිදු කරන ලදී.

ඇ) දැනුම වැඩිදියුණු කිරීම හා ආයතනික සංවර්ධන වැඩසටහන

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ සමස්ථ අරමුණු ලඟා කර ගැනිම සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාවේ කුසලතා, නිපුණතා සහ දැනුම වැඩි දියුණු කිරීමට සහ ආයතනික ශක්‍යතාව වැඩි දියුණු කිරීමට යෝජනා විය.

ඒ අනුව, 2012 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඇස්තමේන්තුගත පරිදි දැනුම වැඩි දියුණු කිරීම සහ ආයතනික සංවර්ධන වැඩසටහන යටතේ පහත සඳහන් ව්‍යාපෘති යෝජනා කෙරෙන ලදී.

ව්‍යාපෘති 1 : ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ නායකත්ව නිපුණතා සහ ධනාත්මක චින්තන සංවර්ධනය
ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ නායකත්ව නිපුණතා සහ ධනාත්මක චින්තනය සංවර්ධනය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ සහායද ඇතිව උසස් අධ්‍යාපන අමාත්‍යංශය විසින් නායකත්ව ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරන ලදී. ඒ අනුව, විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා තෝරා ගන්නා ලද ශිෂ්‍යයන් සඳහා න්‍යායාත්මක සහ ප්‍රායෝගික නේවාසික පුහුණු පාඨමාලා පවත්වන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා වන අරමුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත අයවැය සීමාව තුළ උසස් අධ්‍යාපන ආයතනය වෙත මුදා හරින ලදී.

ව්‍යාපෘති 2 : ක්‍රීඩා කුසලතා සංවර්ධනය
ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ ක්‍රීඩා කුසලතා හඳුනා ගැනීමට සහ වැඩි දියුණු කිරීමට හෝ සංවර්ධනය කිරීමට විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනයන්හී සහායද ඇතිව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රීඩා කුසලතා සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරන ලදී.

ව්‍යාපෘති 3 : කුසලතා සංවර්ධනය
ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ විශේෂ කුසලතා හඳුනා ගැනීමට සංවර්ධනය කිරීමට සහ අගය කිරීමට විශ්වවිද්‍යාල සහාය ඇතිව උසස් අධ්‍යාපන ආයතන විසින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරන ලදී. ඒ අනුව ප්‍රකාශන/රූපවාහිනී වෙළඳ දැන්වීම් සහ නාට්‍ය නිෂ්පාදනය කිරීම සඳහා වැඩමුළු පවත්වන ලද අතර අන්තර් විශ්වවිද්‍යාල කුසලතා උළෙලක් (කවිතා) පැවැත්වීමේ අරමුණු ඇතිව වසර පුරා මූලික මට්ටමේ තරග පවත්වන ලදී.

ව්‍යාපෘති 4 : ව්‍යවසාය සංවර්ධනය : වෘත්තීය මාර්ගෝපදේශනය
ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ ව්‍යවසායකත්ව කුසලතා හඳුනාගැනීම, වැඩි දියුණු කිරීම හෝ සංවර්ධනය කිරීම පිණිස විශ්වවිද්‍යාලවල ද සහාය ඇතිව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරන ලදී, ඒ අනුව, කලා සහ කළමනාකරණ ප්‍රථම උපාධි අපේක්ෂකයන් 1500 ක් සඳහා ශ්‍රී ලංකාවේ පිළිගත් වෘත්තියමය ආයතන සමග එක්ව ව්‍යවසායකත්ව වැඩසටහන් හඳුන්වා දීමට යෝජනා විය. එසේම අවසන් වසර සිසුන් සඳහා වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීමට යෝජනා විය.

ව්‍යාපෘති 5 : විදේශ සිසුන් 1000 ක් ආකර්ෂණය කර ගැනීමේ වැඩසටහන
තෝරා ගන්නා ලද විශ්වවිද්‍යාල 06 ක් සඳහා විදේශ සිසුන් 1000 ක් ආකර්ෂණය කර ගැනිම සඳහා විශ්වවිද්‍යාල සහාය ඇතිව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරන ලද අතර සාර්ක් සහ අනෙකුත් රටවල් අතර දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට යෝජනා කරන ලදී.

ව්‍යාපෘති 6 : අධ්‍යයන ප්‍රකාශන, ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ පර්යේෂණ
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඇගයීමට ලක් කිරීමෙන් අනතුරුව තෝරාගන්නා ලද අධ්‍යාපන ප්‍රකාශන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ පර්යේෂණ ව්‍යාපෘති සඳහා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වෙත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කමිටු හරහා අරමුදල් වෙන් කරන ලදී.

ව්‍යාපෘති 7 : ආචාර්ය උපාධි 30 සහ දර්ශනපති උපාධි 200

මෙම ව්‍යාපෘතිය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජාත්‍යන්තර සහයෝගිතා අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. ඒ අනුව පහත පරිදි අරමුදල් වෙන් කරන ලදී;

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය සඳහා රුපියල් මිලියන 60
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජාත්‍යන්තර සහයෝගිතා අංශය සඳහා රුපියල් මිලියන 20

ව්‍යාපෘති 8 : කාර්ය මණ්ඩල සංවර්ධනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මානව සම්පත් අංශය සමග එක්ව අදාල ස්ථාවර කමිටුව මෙම ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරන ලදී. අදාල කමිටුව විසින් ඇගයීමට ලක් කර අනුමත කරන ලද ව්‍යාපෘති වාර්තා පදනම් කොට ගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන වෙත අරමුදල් වෙන් කරන ලදී.

ව්‍යාපෘති 9 : තොරතුරු තාක්ෂණ සංවර්ධනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ සංවර්ධන කමිටුව විසින් තොරතුරු තාක්ෂණ සංවර්ධන ප්‍රතිපාදන සම්බන්ධීකරණය කරන ලද අතර තොරතුරු තාක්ෂණය පදනම් කර ගත් ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් ලබා දෙන ලද යෝජනා පදනම් කොට ගෙන අරමුදල් ඒ සඳහා වෙන් කරන ලදී.

ඈ) විශ්ව විද්‍යාල හයක් ජාත්‍යන්තර තලයට ප්‍රවර්ධනය කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ව්‍යාපෘති ඇගයීම් සහ උපදේශන කමිටුවේ නිර්දේශ පරිදි ඉහත වැඩසටහන සඳහා වාර්ෂික වියදම් සීමාවන්ට යටත්ව විශ්වවිද්‍යාලවල දැනට කෙරෙමින් පවතින ව්‍යාපෘතිවල කාර්ය භාරය ද පදනම් කරගෙන අරමුදල් වෙන් කෙරිණ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි 2008-2012 දක්වා මූල්‍ය ක්‍රියාකාරිත්වය

රුපි.මිලි.

		2008	2009	2010	2011	2012
1.	**රාජ්‍ය වෙන් කිරීම්**					
	පුනරාවර්තන	10,940	11,107	11,415	13,161	14,719
	ප්‍රාග්ධන	4,929	4,520	3,500	7,100	5,779
2.	**වියදම්**					
	පුනරාවර්තන	9,901	10,227	10,962	12,961	14,591
	ප්‍රාග්ධන	2,996	2,726	2,832	4,279	4,361
3.	**ශිෂ්‍ය මූල්‍ය ආධාර**					
	මහපොළ	106	92	93	127	125
	ශිෂ්‍යාධාර	251	297	328	357	375
	සුනාමි සහ පරිත්‍යාග ශිෂ්‍යත්ව	1	1	2	1	1



මූල්‍ය පරිපාලනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / විශ්වවිද්‍යාල උසස් අධ්‍යාපන ආයතන
පුනරාවර්තන / ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීම්
වර්ෂ 2009 සිට 2012 දක්වා (රුපියල් මිලියන)

විශ්වවිද්‍යාල / ආයතන	ප්‍රාග්ධන ප්‍රදාන			පුනරාවර්තන ප්‍රදාන		
	2010	**2011**	**2012**	**2010**	**2011**	**2012**
පේරාදෙණිය	290	464	393	1,830	2,235	2,267
කොළඹ	238	400	357	1,070	1,243	1,270
ශ්‍රී ජයවර්ධනපුර	180	383	354	980	1,126	1,302
කැළණිය	171	386	350	975	1,100	1,256
මොරටුව	199	375	289	785	882	942
රුහුණ	230	455	337	1,025	1,153	1,223
යාපනය	229	545	543	690	786	869
විවෘත	34	70	67	530	635	663
නැගෙනහිර	160	230	422	346	372	427
රජරට	353	1,033	575	391	503	624
සබරගමුව	257	387	321	385	431	531
අග්නිදිග	130	181	244	242	318	338
වයඹ	164	312	292	305	379	431
සෞන්දර්ය කලා	149	342	194	284	328	379
ඌව වෙල්ලස්ස	200	287	207	155	180	234
කෘෂිකර්ම විද්‍යා පශ්චාත්	2	2	5	18	23	15
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි	4	1	8	82	80	64
පුරා විද්‍යා පශ්චාත් උපාධි	8	22	5	34	43	45
කළමනාකරණ පශ්චාත් උපාධි	10	15	-	-	-	-
විද්‍යා පශ්චාත් උපාධි	5	6	5	14	19	11
පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි	1	1	4	16	11	10
ඉංග්‍රීසි පශ්චාත් උපාධි	1	1	1	4	4	7
දේශීය වෛද්‍ය විද්‍යාව	15	25	36	112	137	157
මානව සම්පත් අභිවර්ධන	4	4	7	19	22	25
පරිගණක අධ්‍යයනායතනය	5	38	25	72	85	93
ගම්පහ වික්‍රමාරච්චි	50	149	91	93	111	128
තාක්ෂණ විද්‍යා	51	5	5	62	77	74
ජාතික පුස්තකාල හා විඥාපන	2	2	2	8	8	9
ජෛව රසායන, අනුක ජෛව	5	31	29	30	35	35
ස්වාමි විපුලානන්ද	6	18	18	31	42	58
මානව ශාස්ත්‍ර	2	82	68	46	10	11
ත්‍රිකුණාමල මණ්ඩපය	68	129	73	58	69	89
වවුනියා	-	-	-	-	-	-
කෘෂි තාක්ෂණික	10	21	24	5	7	8
වි.වි.ප්‍ර.කො.ස.	72	701	427	162	153	151
දකුණු ආසියානු විශ්වවිද්‍යාලය	-	-	-	7	-	-
එකතුව	**3,300**	**7,100**	**5,779**	**10,866**	**12,610**	**13,744**
කාර්ය සාධන ප්‍රතිපාදන	200	-	-	549	551	975
මුළු එකතුව	**3,500**	**7,100**	**5,779**	**11,415**	**13,161**	**14,719**

7. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලීය සේවක සංඛ්‍යාව

2012 වර්ෂය වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලේකම් කාර්යාලය සඳහා විධායක ශ්‍රේණි තනතුරු 60 ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි තනතුරු 179 සහ කණිෂ්ඨ ශ්‍රේණි තනතුරු 53 වශයෙන් තනතුරු 292 කින් සමන්විත සේවක සංඛ්‍යාවක් සඳහා ප්‍රතිපාදන සලසා තිබිණි. 2012 දෙසැම්බර් 31 දිනට පළමු කාණ්ඩයෙන් 41 ක් ද, දෙවන කාණ්ඩයෙන් 120 ක් ද, තුන් වන කාණ්ඩයෙන් 47 ක් ද, සේවයේ නියුතු විය.

7.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සේවකයන්ගේ පත් කිරීම්, උසස් වීම්, විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම්

සමාලෝචිත වර්ෂයේදී, කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත ස්ථිර පත්වීම් 29 ක් සහ කොන්ත්‍රාත් පැවරුම් පදනම යටතේ පත්වීම් 07 ක් ද සිදු කරන ලදී. ස්ථිර පත්වීම් වලින් 12 ක් විධායක ශ්‍රේණි කාණ්ඩයට අයත් ය.

එසේම, මෙම වර්ෂයේදී විධායක සහ ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි සඳහා උසස්වීම් 38 ක් කොමිෂන් සභාව විසින් ලබාදෙන ලදී. 2012 වර්ෂයේදී, සේවකයන් 07 ක් සේවයෙන් විශ්‍රාම ගිය අතර සේවකයන් 03 ක් තම තනතුරු වලින් ඉල්ලා අස්විය.

7.2 දීර්ඝ කාලීන සේවා තිළින

කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සේවකයන් විසින් විශ්වවිද්‍යාල පද්ධතිය වෙත ලබාදෙන ලද දීර්ඝ කාලීන සහ සම්මානනීය සේවය වෙනුවෙන් කොමිෂන් සභා චක්‍රලේඛ 678, 696 සහ 893 ප්‍රකාරව සේවකයන් 14 දෙනෙක් මුදල් ත්‍යාග ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබිය.
සාමාජිකයන් 14 න්, එක් සේවකයෙක් වසර 35ක සේවා කාලයක් ද, සේවකයන් 04ක් වසර 30ක් සහ අනෙකුත් සේවකයන් වසර 25ක සේවා කාලයක්ද සම්පූර්ණ කරන ලදී.

7.3 කාර්ය මණ්ඩල පුහුණුව සහ සංවර්ධනය

සෑම වර්ෂයකම ලේකම් කාර්යාලීය කාර්යය මණ්ඩලයට ඔවුන්ගේ නිපුණතා සහ සේවා දැනුම දියුණු කර ගැනීම සඳහා ඔවුන්ගේ රාජකාරිවලට අදාල වැඩමුළු/පුහුණු පාඨමාලාවන්ට සහභාගීවීමට අවස්ථාව ලබාදෙනු ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, පොදු මූල්‍ය සහ සංවර්ධන ගණකාධිකාරණ ආයතනය, ඉදිකිරීම් පුහුණුව සහ සංවර්ධන ආයතනය, රාජ්‍ය ගිණුම් සහ මූල්‍ය ආයතනය, වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය, ව්‍යාපාර කළමනාකරණය සඳහා වූ ජාතික ආයතනය, සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල, ශ්‍රී ලංකා පදනම් ආයතනය, බ්‍රිතාන්‍ය කවුන්සලය වැනි පිළිගත් ආයතන විසින් මෙහෙයවනු ලබන වැඩමුළු වලට සහ පුහුණු වැඩ සටහන්වලට ඔවුන් යොමු කෙරෙන අතර මේ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වෙනම කාර්ය මණ්ඩල පුහුණු වැඩ සටහන් අරමුදලක් පවත්වාගෙන යනු ලැබේ.

මීට අමතරව, තමන්ගේ රැකියාවේ සංවර්ධනයට ආධාර වන විශ්වවිද්‍යාල පද්ධතියේ උසස් අධ්‍යාපන ආයතන විසින් පවත්වාගෙන යනු ලබන අධ්‍යයන පාඨමාලා හැදෑරීමට අදහස් කරන කාර්යමණ්ඩල සාමාජිකයන්ට මූල්‍යාධාර සැපයීමේ ප්‍රතිපාදන ද සලසා ඇත.

(1) සමාලෝචිත වර්ෂය තුළදී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද විධායක කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් 10 ක් සහ විධායක නොවන කාර්යමණ්ඩලයේ සාමාජිකයින් 37 ක් ඔවුන්ගේ රාජකාරියට සෘජුවම සම්බන්ධ පුහුණු හා සංවර්ධන වැඩසටහන්වලට සහභාගී වන ලදී.

(2) කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සේවකයන්ගේ දෙමළ භාෂා දැනුම වැඩි දියුණු කිරීම සඳහා, ජාතික භාෂා සහ පුහුණු ආයතනයේ සහාය ඇතිව කොමිෂන් සභාවේ සේවකයන් 45 ක් සඳහා දෙමළ භාෂා අධ්‍යයන පාඨමාලාවක් ආරම්භ කරන ලදී.

(3) කෙටිකාලීන විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට විධායක නිලධාරීන් 03 ක් සඳහා රාජකාරි නිවාඩු ලබා දෙන ලද අතර එක් නිලධාරියෙකුට මෙරට දී ආචාර්ය උපාධි හැදැරීම සඳහා වසරක වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාදෙන ලදී.

7.4 ඇගැයීම් සහ පිළිගැනීම්

සමාලෝචිත වර්ෂය තුලදී කොමිෂන් සභාවේ සේවයෙන් ඉවත් වූ සේවක භවතුන් විසින් ඉටුකරන ලද සේවය අගය කිරීමත් එම වර්ෂය තුළදී අලුතින් සේවයට එක් වූ සේවක භවතුන් සතුටින් පිළිගැනීමත් කොමිෂන් සභාව වාර්තා කරයි.

8 මානව සම්පත් ප්‍රගතිය

8.1 සේවක සංඛ්‍යා සමාලෝචනය කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ සලකා බලා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ආයතන සඳහා පහත සඳහන් නව සේවක සංඛ්‍යාව අනුමත කරන ලදී.

ආයතනය	තනතුරු සංඛ්‍යාව
අධ්‍යයන	269
අධ්‍යයන සහාය	25
පරිපාලන සහ අනෙක් කාර්ය මණ්ඩලය	63
කළමනාකරණ සහායක/කාර්මික	61
කළමනාකරණ සහායක/කාර්මික නොවන	136
පුහුණු/නුපුහුණු	197
එකතුව	**751**

8.2 පරිපාලන ශ්‍රේණි සඳහා පත්කිරීම් / උසස් කිරීම්

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71 (2) ජේදයේ (11) සහ (111) උපවගන්ති සහ 8(1) වගන්තිය අනුව පරිපාලන ශ්‍රේණිවලට පත්වීම් හා උසස් වීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කල යුතුය. ඒ අනුව 2012 වර්ෂයේ දී පහත සඳහන් පත්වීම් හා උසස්වීම් සිදුකරන ලදී.

පත්වීම් / උසස්වීම්

(අ) සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී තනතුරු

ආයතනය	**සංඛ්‍යාව**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	06
කොළඹ විශ්වවිද්‍යාලය	02
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	02
කැළණිය විශ්වවිද්‍යාලය	02
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	01
යාපනය විශ්වවිද්‍යාලය	04
රුහුණ විශ්වවිද්‍යාලය	04
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	05
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	02
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	01
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	05
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	04
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	01
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	03
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	01
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	03
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	02
පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	01
කෘෂි තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය	02
ත්‍රිකුණාමල මණ්ඩපය	02

(ආ) සහකාර ගණකාධිකාරී / සහකාර මූල්‍යාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණකාධිකාරී

ආයතනය	සංඛ්‍යාව
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	02
කොළඹ විශ්වවිද්‍යාලය	01
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	02
කැළණිය විශ්වවිද්‍යාලය	01
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	01
යාපනය විශ්වවිද්‍යාලය	02
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	01
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	01
පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	01
ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය	01
කෘෂි තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය	01

(ඇ) ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරු

ආයතනය	සංඛ්‍යාව
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	03
කොළඹ විශ්වවිද්‍යාලය	04
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	02
කැළණිය විශ්වවිද්‍යාලය	01
මොරටුව විශ්වවිද්‍යාලය	01
රුහුණු විශ්වවිද්‍යාලය	03
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	01
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	01
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	02
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	03
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	03
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	01
ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය	01
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය	01

(ඈ) ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරී/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකාධිකාරී තනතුර

ආයතනය	සංඛ්‍යාව
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	01
කොළඹ විශ්වවිද්‍යාලය	01
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	01
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	01
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	01

(ඉ) සහකාර ලේඛකාධිකාරී තනතුර (පුස්තකාල සේවා)

ආයතනය	සංඛ්‍යාව
කොළඹ විශ්වවිද්‍යාලය	01
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	02
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	01

(ඊ) සහකාර ලේකම්/ ලේඛකාධිකාරී (නීති හා ප්‍රලේඛණ)

ආයතනය	සංඛ්‍යාව
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	01

උසස්වීම්

(උ) ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරීවරු U-EX 2(1) වැටුප් පරිමාණයේ පිහිටුවීම

ආයතනය	**සංඛ්‍යාව**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකාධිකාරී)	01
පේරාදෙණිය විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්)	01
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්)	01
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී)	01
මොරටුව විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී)	01
යාපනය විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්)	03
රුහුණු විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්)	02
රුහුණු විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී)	01
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්)	01
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්)	01
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී)	01
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්)	01
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී)	02
පාලි හා බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය (ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී)	01

(ඌ) වාර්ෂික කාර්ය සාධන ඇගයීම් වාර්තාව පදනම් කරගෙන ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී /ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී තනතුරු සඳහා කරන ලද උසස්වීම් (කොමිෂන් සභා චක්‍රලේඛණ අංක 668 පදනම්ව)

ආයතනය	**සංඛ්‍යාව**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කෙමිෂන් සභාව (ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී)	01
කොළඹ විශ්වවිද්‍යාලය (ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකාධිකාරී)	01
ශ්‍රීපාලි මණ්ඩපය (ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී)	01

(එ) නියෝජ්‍ය ලේකම් නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරු

ආයතනය	**සංඛ්‍යාව**
කොළඹ විශ්වවිද්‍යාලය	01
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	01
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	01
පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	01

(ඒ) නියෝජ්‍ය ගණකාධිකාරී/නියෝජ්‍ය මුල්‍යාධිකාරීවරු/නියෝජ්‍ය අභ්‍යන්තර විගණකාධිකාරී තනතුරු

ආයතනය	**සංඛ්‍යාව**
කැළණිය විශ්වවිද්‍යාලය	01
ත්‍රිකුණාමල මණ්ඩපය	01

(ඔ) නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුර (පුස්තකාල සේවා)

ආයතනය	**සංඛ්‍යාව**
මොරටුව විශ්වවිද්‍යාලය	01

(ඕ) නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුර(නීති සහ ප්‍රලේඛණ)

ආයතනය	සංඛ්‍යාව
රුහුණ විශ්වවිද්‍යාලය	01

8.3 **1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71(2)(iii) වගන්තිය ප්‍රකාර 2012 වර්ෂය තුළ දී පහත සඳහන් පරිපාලන නොවන අනධ්‍යයන සේවක පත්වීම් සහ උසස්වීම් සිදුකරන ලදී.**

(1) පත්වීම්

තනතුර	විශ්වවිද්‍යාලය	පත්වීම් සංඛ්‍යාව
වෛද්‍ය නිලධාරී	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	02
	කොළඹ විශ්වවිද්‍යාලය	01
	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	01
වැඩ ඉංජිනේරු (සිවිල්) තුන්වන ශ්‍රේණිය	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	01
	මොරටුව විශ්වවිද්‍යාලය	01
	යාපනය විශ්වවිද්‍යාලය	01
ගොවිපළ කළමණාකරු	වයඹ විශ්වවිද්‍යාලය	01
පුහුණු ඉංජිනේරු තුන්වන ශ්‍රේණිය	විවෘත විශ්වවිද්‍යාලය	01

(2) උසස්වීම්

තනතුර	විශ්වවිද්‍යාලය	පත්වීම් සංඛ්‍යාව
උද්‍යාන පාලක (භූ දර්ශක) III ශ්‍රේණිය	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	01
ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික කාර්මික නිලධාරී	කොළඹ විශ්වවිද්‍යාලය	02
	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	03
	කැළණිය විශ්වවිද්‍යාලය	01
	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	01
	මොරටුව විශ්වවිද්‍යාලය	01
	රුහුණ විශ්වවිද්‍යාලය	01
ප්‍රධාන කාර්මික නිලධාරී	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	01
	කැළණිය විශ්වවිද්‍යාලය	01
ප්‍රධාන ආරක්ෂක නිළධාරී	මොරටුව විශ්වවිද්‍යාලය	01
ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ (උසස් අධ්‍යාපන)	මොරටුව විශ්වවිද්‍යාලය	01
	රුහුණු විශ්වවිද්‍යාලය	01
වැඩ ඉංජිනේරු II ශ්‍රේණිය	කැළණිය විශ්වවිද්‍යාලය	01
මාණ්ඩලික හෙද පාලිකාව	කැළණිය විශ්වවිද්‍යාලය	01
චිත්‍රණ ශිල්පී I ශ්‍රේණිය	විවෘත විශ්වවිද්‍යාලය	01

8.4 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 71(2)(iii) වගන්තිය ප්‍රකාර 2012 වර්ෂය තුළ දී පහත සදහන් පරිපාලන නොවන අනධ්‍යයන සේවක ශ්‍රේණි සහ උසස්වීම් සිදුකරන ලදී.

	පේරාදෙණිය	කැළණිය	ශ්‍රී ජ'පුර	වයඹ	සබරගමු
මාණ්ඩලික කාර්මික නිලධාරී 1	16	02			01
මාණ්ඩලික කාර්මික නිලධාරී 11	10	05			
කාර්මික නිලධාරී 1 ශ්‍රේණිය	17	02			
කාර්මික නිලධාරී 1 ශ්‍රේණිය (A) කාණ්ඩය		01			
ජේ. මාණ්ඩලික සහකාර (ලි.සේ.)	05	02			
මාණ්ඩලික සහකාර (ලි.සේ.)	08	05		01	
ලිපිකරු 1 ශ්‍රේණිය	07	09			
ලිපිකරු 11 ශ්‍රේණිය	07	02	01	01	
මාණ්ඩලික සහකාර (ග.හා.)	01			01	
සරජ් 1 ශ්‍රේණිය				01	
මාණ්ඩලික සහකාර (පු.සේ.)	02	02			
පුස්තකාල සහායක 1 ශ්‍රේණිය	06	01			01
පුස්තකාල සහායක 11 ශ්‍රේණිය	02	01			

8.5 අන්තර් විශ්වවිද්‍යාල මාරුවීම්

විශ්වවිද්‍යාල පනතේ 78 වන වගන්තිය ප්‍රකාර 2012 වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පහත සඳහන් අන්තර් විශ්වවිද්‍යාල මාරුවීම් සිදුකරන ලදී.

පරිපාලන ශ්‍රේණි - 24

අනධ්‍යයන සහ පරිපාලන නොවන - 53

8.6 වැටුප් විෂමතා පිළිබඳ වන කාර්මික ආරවුල්

අ) විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සම්ති සම්මේලනයේ වෘත්තිය සමිති ක්‍රියාමාර්ග

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමිති සම්මේලනය ඔවුන් කරන ලද ඉල්ලීම් රජය විසින් නොසලකා හැර ඇති බව ප්‍රකාශ කරමින් 2012 අප්‍රේල් 26 වැනිද එක් දින සංකේත වැඩ වර්ජනයක් දියත් කරන ලද අතර එදිනම එකී සංගමය විසින් කොළඹ දී විරෝධතා පා ගමනක් ද නිරත විය.

ඉන් පසුව නැවතත් 2012 ජුලි 04 වන සිට 2012 ඔක්තොබර් 10 දක්වා අඛණ්ඩ වැඩ වර්ජනයක නිරත විය,

අ) අනධ්‍යයන කාර්යමණ්ඩලයේ වෘත්තිය සමිති ක්‍රියාමාර්ග

වැටුප් හා සම්බන්ධ කාරණා මුල් කරගෙන 2012-02-29 වන දින අනධ්‍යයන කාර්යමණ්ඩල වෘත්තිය සමිති විසින් අඛණ්ඩ වැඩ වර්ජනයක් ආරම්භ කරන ලදී. 2012-02-29 වන දිනම අනධ්‍යයන කාර්යමණ්ඩල වෘත්තිය සමිතිය, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව උසස් අධ්‍යාපන අමාත්‍යංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමග සාකච්ඡා කිරීමෙන් පසු වෘත්තිය සමිතිය සහ උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් අතර අත්සන් කරන ලද ගිවිසුමට අනුව 2012-03-01 දින සිට වෘත්තිය සමිති ක්‍රියාමාර්ග නවතා දැම්මට වෘත්තිය සමිති විසින් තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2012-03-21 දිනැති මහාභාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය පදනම් කොට ගෙන වැටුප් ප්‍රතිශෝධනය සම්බන්ධව 2012-05-15 දිනැති අංක 985 දරන කොමිෂන් සභා චක්‍රලේඛය නිකුත් කරන ලදී. කෙසේ වෙතත් උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් සහ වෘත්තිය සමිති අතර අත්සන් කරන ලද ගිවිසුමේ කරුණු 985 දරන කොමිෂන් සභා චක්‍රලේඛයෙන් සපුරා නැති බව ප්‍රකාශ

කරමින් 2012 මැයි 22 සහ 23 යන දිනයන්හි දී වෘත්තීය සමිති විසින් දෙදින වැඩ වර්ජනයක් ද, 2012-06-06 දින සිට අඛණ්ඩ වෘත්තීය සමිති වැඩ වර්ජනයක් ද ආරම්භ කරන ලදී.

ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මෙම ගැටළුව කම්කරු කොමසාරිස් ජෙනරාල් වෙත ඉදිරිපත් කරන ලදී. වෘත්තීය සමිති සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර සාකච්ඡා කිපයකට පසුව 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනතේ 12 (1) වගන්තිය මගින් සංශෝධිත පරිදි කාර්මික ආරවුල් විසදීම සඳහා ගිවිසුමකට ප්‍රවිශ්ඨ වු බැවින් 2012-06-27 දින සිට වෘත්තීය සමිති ක්‍රියාමාර්ග නවතා දමන ලදී.

8.7 කාර්යමණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව HETC ව්‍යාපෘතිය සමග එක්ව අධ්‍යයන, විධායක සහ අනධ්‍යයන කාර්යමණ්ඩල සඳහා අදල විවිධ මාතෘකා යටතේ පුහුණු අත්පොත් පෙළක් සකස් කිරීමේ කාර්යයේ නියුතු විය. කාර්යමණ්ඩල සංවර්ධනය සඳහා වන ස්ථාවර කමිටුව සහ මානව සම්පත් සංවර්ධන ඒකකයේ ද සහාය ඇතිව හඳුනාගන්නා ලද සම්පත් දායකයන් විසින් පහත සඳහන් පුහුණු අත්පොත් සහ පුහුණු පාඨමාලා වර්ෂය තුල දී සකස් කරන ලදී.

i. ශ්‍රී ලංකීය විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා හඳුන්වාදීමේ වැඩසටහන
ii. පුහුණුකරුවන් පුහුණු කිරීම - අධ්‍යයන කාර්යමණ්ඩලය වෙනුවෙන් උසස් අධ්‍යාපනය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය
iii. පර්යේෂණ ප්‍රවීණතා ප්‍රවර්ධනය
iv. අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා අත්‍යවශ්‍ය මෘදු කුසලතා (විධායක ශ්‍රේණි, ලේකම් කාර්ය මණ්ඩලය, කාර්මික කාර්යමණ්ඩල සහ ලිපිකරු ශ්‍රේණි)
v. විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය සඳහා ක්‍රියාකාරී ඉංග්‍රීසි භාෂාව - ගුරු අත්පොත 1 කොටස
vi. විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය සඳහා ක්‍රියාකාරී ඉංග්‍රීසි භාෂාව - ගුරු අත්පොත 11 කොටස
vii. ප්‍රථම උපාධි අධ්‍යයන පාඨමාලා සඳහා විෂය මාලා සංවර්ධනය

මෙම අත්පොත් පදනම් කරගෙන HETC ව්‍යාපෘතියේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මානව සම්පත් සංවර්ධන ඒකකයේ සහාය ඇතිව කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන විසින් විශ්වවිද්‍යාලයන්හි පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

සෑම කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයක් විසින්ම අධ්‍යයන කාර්යමණ්ඩල සඳහා හඳුන්වාදීමේ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. සලකා බලන ලද වර්ෂය අවසානයේ දී අනධ්‍යයන කාර්යමණ්ඩලයේ විධායක ශ්‍රේණි සඳහා පුළුල් හඳුන්වාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පැවතුන අතර එය 2013 වර්ෂයේ දී ආරම්භ වීමට නියමිතව තිබුණි.

එසේම කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ආයතනය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ව්‍යාපාර කළමනාකරණ ජාතික ආයතනය වැනි ආයතන සමග එක්ව විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය සඳහා විශේෂයෙන් සැකසූ පුහුණු වැඩසටහන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මානව සම්පත් සංවර්ධන ඒකකය සහ HETC ව්‍යාපෘතිය විසින් සංවිධානය කරමින් පැවතුනි.

2011 වර්ෂයේ දී කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන විසින් එම මධ්‍යස්ථානවල කාර්යමණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය, උපකරණ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම සහ කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාගත් අරමුදල් එළදායී ලෙස භාවිතා කර ඇත. එසේම පළමු වටයේ දී ලබාදෙන ලද අරමුදල් මගින් දැනටමත් ආරම්භ කරන ලද ක්‍රියාකාරකම් / වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාමට සහ 2012 වර්ෂයේ දී කාර්යමණ්ඩල සංවර්ධන නව ක්‍රියාකාරකම් නිර්මාණය/ආරම්භ කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දළ වශයෙන් රුපියල් මිලියන 65 ක් වෙන් කොට මුදා හැර ඇත.

8.8 විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා ශිෂ්‍යත්ව, අධි ශිෂ්‍යත්ව, පර්යේෂණ ප්‍රතිපාදන සහ අනෙකුත් මූල්‍ය සහාය ලබාදීම

විශ්වවිද්‍යාල පද්ධතිය තුල පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම සහ ශක්තිමත් කිරීම පිණිස දේශීය හෝ විදේශීය වශයෙන් තම උසස් අධ්‍යාපනය හැදෑරීමට විශේෂයෙන්ම කණිෂ්ඨ ආචාර්යවරුන්ට අවස්ථාව ලබාදීම සඳහා අධ්‍යයන කර්යමණ්ඩලයට පහසුකම් ලබාදීමට සහ අනුබල දීමට කැපවූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රතිපත්තියෙහි පිහිටා වඩවඩාත් අරමුදල් ලබාදීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පසුගිය වසර කීපය තුල මහත් ප්‍රයත්නයක් දරන ලදී. එකී අරමුණ ළගාකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී පහත සඳහන් ප්‍රතිපාදන ලබාදෙන ලදී.

(i) දර්ශණශූරී පර්යේෂණ උපාධි සඳහා දේශීය පර්යේෂණ ප්‍රතිපාදන

පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගැනීම සඳහා පවත්නා අවස්ථා වැඩිකරනු වස් පර්යේෂණ උපාධි සඳහා දේශීය පර්යේෂණ ප්‍රතිපාදන යටතේ 2012 වර්ෂයේ දී විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ සාමාජිකයන් 28 ට රුපියල් 5,621,006/05 ක ප්‍රතිපාදන ලබාදීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කටයුතු කරන ලදී.

	ප්‍රදාන ලාභීන් සංඛ්‍යාව 2012	2008	2009	2010	2011	2012
		ප්‍රමාණය රුපියල්	ප්‍රමාණය රුපියල්	ප්‍රමාණය රුපියල්	ප්‍රමාණය රුපියල්	ප්‍රමාණය රුපියල්
2008 කණ්ඩායම	02	5,950,000	1,075,000	500,000	2,750,182	550,000.00
2009 කණ්ඩායම	11		5,350,125	7,273,900	1,381,700	2,540,187.05
2011 කණ්ඩායම	15				2,530,000	2,530,819.00
එකතුව	28	5,950,000	6,425,125	7,773,900	6,661,882	5,621,006.05

(ii) 2012 වර්ෂයේ එක්සත් රාජධානිය විසින් අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා ලබාදෙන පොදුරාජ්‍ය මණ්ඩලීය අධි ශිෂ්‍යත්ව

පොදුරාජ්‍ය මණ්ඩලීය අධි ශිෂ්‍යත්ව සඳහා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල වලින් ආචාර්යවරුන් 19 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද අතර පොදුරාජ්‍ය මණ්ඩලීය සංගමයෙන් අපේක්ෂකයන් 14 ක් තෝරා ගන්නා ලදී. පසුගිය වසර 03 තුල විශ්වවිද්‍යාල වල ශිෂ්‍යත්වලාභීන් බෙදී ඇති ආකාරය පහත සඳහන් පරිදි වේ.

පොදුරාජ්‍ය මණ්ඩලීය අධ්‍යයන කාර්යමණ්ඩල අධි ශිෂ්‍යත්ව			
විශ්වවිද්‍යාලය	**2010**	**2011**	**2012**
කොළඹ	-	-	3
පේරාදෙණිය	1	3	4
කැළණිය	1	-	-
ශ්‍රී ජයවර්ධනපුර	2	-	1
මොරටුව	-	-	-
යාපනය	-		1
රුහුණ	1	2	2
විවෘත	1	2	1
නැගෙනහිර	-	-	-
අග්නිදිග	-	-	-
රජරට	-	-	-
සබරගමුව	2	3	2
වයඹ	1	1	-
එකතුව	**09**	**1**	**14**

(iii) **2012 වර්ෂයේ එක්සත් රාජධානිය විසින් අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා ලබාදෙන පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්වය**

පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව සඳහා ආචාර්යවරුන් 07 ක් විශ්වවිද්‍යාලයීය ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද අතර පොදුරාජ්‍ය මණ්ඩලීය සංගමයෙන් ඒ සඳහා එක් අපේක්ෂකයෙක් තෝරා ගන්නා ලද අතර විස්තර පහත දක්වා ඇත.

නම	**විශ්වවිද්‍යාලය**
කනපති ගජපති මයා	යාපනය විශ්වවිද්‍යාලය

8.9 **විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩල සඳහා ගුවන් ගමන් ගාස්තු සඳහා මූල්‍ය සහාය**

සමාලෝචිත වර්ෂයේ දී විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලයට පශ්චාත් උපාධි ලබාගැනීම සඳහා විදේශගත වීමේදී ඔවුන්ට අවශ්‍ය ගුවන් ගමන් ගාස්තු වශයෙන් රුපියල් 7,046,661.32 ක් ප්‍රදානය කර ඇත. එම මුදල විශ්වවිද්‍යාල අතර බෙදී ඇත්තේ පහත සඳහන් ආකාරයටය.

විශ්වවිද්‍යාල	**අවසර ලබා දෙන ලද ඉල්ලීම් ගණන**		**ප්‍රමාණය (රුපියල්)**
	අභ්‍යන්තර	**බාහිර**	
කොළඹ විශ්වවිද්‍යාලය	4	6	595,300.00
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	7	10	1,205.671.70
යාපනය විශ්වවිද්‍යාලය	3	2	277.931.00
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	3	8	1,312,072.62
රුහුණ විශ්වවිද්‍යාලය	2	7	1,096,049.00
මොරටුව විශ්වවිද්‍යාලය	1	4	374,201.00
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	1	3	325,200.00
කැළණිය විශ්වවිද්‍යාලය	5	6	893,496.00
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	-	1	47,550.00
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	-	8	150,000.00
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	5	2	264,760.00
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	2	3	338,550.00
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	-	3	75,730.00
ත්‍රිකුණාමල මණ්ඩපය	-	1	38,530.00
ශ්‍රීපාලි මණ්ඩපය	-	1	51,620.00
එකතුව	33	65	**7,046,661.32**

8.10 **ප්‍රායෝගික පුහුණුව ලබාදීම.**

2007-03-29 දිනැති අංක 03/2007 දරන ආයතන චක්‍රලේඛ ලිපිය මගින් සංශෝධනය කරන ලද අංක 10/2002 ආයතන චක්‍රලේඛ ලිපිය මගින් අදාල කර ගන්නා ලද 2000-07-19 දිනැති අංක 12/2000 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණය ප්‍රකාර, 2012 වර්ෂයේ දී උසස් අධ්‍යාපන ආයතනයන්හි ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා පුහුණු වන්නන් 900 කට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

විශ්වවිද්‍යාලය/ ආයතනය	**පුහුණුවන්නන් සංඛ්‍යාව**
කොළඹ විශ්වවිද්‍යාලය	94
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	221
කැළණිය විශ්වවිද්‍යාලය	44
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	51
මොරටුව විශ්වවිද්‍යාලය	27
යාපනය විශ්වවිද්‍යාලය	146
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	12

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	58
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	17
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	08
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	75
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	12
කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	03
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි විද්‍යා ආයතනය	02
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	17
මානව සම්පත් අභිවර්ධන ආයතනය	04
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	16
කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක විද්‍යායතනය	11
ගම්පහ වික්‍රමආරච්චි ආයුර්වේද විද්‍යායතනය	13
විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	05
තාක්ෂණ විද්‍යා ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය	04
ජෛව රසායන, අනුක ජෛව විද්‍යා හා ජෛව තාක්ෂණ ආයතනය	02
ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයනායතනය	09
ශ්‍රීපාලි මණ්ඩපය	12
ත්‍රිකුණාමල මණ්ඩපය	56
වවුනියා මණ්ඩපය	11
එකතුව	**930**

9 යටිතල පහසුකම් සංවර්ධනය

2012 වර්ෂයේ දී නව ඉදිකිරීම් හා නොනිම් වැඩ ව්‍යාපෘති, පුනරුත්ථාපන ව්‍යාපෘති, අත්පත් කර ගැනීම්, අලුතෙන් ස්ථාපිත විශ්වවිද්‍යාලවල යටිතල පහසුකම් ව්‍යාපෘති සහ සිසුන්ගේ ශක්‍යතා ගොඩනැගීම සඳහා රුපියල් මිලියන 5,779 ක මුළු මුදලක් වෙන් කරන ලදී. නමුත් මහා භාණ්ඩාගාරය විසින් පසුව නිර්දේශ කරන ලද්දේ රුපියල් මිලියන 5,504 ක් පමණි. කෙසේ වෙතත් මහා භාණ්ඩාගාරය විසින් පනවන ලද විවිධ සීමා කිරීම් සහ මුදල් නිදහස් නොකිරීමේ ක්‍රියාවලිය අනුව අවසන් වශයෙන් විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන සඳහා 2012 වර්ෂය තුල නිදහස් කර තිබුනේ රුපියල් මිලියන 4,361 ක මුදලක් පමණි.

එම වර්ෂය තුල දී විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විසින් නව ව්‍යාපෘති යෝජනා 20 ක් කොමිෂන් සභාව වෙත එවා තිබූ අතර වසර අවසානය වන විට මනා නිරීක්ෂණයෙන් සහ ඇගයීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් යෝජනා *22 ක් පමණක් අනුමත කර තිබිණි. 2012 වර්ෂයේ දී ජාතික සැලසුම්කරන දෙපාර්තමේන්තුව විසින් නව ව්‍යාපෘති වලින් *07 ක් සඳහා අනුමැතිය ලබාදෙන ලද අතර පෙර වසර වලදී ලබා ගන්නා ලද ව්‍යාපෘති යෝජනා ද ඇතුළුව ව්‍යාපෘති *11 ක් මෙම වසරේ දී කැබිනට් මණ්ඩලය මගින් අනුමත කරන ලදී. මෙම ව්‍යාපෘති 11 සඳහා වන මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 4,854.87 ක් වේ. 2012 වසරේ දී විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නව ඉදිකිරීම් ව්‍යාපෘති #*11 ක් ආරම්භ කළ අතර සැලසුම් සහ ඉදි කිරීම් ක්‍රියාවලියේ විවිධ මට්ටමෙන් ව්‍යාපෘති 44 ක් කෙරෙමින් පැවති අතර එහි වටිනාකම රුපියල් මිලියන 13,672.40 ක් විය. සමාලෝචිත වර්ෂයේ දී ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 2,778.30 ක් වටිනා ව්‍යාපෘති #*13 ක් අවසන් කොට විශ්වවිද්‍යාල පද්ධතියට ලබා දෙන ලදී. සමාලෝචිත වර්ෂයේදී අවසන් කරන ලද ව්‍යාපෘති ලේඛණයට අමතරව කුවේට් අරමුදල අදියර-1 යටතේ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සඳහා වන ව්‍යාපෘතිය අවසන් කර විශ්වවිද්‍යාලය වෙත බාර දෙන ලදී. අදාල තොරතුරු පහත පරිදි වේ.

	2010		2011		2012	
	ව්‍යාපෘති ගණන	**මුළු වටිනාකම (රුපි මිලි)**	**ව්‍යාපෘති ගණන**	**මුළු වටිනාකම (රුපි මිලි)**	**ව්‍යාපෘති ගණන**	**මුළු වටිනාකම (රුපි මිලි)**
වි.වි.ප්‍ර.කො.ස. විසින් ලබා ගන්නා ලද ව්‍යාපෘති යෝජනා ගණන	39	12,671.06	31	5,535.40	20	3,755.83
වි.වි.ප්‍ර.කො.ස. විසින් අනුමත ව්‍යාපෘති යෝජනා ගණන	*11	3,744.61	*24	8,069.00	*22	2,512.35
ජාතික සැලසුම් සඳහා ලබා දෙන ලද ව්‍යාපෘති ගණන	*12	5,913.36	*24	7,762.02	*23	3,306.93
ජාතික සැලසුම් මගින් අනුමත ව්‍යාපෘති ගණන	*10	1,499.64	*15	4,351.8	*07	3,259.13

කැබිනට් මණ්ඩලය මගින් අනුමත ව්‍යාපෘති ගණන	*12	1,583.8	*12	1,317.47	*11	4,854.87
වසර තුලදී ආරම්භ කරන ලද ව්‍යාපෘති ගණන	*14	2,799.4	#*17	2,496.9	#*11	1,514.70
කෙරෙමින් පැවති ව්‍යාපෘති ගණන (අඛණ්ඩ)	*60	13,637.95	#*41	14,662.55	#*44	13,672.40
අවසන් කරන ලද ව්‍යාපෘති ගණන	*22	2,780.6	#*12	2,223.45	#*13	2,778.30

* පෙර වසර වලදී ලබාදෙන ලද ව්‍යාපෘති යෝජනා ද ඇතුළුව
# ව්‍යාපෘති වල භෞතික තත්ත්වය පමණක් සලකා බලන ලදී.

10 තොරතුරු තාක්ෂණ සංවර්ධනය

විශ්වවිද්‍යාලයන්හී තොරතුරු තාක්ෂණ පාලනය

තොරතුරු තාක්ෂණ පාලනය, ආයතන පාලනයේ කොටසක් වන අතර එය ආයතනයේ පවතින තොරතුරු තාක්ෂණ ආයතනයේ උපාය මාර්ගයන් සහ අරමුණු සඳහා සහාය දැක්වීම සනාථ කරන සංකල්පයක් ලෙස ඉස්මතු වී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතනික සැලැස්ම සමග අනුගත වෙමින් විශ්වවිද්‍යාලයන් හි තොරතුරු තාක්ෂණ පාලනයේ තත්ත්වය හඳුනා ගැනීමට සහ විධිමත් පාලනයක් තුළින් විශ්වවිද්‍යාලයන්හි තොරතුරු තාක්‍ෂණය භාවිතයේ ඵලදායීතාව සහ කාර්යක්‍ෂමතාව වැඩි දියුණු කරනු වස් තොරතුරු තාක්‍ෂණය පාලනය පිළිබඳව අවබෝධයක් ඇති කිරීම සඳහා සමීක්‍ෂණයක් පවත්වන ලදී.

දෘෂ්‍ය සම්මන්ත්‍රණ පහසුකම් වැඩි දියුණු කිරීම

විශ්ව විද්‍යාල සමග වඩා යහපත් සන්නිවේදනයක් හරහා කොමිෂන් සභාවේ කාර්යක්‍ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා විසඳුමක් ලෙස 2008 දී කොමිෂන් සභාවේ දෘෂ්‍ය සම්මන්ත්‍රණ පහසුකම් ස්ථාපිත කරන ලද අතර කොමිෂන් සභා රැස්වීම් ශාලවේ තොරතුරු තාක්‍ෂණ/දෘෂ්‍ය සම්මන්ත්‍රණ පහසුකම් ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව ඉහළ නැංවීමට කටයුතු කරන ලදී.

කොමිෂන් සභා තත් ප්‍රදේශ ජාලය (LAN) දියුණු කිරීම

2001 වර්ෂයේ දී කොමිෂන් සභාවේ දී ක්‍රියාත්මක කරන ලද තත් ප්‍රදේශ ජාලය මගින් සන්නිවේදනය සඳහා වඩා යහපත් රුකුලක් ලබාදීම සඳහා එය නවීන තාක්ෂණය යොදා නැවත ප්‍රතිස්ථාපනය 2012 වර්ෂය තුල කරන ලදී. මෙම නව ජාලය මගින් කොමිෂන් සභාවේ අවශ්‍යතාවයන් තවත් වසර 07 ට වඩා වැඩි කාලයක් පුරා සපුරාලීමේ හැකියාව ඇත.

පුස්තකාල සඳහා තොරතුරු තාක්ෂණ අරමුදල් බෙදා හැරීම

පුස්තකාලවල තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ අරමුදල් සංවර්ධනය සඳහා පහත සඳහන් පරිදි විශ්වවිද්‍යාල වෙත අරමුදල් බෙදා හරින ලදී බෙදා හරින ලද මුළු ප්‍රමාණය රුපියල් මිලියන 8 කි.

උසස් අධ්‍යාපන ආයතනය	ව්‍යාපෘති	ප්‍රමාණය (රුපියල්)
අග්නිදිග	පුස්තකාල ස්වයංක්‍රියකරණය - 2012	1,000,000
වයඹ	පුස්තකාල ස්වයංක්‍රියකරණය - 2012	1,000,000
කැළණිය	ටැටිල් ටේප් පුස්තකාල ආරක්‍ෂණ පද්ධතිය සවි කිරීම	1,000,000
ශ්‍රී ජයවර්ධනපුර	විශ්වවිද්‍යාල පුස්තකාල සඳහා තොරතුරු තාක්‍ෂණ ප්‍රතිපාදන	1,000,000
මොරටුව	විශ්වවිද්‍යාල පුස්තකාල සඳහා තොරතුරු තාක්‍ෂණ ප්‍රතිපාදන	1,000,000
සෞන්දර්ය කලා	විශ්වවිද්‍යාල පුස්තකාල සඳහා තොරතුරු තාක්‍ෂණ ප්‍රතිපාදන	1,000,000
කොළඹ	විශ්වවිද්‍යාල පුස්තකාල සඳහා තොරතුරු තාක්‍ෂණ ප්‍රතිපාදන	1,000,000
යාපනය	විශ්වවිද්‍යාල පුස්තකාල සඳහා තොරතුරු තාක්‍ෂණ ප්‍රතිපාදන	1,000,000
	එකතුව	**8,000,000**

තොරතුරු තාක්ෂණ අරමුදල් වෙන් කිරීම / බෙදා හැරීම -2012

තොරතුරු තාක්‍ෂණ පහසුකම් වැඩිදියුණු කිරීමට සහ ශක්තිමත් කිරීමට පහත සඳහන් පීඨ වෙත අරමුදල් බෙදා හරින ලදී.

උසස් අධ්‍යාපන ආයතනය	ව්‍යාපෘති	ප්‍රමාණය (රුපියල්)
කොළඹ	පරිගණක සහ තොරතුරු තාක්‍ෂණ පරිසරයක් නිර්මාණය කිරීම – නීති පීඨය 2,915,000/- සහ ජාලකරණ පහසුකම් සැපයීම – කළමණාකරණ සහ මූල්‍ය පීඨය 3,000,000/-	5,915,000
කොළඹ	තොරතුරු තාක්‍ෂණ IT (යොමුව QIG 2011) 24.09.2012 දින මිලියන 12 ට සංශෝධනය කරන ලදී	12,000,000
ශ්‍රී ජයවර්ධනපුර	FMSC හි ITRC දී තොරතුරු තාක්‍ෂණ සම්පත් දියුණු කිරීම	6,000,000
පේරාදෙණිය	දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය සඳහා තොරතුරු තාක්‍ෂණය පදනම් කරගත් සම්පත් මධ්‍යස්ථානය සඳහා	2,436,000
රුහුණ	පරිගණක මිලදී ගැනීම සඳහා අතිරේක අරමුදල්	3,750,000
රුහුණ	ඉංජිනේරු පීඨය සඳහා පරිගණක සහ ජාල උපාංග මිල දී ගැනීමට	8,000,000
වයඹ	විශ්වවිද්‍යාල පුළුල් ජාලය දියුණු කිරීම	3,915,000
වවුනියා	වවුනියා මණ්ඩපය සඳහා තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථාන ස්ථාපනයන කිරීම	15,000,000
පුරා විද්‍යා	Wi-fi පද්ධතිය සවි කිරීම සඳහා	750,000
	එකතුව	**50,016,000**

11 උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතිකය

2009 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙනම අංශයක් ලෙස ස්ථාපිත කරන ලද තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලය, තත්ත්ව සහතික සහ ප්‍රතීතනය පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශ සහ මගපෙන්වීම යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත විය.

- තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලයේ ප්‍රධානතම කර්යභාරයක් වනුයේ, උසස් අධ්‍යාපන ආයතනයන්හි ගුණාත්මකභාවය සහ ඒවායේ අධ්‍යයන වැඩසටහන්වල ප්‍රමිතීන් සමාලෝචනය කිරීම සහ එහි ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම යි. මේ සඳහා තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලය මගින් ආයතනික සමාලෝචන, විෂය / පාඨමාලා සමාලෝචන සහ පුස්තකාල සමාලෝචන සඳහා වන බාහිර තත්ත්ව ඇගයීම් පවත්වනු ලබයි.

  සමාලෝචිත වර්ෂයේ දී තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලය විසින් බාහිර තත්ත්ව ඇගයීම් යටතේ ආයතනික සමාලෝචන 10 ක් ද, විෂය/ පාඨමාලා සමාලෝචන 07 ක් ද, පුස්තකාල සමාලෝචන 01 ක් ද සිදුකර ඇත.

- මීට අමතරව විශ්වවිද්‍යාලයන්හි ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි සහ බාහිර උපාධි පාඨමාලා සහ නව ආයතන පිළිබඳ ව පහත සඳහන් මූලික ඇගයීම් සිදුකරන ලදී.

විශ්වවිද්‍යාලය	ප්‍රථම උපාධි පාඨමාලා	පශ්චාත් උපාධි පාඨමාලා	බාහිර උපාධි පාඨමාලා	නව ආයතන	වෙනත්
කොළඹ විශ්වවිද්‍යාලය	-	13	5	-	-
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	-	12	1	1	-
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	-	4	-	-	1
කැළණිය විශ්වවිද්‍යාලය	1	11	1	-	1

මොරටුව විශ්වවිද්‍යාලය	1	15	1	-	-
යාපනය විශ්වවිද්‍යාලය	1	4	-	-	-
රුහුණ විශ්වවිද්‍යාලය	-	7	-	-	-
නැගෙනහිර විශ්වවිද්‍යාලය	1	4	-	-	-
අග්නිදිග විශ්වවිද්‍යාලය	-	1	-	-	-
රජරට විශ්වවිද්‍යාලය	-	1	-	-	-
සබරගමුව විශ්වවිද්‍යාලය	1	1	-	-	-
වයඹ විශ්වවිද්‍යාලය	-	-	1	-	-
විවෘත විශ්වවිද්‍යාලය	2	2	-	-	2
සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය	-	3	1	1	-
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	-	2	-	-	-
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	-	1	-	-	-
ගම්පහ වික්‍රමආරච්චි ආයතනය	-	1	-	-	-
රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනය	-	-	-	-	23
එකතුව	**7**	**82**	**10**	**2**	**27**

- තත්ත්ව සහතික කවුන්සිලය විසින් 2012 වර්ෂයේ දී උසස් අධ්‍යාපන ආයතනයන් හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ජාතික, අන්තර්ජාතික සහ විශ්වවිද්‍යාල/පීඨ මට්ටමෙන් වැඩමුළු 274 ක් පවත්වන ලදී. මෙම වැඩමුළු මගින් උසස් අධ්‍යාපන ආයතනයන්හි තත්ත්ව සහතික රාමුව, සම්මාන සහ සුදුසුකම් රාමුව, විශ්වවිද්‍යාලයන්හි අභ්‍යන්තර තත්ත්ව සහතිකය, විෂය සමාලෝචකයන් සඳහා වන පුහුණු වැඩසටහන්, විශ්වවිද්‍යාලයන්හි විෂය සමාලෝචන ක්‍රියාවලිය, විෂය නිර්දේශ පුනරීක්ෂණය සහ ප්‍රතිසංස්කරණය, ශිෂ්‍ය ප්‍රතිචාර සහ සහෘදයින්ගේ නිරීක්ෂණයන් සහ නව්‍යකරණ සහ අන්තර් සහභාගී සන්නිවේදන ඉගෙනුම් විධික්‍රම වැනි විවිධ විෂය ක්ෂේත්‍රයන් ආවරණය කරනු ලැබීය.

- අභ්‍යන්තර තත්ත්ව සහතික ක්‍රමවේදය තුළින් එකම ආයතනය තුළ සේවය කරන සේවකයන් එකිනෙකා සමග දැනුම බෙදා හදා ගැනීමට සහ එකිනෙකාගෙන් ඉගෙන ගැනීමට අවකාශ සලසනු ඇතැයි ද, යහපත් පුරුදු ප්‍රකාශයට පත්කරනු ඇතැයි ද, එකිනෙකාගේ ජයග්‍රහණ සහ දායකත්වය අගයනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. එසේ ම අභ්‍යන්තර තත්ත්ව සහතික ක්‍රමවේදය මගින් ආයතනය සඳහා ඇති වගකීම පිළිබඳ හැඟීම සහ ක්‍රියාවලිය පිළිබඳව නව වැටහීමක් ආයතනය හරහා නිර්මාණය කරනු ඇත.

  එසේ හෙයින් විශ්වවිද්‍යාලවල අන්තර් තත්ත්ව සහතික ක්‍රියාකාරම් ශක්තිමත් කිරීම සඳහා අන්තර් තත්ත්ව සහතික අත්පොතක් පිළියෙල කොට ඇති අතර එය මේ වන විටත් QACC වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කොට ඇත.

- තත්ත්ව සහතික සහ ප්‍රතීතන කවුන්සිලයේ ප්‍රධානතම වගකීමක් වනුයේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන (රාජ්‍ය සහ පෞද්ගලික) සහ උපාධි පාඨමාලා ප්‍රතීතනය කිරීමයි. උසස් අධ්‍යාපනයේ ප්‍රතීතනය යනු පොදු වගකීම සහ අධ්‍යයන ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වන ස්වයං ඇගයීම සහ සහෘදයින්ගේ ඇගයීම මත පදනම් වූ ආයතනික ක්‍රියාවලියකි. මේ සඳහා පහත සඳහන් ක්ෂේත්‍රයන් තත්ත්ව සහතික කවුන්සිලය මගින් හඳුනාගෙන ඇත.

  1. කෘෂිකර්මය පශු වෛද්‍ය විද්‍යා සහ පශු සම්පත්
  2. වාණිජ්‍ය සහ කළමනාකරණ
  3. කලා, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා අධ්‍යාපනය, නීතිය, ලලිත, කලා
  4. ඉංජිනේරු විද්‍යා, ගෘහනිර්මාණ ශිල්පය, තොරතුරු තාක්ෂණය සහ භූවිඥාපන
  5. වෛද්‍ය විද්‍යා, දන්ත වෛද්‍ය විද්‍යා සහ සම සෞඛ්‍ය විද්‍යා
  6. විද්‍යා සහ සාගර විද්‍යා

එසේම ප්‍රතිතන වැඩසටහන් සඳහා අවශ්‍ය නිර්නායක තත්ත්ව සහතික සහ ප්‍රතිතන කවුන්සිලය විසින් හඳුනාගෙන ඇති අතර ප්‍රතිතන ක්‍රියාවලිය සහ ප්‍රතිතන අත්පොත පිළියෙළ කිරීම සඳහා වැඩමුළු 03 ක් සමාලෝචිත වර්ෂයේ දී පවත්වන ලදී.

- බාහිර තත්ත්ව සහතිකයේ අපේක්ෂිත ප්‍රතිඵල ලගා කර ගැනීමේ ක්‍රමවේදයක් ලෙස ජාලගත ප්‍රවේශයක් සංවර්ධනය කරන ලදී. මෙම පද්ධතිය මගින් පහසුවෙන් පරිශීලනය කළ හැකි, බාහිර තත්ත්ව සහතික පිළිබඳ නිරවද්‍ය සහ යාවත්කාලීන තොරතුරු ලබාදෙන අතර පරිගණක ඉල්ලුම්පත් ප්‍රශ්නාවලි හරහා ප්‍රතිචාර ලබාදී ඇත. මෙම තොරතුරු ලබාගැනීමේ පහසුව මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය තීරණ ගැනීමට බලධාරීන්ට පහසු කර ඇත.

  මෙම පද්ධතියට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා එය QAAC ප්‍රධාන වෙබ් අඩවිය වෙත සම්බන්ධ කර ඇති අතර එහි ඇති විශිෂ්ඨ තත්ත්වය පවත්වා ගෙන යාමට අවශ්‍ය ප්‍රතිචාර පද්ධතිය වඩාත් ශක්තිමත් කර බාහිර තත්ත්ව ඇගයීම සඳහා වන ජාලගත නිරීක්ෂණයක් සහ ඇගයීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම උසස් අධ්‍යාපන තත්ත්ව සහතික ක්ෂේත්‍රය සඳහා වැදගත් සන්ධිස්ථානයක් වනු ඇත.

2012 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයන්හි තත්ත්ව සහතික ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය

ක්‍රියාකාරම්	2012 වර්ෂය තුළ	එකතුව
1. බාහිර තත්ත්ව ඇගයීම්		
අ. විෂය/වැඩසටහන් සමාලෝචන	**07**	**309**
2. වැඩසටහන ප්‍රතිතන		
කෘෂිකර්මය කළමනාකරණය සහ කලා ක්ෂේත්‍රයන් සඳහා ප්‍රතිතන අත්පොත් පිළියෙළ කිරීමේ ජාතික වැඩමුළු	**03**	**05**
3. විෂය මිණුම් ලකුණු ප්‍රකාශනය	**03**	**41**
4. දැනුවත් කිරීමේ වැඩසටහන	**03**	**258**
5. වැඩමුළු	**17**	**274**
6. ප්‍රකාශන		
අ. පීඨ සංයුක්ත වාර්තා	**01**	**60**
ආ. අන්තර් තත්ත්ව සහතික අත්පොත	**ප්‍රකාශිත විය**	**ප්‍රකාශයට පත් කරන ලදී (QAAC වෙබ් අඩවිය)**
ඇ. පර්යේෂණ ලිපි	**02**	**09**
ඉ. බාහිර තත්ත්ව ඇගයීම් සඳහා පුහුණු වැඩපිළිවෙල සැකසීම.	**සැකසීම**	**ප්‍රකාශයට පත් කරන ලදී (APQN වෙබ් අඩවිය)**
7. සමාලෝචකයන් පුහුණු කිරීම	**04**	**621**
8. විශ්වවිද්‍යාලවල බාහිර තත්ත්ව ඇගයීම් සඳහා ජාලගත නිරීක්ෂණයන් සහ ඇගයීම් පද්ධතිය	සංවර්ධනය කර ඇති අතර ක්‍රියාවට නැංවීමට නියමිතයි	
9.ආසියා ශාන්තිකර තත්ත්ව ජාලය ප්‍රතිතනය (ASPN)		
10.ජාත්‍යන්තර සමාලෝචන	**02**	**02**

12 ශිෂ්‍යයන් සම්බන්ධ කටයුතු

විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය

රාජ්‍ය විශ්වවිද්‍යාලවල ලියාපදිංචි වන සිසුන් සඳහා වන මාර්ගෝපදේශයක් ලෙස මෙන්ම විශ්වවිද්‍යාල සහ සිසුන් අතර පවත්නා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාශයට පත් කරන ලේඛණයක් ලෙස ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් "විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය" පිළියෙළ කරන ලදි. රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි මනා ක්‍රියාකාරීත්වය සඳහා වන සෑම පරදු දරන්නන්ගෙන්ම අපේක්ෂිත කැපවීම මෙමගින් අවධාරණය කරන අතර එය ආචාර්යවරුන්ට පරිපාලන සහ සහාය කාර්යමණ්ඩලයේ මෙන්ම මහජනතාව වෙත මාර්ගෝපදේශනයක් ලෙස එය ක්‍රියාකරයි. විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රඥප්තිය මූලිකවම සිසුන්ට ඔවුන්ගේ සහයෝගය සහ දායකත්වය, රාජ්‍ය විශ්වවිද්‍යාලයන් හි අත්‍යවශ්‍ය භූමිකාවේ යෙදීමට, ආයතනයේ සාරධර්ම හා මූලධර්ම ආරක්ෂා කිරීමට සහ පවත්වාගෙන යාමට අවශ්‍ය සහාය ලබාදීම පිණිසත් සිසුන් උනන්දු කරවයි.

13 විශ්වවිද්‍යාල සිසුන්ට මූල්‍ය ආධාර ලබාදීම

13.1 හැඳින්වීම

මූල්‍යමය වශයෙන් විශ්වවිද්‍යාල සිසුන්ට ආධාර ලබා දෙන ක්‍රම 3 ක් ඇත. ඒවා නම්;

මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය
විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර ක්‍රමය
පරිත්‍යාග ශිෂ්‍යත්ව ක්‍රමය

මෙම ක්‍රම තුනෙන් මහපොළ ශිෂ්‍යත්ව සහ පරිත්‍යාග ශිෂ්‍යත්ව සඳහා සිසුන් තෝරා ගැනීම වාර්ෂිකව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ද විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර ක්‍රමය අදාල විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන විසින් ද සිදු කෙරේ.

(1) මහපොළ ශිෂ්‍යත්ව

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදල මගින් මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ කාණ්ඩ දෙකක ශිෂ්‍යත්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහයෝගය සහිතව ප්‍රදානය කරනු ලැබේ. ඒවා නම් මහපොළ උසස් අධ්‍යාපන කුසලතා ශිෂ්‍යත්ව සහ මහපොළ උසස් අධ්‍යාපන සාමාන්‍ය ශිෂ්‍යත්ව වේ.

(2) ශිෂ්‍යාධාර සහ මහපොල ශිෂ්‍යත්ව ගෙවීම්

2012 වර්ෂය තුල දී ශිෂ්‍යාධාර සහ මහපොල ශිෂ්‍යත්ව වෙනුවෙන් මහා භාණ්ඩාගාරය දරනු ලැබූ පිරිවැය සහ පරිත්‍යාග ශිෂ්‍යත්ව සඳහා පහත දැක්වෙන පරිදි මූල්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

සිසුන් සඳහා මූල්‍ය ආධාර වර්ගය	සිසුන් සංඛ්‍යාව	ගෙවන ලද මුළු මුදල රුපි (මිලි.)
මහපොළ	33,089	101.46
ශිෂ්‍යාධාර	23,446	283.40
පරිත්‍යාග ශිෂ්‍යත්ව	35	1.12

(3) පරිත්‍යාග ශිෂ්‍යත්ව

ඉහතින් දක්වන ලද ශිෂ්‍යත්ව ප්‍රධානයන්ට අමතරව පහත සඳහන් පරිත්‍යාග ශිෂ්‍යත්ව ප්‍රධානයන්ද සමාලෝචිත වර්ෂයේ දි සිදුකෙරිනි.

අ) මිට්සුබිෂි සමාගමේ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මිට්සුබිෂි සමාගම විසින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැම්මේ අරමුණින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි.

ඒ අනුව ප්‍රදානය කරන ලද අරමුදලින් කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨය සඳහා සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ වාණිජ්‍ය පීඨය සඳහා මෙම ශිෂ්‍යත්ව අරමුදල යටතේ ශිෂ්‍යත්ව 30 ක් පිරිනමන ලදී. (රුපියල් 4000 බැගින් වූ වාරික 12 න් ගෙවා නිම කිරීම සඳහා) මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රුපියල් 48,000 කි. මෙම ශිෂ්‍යත්වය තවත් වසරකට දීර්ඝ කිරීමේ හැකියාව ඇතිව වසරක කාලයක් සඳහා වේ.

ආ) පොලිස් ම.සු.ස. යහසාධක යෝජනා ක්‍රමය

ඉංජිනේරු, වෛද්‍ය විද්‍යා හා කෘෂි විද්‍යා යන විෂය ධාරාවන් සඳහා මොරටුව පේරාදෙණිය සහ වයඹ විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වූ සිසුන් වෙත 2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා පොලිස් ම.සු.ස. යහ සාධක යෝජනා ක්‍රමය යටතේ අරමුදල් ලබාදෙන ශිෂ්‍යත්ව ක්‍රමය මගින් ශිෂ්‍යත්ව 03 ක් පිරිනමන ලදී.

මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රුපියල් 20000 ක් වන අතර, එය රුපියල් 2000 බැගින් වූ මාසික වාරික 10 න් සම්පූර්ණ පාඨමාලා කාලය ආවරණය වන පරිදි ගෙවනු ඇත.

ඇ) හිරාන් තිලකරත්න පර්යේෂණ ප්‍රදාන

2012 මාර්තු 27 දින කොමිෂන් සභා සභාපති මහාචාර්ය ගාමිණී සමරනායක මහතාගේ ප්‍රධානත්වයෙන් සහ ශිෂ්‍යත්ව දායකයා වන අර්ඩ්ලි තිලකරත්න මහතාගේ සහභාගිත්වය ඇතිව 2012 කැපී පෙනෙන පශ්චාත් උපාධි පර්යේෂණ සඳහා වන හිරාන් තිලකරත්න විශේෂ ත්‍යාග පිරිනැමීමේ උත්සවය කොමිෂන් සභාවේ දී පවත්වන ලදී.

විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩල පර්යේෂණ ආයතන කාර්යමණ්ඩලවල සහ වෘත්තීය ආයතනවල සාමාජිකයන් විසින් සිදුකරන ලද පශ්චාත් උපාධි පර්යේෂණ සඳහා ගෞරව දැක්වීම මෙම ප්‍රදානයේ අරමුණු වේ.

මෙහිදී, ස්වාභාවික විද්‍යා, වෛද්‍ය විද්‍යා සහ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍ර යටතේ 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුකරන ලද ව්‍යාපෘති 03 ක් සඳහා රුපියල් 150,000/- බැගින් ප්‍රදාන පිරිනමන ලදී.

(4) සුනාමි ව්‍යසනයට ලක් වූ සිසුන් සඳහා වන ශිෂ්‍යත්ව වැඩසටහන

සුනාමි ව්‍යසනයට ලක් වූ ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා දේශීය හා විදේශීය හිතවතුන්ගෙන් ලද පරිත්‍යාග මගින් 2005 වසරේ දී පිහිටුවන ලද ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා රුපියල් 1,398,000/- ක් ශිෂ්‍යත්ව අරමුදල් වශයෙන් 2012 වර්ෂය තුළදී ප්‍රදානය කරන ලදී.

13.2 ශිෂ්‍යත්ව ප්‍රදාන සම්බන්ධීකරණය

- **විශ්වවිද්‍යාලවලට ඇතුළු වන සිසුන් සඳහා කොමර්ෂල් බැංකු ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය**

ශ්‍රී ලංකාවේ සෑම විශ්වවිද්‍යාලයක්ම ආවරණය වන පරිදි වෛද්‍ය විද්‍යා සහ කළමනාකරණ පීඨවලට ඇතුළුවන සිසුන්ට ලබාදීමට මෙය සැකසී ඇත. ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රුපියල් 25,000/- ක් වන අතර එය වාරික 10 න් ගෙවනු ඇති අතර සලකා බලන ලද පාඨමාලා කාලය මත මුළු වාරික ගණන රඳා පවතී.

සලකා බලනු ලබන වර්ෂයේ දී මෙම ශිෂ්‍යත්වය සඳහා පිළිවෙළින් 2009 සහ 2010 අ.පො.ස (උ/පෙළ) විභාගයේ ප්‍රතිඵල පදනම් කොට ගෙන 2009/2010 අධ්‍යයන වර්ෂයෙන් සිසුන් 25 ක් තෝරාගෙන ඇති අතර 2010/2011 අධ්‍යයන වර්ෂයෙන් ද ඊට සමාන සංඛ්‍යාවක් තෝරා ගන්නා ලදී.

- **ඩයලොග් කුසලතා ශිෂ්‍යත්ව වැඩසටහන**

  වාර්ෂිකව අ.පො.ස (උ/පෙළ) විභාගයේ ඉතා උසස් කුසලතා ලබාගන්නා හා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ඉංජිනේරු පීඨයන්ට ඇතුල්වීම සඳහා සුදුසුකම් ලබාගන්නා සිසුන් 27 ක් වෙත මෙය ලබාදීමට කටයුතු කර ඇත.

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2009 සහ 2010 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ/පෙළ) විභාගය පදනම් කරගෙන ඩයලොග් ටෙලිකොම් ශ්‍රී ලංකා සමාගමේ පූර්ණ මූල්‍ය සහාය ඇතිව ශිෂ්‍යත්ව 54 ක් උත්සවාකාරයෙන් 2012 ජනවාරි 26 වන දින පිරිනැමීමට කටයුතු කර ඇත.

  ශිෂ්‍යත්වයේ වටිනාකම මාසිකව රුපියල් 4000/= ක් වන අතර සාර්ථක අධ්‍යාපන ක්‍රියාකාරකම් සහ යහපත් හැසිරීමට යටත්ව පාඨමාලා කාලය තුළ මෙම ශිෂ්‍යත්වය ගෙවනු ලබයි.

14 මූල්‍ය කළමනාකරණය වැඩි දියුණු කිරීම

විගණකාධිපති සහ පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කමිටුව මගින් කරන ලද නිරීක්ෂණ සලකා බලා උසස් අධ්‍යාපන ආයතනයන්හි අරමුදල් කළමනාකරණය අඛණ්ඩව සමාලෝචනය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විගණන කටයුතු ක්‍රියාත්මක කිරීමේ සහ පසු විපරම් කිරීමේ කමිටුවක් පිහිටු වන ලදී. අමාත්‍යාංශයේ ලේකම්තුමා මුලසුන දරන මෙම කමිටුව අඛණ්ඩව මුණ ගැසෙන අතර එමගින් තම මූල්‍ය රෙගුලාසි මත පිහිටා මහා භාණ්ඩාගාරය විසින් හඳුන්වා දෙන ලද යහපාලනය සහ කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිපදිමින් අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ ක්‍රියාපටිපාටියේ දෝෂයන් සහ අඩුලුහුඬුකම් හඳුනාගැනීමට විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්ට හැකියාව ලැබී ඇත.

පහත සඳහන් විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලට අදාල කරුණු අධීක්ෂණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී, කමිටුව විසිනව වාරයක් මුණ ගැසී ඇත. ඒවා නම්;

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
කොළඹ විශ්වවිද්‍යාලය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
කැළණිය විශ්වවිද්‍යාලය
මොරටුව විශ්වවිද්‍යාලය
යාපනය විශ්වවිද්‍යාලය
රුහුණු විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
කෘෂිකර්ම පශ්චාත් උපාධිඅධ්‍යයන ආයතනය
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධිඅධ්‍යයන ආයතනය
පාලි හා බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය
පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය
විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
මානව සම්පත් අභිවර්ධන ආයතනය
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලීය පරිඝනක අධ්‍යයනායතනය
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
ජාතික පුස්තකාල හා විඥාපන අධ්‍යයන ආයතනය
තාක්ෂණ විද්‍යා ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය
ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයනායතනය
ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය

15 ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රගති රැස්වීම් පැවැත්වීම,

විශ්වවිද්‍යාල අධ්‍යාපනය ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සහ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යයන, පරිපාලන සහ අනෙකුත් මට්ටමේ කාර්යමණ්ඩලය ද ඇතුළුව විශ්වවිද්‍යාල ප්‍රජාව මුණ ගැසීමේ රැස්වීම් මාලාවක් ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. ඒවා මෙසේය;

(1) 2012.01.26 සහ 2012.03.20 යන දිනයන්හි, කොළඹ ගලධාරී හෝටලයේ දී කොමිෂන් සභා සාමාජිකයන්, එහි අදාල නිලධාරීන්, කලා සහ මානව ශාස්ත්‍ර පීඨාධිපතීන් සහ ක්ෂේත්‍රයේ විද්වතුන් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ විද්වතුන්, අධ්‍යයන ප්‍රජාවගේ සහභාගිත්වයෙන් ශාස්ත්‍රවේදී උපාධිය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හඳුන්වාදීමේ හැකියාව සොයා බැලීම සඳහා

(2) 2012.02.14 දින, උපකුලපතිවරුන්ගේ සහ අනෙකුත් අදාල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2012 වර්ෂයේ මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන සංවර්ධන ඉලක්ක මෙන්ම පවත්නා ශිෂ්‍ය ගැටළු සාකච්ඡා කිරීම සඳහා

(3) 2012-04-30 දින, කොළඹ, පේරාදෙණිය, ශ්‍රී ජයවර්ධනපුර සහ මොරටුව විශ්වවිද්‍යාල වල උප කුලපතිවරුන් සහ අදාල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2012-2015 ක්‍රමෝපාය සැලැස්ම සහ 2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සාකච්ඡා කිරීම සඳහා

(4) 2012-06-22 දින සියළුම උප කුලපතිවරුන් සහ අදල නිලධාරීන් සමග විශ්වවිද්‍යාලයන්හි වර්තමාන ක්‍රියාකාරකම් සාකච්ඡා කිරීම සඳහා

(5) 2012-06-25 දින ශ්‍රී ජයවර්ධනපුර, යාපනය, රජරට, සබරගමුව, ඌව වෙල්ලස්ස සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල උපකුලපතිවරු සහ අදාල නිලධාරීන් සමග ක්‍රමෝපාය සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සාකච්ඡා කිරීම සඳහා

(6) 2012-07-30 දින කොළඹ ගලධාරී හෝටලයේ දී, අදාල නිලධාරීන් සමග කවිතා නිපුණතා ප්‍රදානෝත්සවය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා

(7) 2012-09-06 දින මහා භාණ්ඩාගාර නිලධාරීන් සමග අයවැය සාකච්ඡා පැවැත්වීමට පෙර 2013 වාර්ෂික අයවැය පිළියෙල කිරීම සාකච්ඡා කිරීම සඳහා උප කුලපතිවරු සහ මහා භාණ්ඩාගාර නිලධාරීන් සමග අනුගාමී රැස්වීමක් පවත්වන ලදී.

16 ජාතික ආයතන සහ සංවිධාන සඳහා සපයන ලද සහාය

- සීමාවාසික පත්වීම් ලබා දීම සඳහා 2004/05 (පුනර්) අවසන් වෛද්‍ය විද්‍යා විභාග පදනම් කර ගෙන කුසලතා ලේඛණය පිළියෙල කර සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී.
- රජරට වෛද්‍ය විද්‍යා පීඨය හැර 2005/06 එම්.බී.බී.එස්.(ප්‍රධාන) විභාගය සඳහා අදාල සීමාවාසික පත්වීම් සඳහා එම්.බී.බී.එස්. උපාධිධාරීන්ගේ තාවකාලික කුසලතා ලේඛණයක් පිළියෙල කොට සෞඛ්‍ය අමාත්‍යංශය වෙත භාර දෙන ලදී,
- ශ්‍රී ලංකා මහා බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය ආයතන මගින් ප්‍රකාශයට පත්කරනු ලබන වාර්ෂික ප්‍රකාශන සඳහා විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයට අදාල දත්ත කළමනාකරණ තොරතුරු පද්ධති අංශය විසින් එම ආයතන වෙත ලබාදෙන ලදී.
- විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ UNESCO සංඛ්‍යාන ආයතනය සඳහා අවශ්‍ය තොරතුරු, කළමනාකරණ තොරතුරු පද්ධති අංශය විසින් ලබාදෙන ලදී.

17 නෛතික කටයුතු

17.1 නව නියමයන් සහ නියමාවලියන්

සමාලෝචිත වර්ෂයේ දී, කොමිෂන් සභාවේ නීති අංශය විසින් රජයේ අති විශේෂ ගැසට් පත්‍ර මගින් නියමයන් 05 ක් (ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ නිසි බලධාරීන් පත් කිරීම සඳහා 01 ක්, ඇතැම් ආයතන වසා දැමීම සඳහා 02 ක් ද, යාපනය විශ්වවිද්‍යාලයේ සහ අග්නිදිග විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨ ස්ථාපිත කිරීම සඳහා 02 ක්) ද නියමාවලින් 01 ක් ප්‍රකාශයට පත් කරන ලදී.

(1) වර්ෂය තුළ දී ප්‍රකාශයට පත් කරන ලද නියමයන්;

(අ) 2012 අගෝස්තු 23 දිනැති අංක 1742/05 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4) වගන්තිය යටතේ කෙටුම්පත් කර ඇති ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙනුවට නිමල් රංජිත් අර්ථනායක මහතා නිසි බලධාරියා ලෙස පත් කිරීමේ නියමය අවලංගු කර ඔහුව එම විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවට නිසි බලධාරියා ලෙස 2011 දෙසැම්බර් 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීමේ නියමය

ආ) 2012 අගෝස්තු 21 දිනැති අංක 1772/5 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20 (4) (අ) වගන්තිය යටතේ කෙටුම්පත් කර ඇති ගරු අමාත්‍යතුමා විසින් සිදුකරන ලද නියමයේ උපලේඛණවල සඳහන් ආයතන සාමාන්‍ය තත්ත්වයට ප්‍රතිස්ථාපනය කරන තුරු එම ආයතන වසා දැම්ම සඳහා වන නියමය

(ඇ) 2012 සැප්තැම්බර් 05 දිනැති අංක 1774/8 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 (4) (අ) වගන්තිය යටතේ කෙටුම්පත් කර ඇති ඉහත (ආ) හි සඳහන් ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් කරන ලද නියමය එකී ආයතන සාමාන්‍ය තත්ත්වයට නැවත පත් වී ඇති බැවින් නිෂ්ප්‍රභා කිරීමේ නියමය.

(ඈ) 2012 දෙසැම්බර් 05 දිනැති අංක 1787/27 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වගන්තිය යටතේ කෙටුම්පත් කර ඇති යාපනය විශ්වවිද්‍යාලයේ හා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨ ස්ථාපිත කිරීමේ නියමය.

(2) **වසර තුළදී ප්‍රකාශයට පත් කරන ලද නියමාවලින්**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 1996 අංක 01 දරන නියමාවලියේ 24(අ) වන වගන්තිය, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු බැවින්, 2012.04.25 දිනැති අංක 1755/33 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර නිවේදනයෙන් ප්‍රකාශිත පරිදි, විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 1996 අංක 01 දරන නියමාවලියේ 24(අ) වන වගන්තිය සංශෝධනය විය.

17.2 අධිකරණ කටයුතු

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එරෙහිව විවිධ අධිකරණ හා විනිශ්වය සභා ඉදිරියේ පවරන ලද නඩු 45 ක් පිළිබඳව කටයුතු නිති අංශය මගින් වර්ෂය තුල දී සිදුකරන ලදි.

ශ්‍රේෂ්ඨාධිකරණ	-	නඩු 22
අභියාචනාධිකරණ	-	නඩු 07
මානව හිමිකම් කොමිෂන් සභාව	-	නඩු 03
කම්කරු දෙපාර්තමේන්තු විමර්ශන	-	නඩු 01
දිස්ත්‍රික් උසාවිය	-	නඩු 01
මහාධිකරණය	-	නඩු 02
කම්කරු විනිශ්වය සභාව	-	නඩු 01
විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩල	-	නඩු 08

18 මධ්‍යම අභ්‍යන්තර විගණනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන වල අභ්‍යන්තර විගණන සහ පරීක්ෂණ පැවැත්වීම මධ්‍යම අභ්‍යන්තර විගණන අංශයට පවරා ඇති හෙයින් පෙර වර්ෂ වලදී මෙන්ම අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් බව, චක්‍රලේඛ උපදෙස්වලට, විශ්වවිද්‍යාල පනතට හා බලපානු ලබන වෙනත් නීතිරීති වලට අනුකූල වීම විමසමින් මෙම වසරේදී ද අභ්‍යන්තර විගණන කටයුතු ඉදිරියට ගෙන යන ලදි. අධීක්ෂණ කටයුතු සහ නව ප්‍රතිපත්ති හෝ ප්‍රතිපත්ති වෙනස් කිරීම පිළිබඳ යෝජනා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා විගණන කමිටුව මගින් කෙරෙන අතර විශ්වවිද්‍යාල පද්ධතියේ පවතින දුර්වලතා හා ඌනතා දියුණු කිරීමට අවශ්‍ය යෝජනා අදාල නිලධාරීන්ගේ අවධානයට යොමු කිරීමට අවශ්‍ය කටයුතු අදාල වර්ෂය තුලදී කරන ලදී.

(1) සාමාන්‍ය විගණන වැඩසටහන්වලට අමතරව පහත සඳහන් විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි ඇතැම් විශේෂිත විමර්ශන සිදුකරමින් වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල බලධාරීන් වෙත වාර්තා ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයනායතනය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

(2) විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන 29 ක් සම්බන්ධව පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුව සම්බන්ධ කාරණා මධ්‍යම අභ්‍යන්තර විගණන අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලැබූ අතර ඒ මගින් ඉල්ලා සිටි තොරතුරු ලබාදෙන ලදී.

(3) සමාලෝචිත වර්ෂයේ දී 2012.03.30, 2012.09.07 සහ 2012.12.07 යන දිනයන්හි දී අවස්ථා තුනකදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා විගණන කමිටුව මුණ ගැසෙන ලදී.

19 විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය 48 වාරයක් රැස්වෙන ලදී. 2012 වර්ෂයේ දී විශ්වවිද්‍යාල අභියාචනා 18 ක් අළුතින් ලියාපදිංචි කරන ලදී. නියෝග 19 ක් සඳහා අදාල වර්ෂයේ දී නියෝග නිකුත් කරන ලද අතර ඉන් අභියාචනා 17 ක් නිෂ්ප්‍රභාවන් වූ අතර අභියාචනා 02 ක් සඳහා අනුමැතිය ලැබිණි. කිසිදු නඩුවක් සඳහා මූලික නියෝග නිකුත් නොකරන ලදී. අභියාචනා 01 ක් පමණක් කල් තබන ලදී. ඒ අනුව 2012 වර්ෂය අවසානයේ දී අභියාචනා 22 ක් පරීක්ෂණ අවසන් නොමැතිව ඉතිරිව පැවතිණ.

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය විසින් නියෝග නිකුත් කරන ලද අභියාචනා 02 ට එරෙහිව පැවරූ අභියාචනා 02 ක් වර්ෂය අවසන් වනවිට අභියාචනාධිකරණයේ විභාග වෙමින් පැවති අතර අභියාචනා 02 ක් සඳහා නියෝග ලබාදෙන ලදී.

20 ප්‍රකාශන සහ පර්යේෂණ අධ්‍යයන

(1) "ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සංඛ්‍යාන 2011" කලාපයේ 10 වන වෙළුම 2012 අගෝස්තු මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී.

(2) "ගෝලීය පරිසරයක නැගී එන අවශ්‍යතා සහ අභියෝග ජය ගැනීම සඳහා ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල නැවත නිර්මාණය කිරීම සහ නැවත ස්ථාපිත කිරීම" යන වැඩමුළුවේ වාර්තා සටහන් 2012 සැප්තැම්බර් මාසයේ දී ප්‍රකාශිත විය.

(3) 2011 මූල්‍ය වර්ෂවලට අදාලව විශ්වවිද්‍යාල ඒකක පුනරාවර්තන වියදම් විශ්ලේෂණය කරන ලද අතර "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි ප්‍රථම උපාධි අධ්‍යාපනයේ ඒකක පුනරාවර්තන වියදම් විශ්ලේෂණය 2011 දක්වා" යන වාර්තාව පිළියෙල කරන ලදි .

(4) විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවත්නා මානව සහ භෞතික සම්පත් පිළිබඳව විස්තීර්ණ දත්ත ගබඩාවක් සංවර්ධනය කිරීම පිණිස විශ්වවිද්‍යාලවල පවත්නා බුද්ධිමය, කාර්මික සහ යටිතල පහසුකම් සම්පත් හඳුනා ගැනීම සඳහා පෙර වර්ෂයේදී ආරම්භ කරන ලද සමීක්ෂණය අවසන් කරන ලදී. මෙම දත්ත ගබඩාවේ මූලික අරමුණ වනුයේ, එහි ඇති විස්තීර්ණ දත්ත යොදාගනිමින් විශ්වවිද්‍යාල පද්ධතිය තුල ආයතනික සංවර්ධනය වැඩි දියුණු කිරීමය.

(5) ශ්‍රී ලංකාවේ දළ ප්‍රවේශ අනුපාතය විශ්ලේෂණය කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා වන ශිෂ්‍ය සහභාගීත්වයේ මට්ටම අධ්‍යයන කිරීම සඳහා තෘතීය මට්ටමේ පාඨමාලා පවත්වන රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පුද්ගලික උසස් අධ්‍යාපන ආයතන ආවරණය වන පරිදි සමීක්ෂණයක් පවත්වන ලදී.

(6) යෝජිත පද්ධතියේ, පළමු මාර්ග ගත දත්ත රැස් කිරීමේ ඒකකය කොමිෂන් සභා වෙබ් අඩවිය හරහා හඳුන්වා දී ඇත. (මෙම ඒකකය PHP සහ MySql වැනි විවෘත මූලාශ්‍ර මෘදුකාංග භාවිතා කරමින් සංවර්ධනය කරන ලද, පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳව තොරතුරු ඒකරාශි කිරීම, ගබඩා කිරීම සහ වාර්තා කිරීම සඳහා වූවකි.)

21 විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 97 වගන්තිය අනුව ජීව ගණක විශේෂඥයින්ගේ නිර්දේශ මත සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායකවන මුදලින් කොටසක් විශ්‍රාම අරමුදලට යොදා ගනිමින් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල් ක්‍රමය පිහිටුවීමට කටයුතු කරන යෙදිණි. ඒ අනුව විශ්වවිද්‍යාල සේවකයින්හට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට අමතරව විශ්‍රාම අරමුදලක් ස්ථාපිත කිරීම සඳහා එවකට සිටි ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය රිචඩ් පතිරණ මහතාගේ යෝජනාව 1999 මාර්තු 24 දින පැවති කැබිනට් රැස්වීමේදී අනුමත කරන ලදී.

ඒ අනුව 1999 ජුනි 10 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 මගින් 1999 සැප්තැම්බර් 01 දින සිට විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල ස්ථාපිත කරන ලදී.

සාමාජිකත්වය

- 1999 සැප්තැම්බර් 01 දිනට සේවයේ නියුතු සියළුම ස්ථිර සේවයකයින් හට ඔවුන්ගේ කැමැත්ත මත අරමුදලේ සාමාජිකත්වය ලබාගැනීමට හැකි වූ අතර 1999 සැප්තැම්බර් 01 දිනට පසු සේවයට බැඳුනු සියළුම සේවකයින්හට අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබාගැනීම අනිවාර්ය විය.

- 1999 සැප්තැම්බර් 01 වන දිනට සේවයේ නියුතු විශ්‍රාම අරමුදලට කැමැත්ත පළ කළ සේවකයින් හට අර්ථසාධක අරමුදල් ශේෂයෙන් 40% ක් පසුගිය සේවා කාලයේ වගකීම් සපුරා ගැනීම සඳහා විශ්‍රාම අරමුදලට මාරු කිරීම අනිවාර්ය විය. අනාගත සේවා කාල වගකීම් ආවරණය කිරීම සඳහා ඒ අනුව අර්ථසාධක අරමුදල සඳහා සේවකයා විසින් දායක වන 15% ඉපැයුම් වලින් 8% ක් පැරණි සහ නව සාමාජිකයන් දෙපිරිසම වෙනුවෙන් විශ්‍රාම වැටුප් අරමුදලට බැර කළ යුතු අතර ඉතිරි 7% අර්ථසාධක අරමුදලට බැරකරනු ලැබේ.

වරප්‍රසාද

- විශ්‍රාම අරමුදලේ සාමාජිකයන් වසර 20ක් හෝ වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර විශ්‍රාම ගන්නේ නම් (අධ්‍යයන කාර්යමණ්ඩලයට අවුරුදු 65 දීත් අනධ්‍යයන කාර්යමණ්ඩලය අවුරුදු 55 හෝ 60 දක්වා හෝ ඒ අතර දී ත් ය.) තම ජීවිත කාලය පුරා මාසික විශ්‍රාම වැටුපක් හිමිවේ.

- සේවකයා විසින් සම්පූර්ණ කරන ලද මුළු සේවා කාලය සඳහා අවසන් වරට ගෙවනු ලැබූ වැටුප අනුව විශ්‍රාම වැටුප ගණනය කරනු ලබයි. ඒ අනුව අවුරුදු 55 න් විශ්‍රාම ගන්නා සෙවකයන් හට වර්ෂයකට 1% ක්ද අවුරුදු 60 න් විශ්‍රාම ගන්නා අයට 1.2% ක්ද අවුරුදු 65 න් විශ්‍රාම ගන්නා අයට 1.4% ක්ද යන අනුමත අනුපාතයට ය. අනධ්‍යයන කාර්යමණ්ඩලයේ සේවකයෙකු අවුරුදු 55 දී විශ්‍රාම යා හැකි නමුත් අවශ්‍ය පරිදි අවුරුදු 60 දක්වා හෝ ඒ අතර කාලයක් සේවය කරයි නම් ඔහුට විශ්‍රාම වැටුප් රට අදාලව ගෙවනු ලැබේ.

- විශ්‍රාමිකයා මියගිය හොත් කාලත්‍රයාට විශ්‍රාම වැටුපෙන් 50% ක් ගෙවනු ලැබේ. වයස 18 ට අඩු දරුවන් සිටී නම් වයස 18 සම්පූර්ණ වනතෙක් දරුවන් අතර ඉතිරි 50% සමසේ ගෙවනු ලැබේ.

- වසර 20 ක් සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති සේවකයන් හට ඔවුන් සේවයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී තම ගිණුමේ බැරට ඇති ශේෂය අදාල පොලියද සමගින් ගෙවනු ලැබේ.

- වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමට පෙර සේවයේ යෙදී සිටින කාලය තුලදී අභාවයට පත්වන අචාහක සේවකයන්ගේ ගිණුමේ ඇති ශේෂය ඔහුගේ/ඇයගේ ළගම ඥාතියා වෙත ගෙවනු ලැබේ.

පාලනය සහ කළමනාකරණය

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ කළමනාකාරීත්වය සහ පාලන ව්‍යුහය ඉදිරියේදී වඩාත් ශක්තිමත් සහ විධිමත් කිරීමට යෝජනා විය. ඒ අනුව විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය නියාමනය කිරීම, පරිපාලනය සහ කළමනාකරණය සඳහා නියමාවලියක් කෙටුම්පත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට කොමිෂන් සභාව තිරණය කරන ලද අතර කලින් කලට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම සඳහා උපදේශන මණ්ඩලයක් පත් කිරීමට ද කොමිෂන් සභාව තිරණය කරන ලදී. විගණනය කිරීම සඳහා විගණකාධිපති වෙත ලබා දීමට අරමුදලේ වාර්ෂික ගිණුම පිළියෙල කරන ලදී. රාජ්‍ය නිති රීති ප්‍රකාර ව ආයෝජන සිදු වී ඇත.

මූල්‍ය සාරාංශය
විශ්‍රාම වැටුප් අරමුදල - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

		2008	2009	2010	2011	2012
1	සාමාජිකත්වය					
	ක්‍රියාකාරී සාමාජිකයින්	6,073	6,883	7,282	7,588	8,167
	අක්‍රිය සාමාජිකයින්	968	1,080	1,363	1,503	1,778
	මුළු සාමාජිකයින්	7,041	7,963	8,645	9,091	9,945
2	ප්‍රතිලාභ ගෙවීම් කරන සාමාජිකයින්	67	82	89	113	121
3	අරමුදලේ ශේෂය (රුපි.මිලි.)					
	සාමාජිකයින්ගේ දායක අරමුදල	1052	1330	1633	1958	2432
	විශ්‍රාමිකයින්ගේ අරමුදල සහ සංචිතය	117	164	201	278	299
		1169	1494	1833	2236	2731
4	සමස්ත ආයෝජනය (රුපි.මිලි.)	1117	1392	1679	2000	2454
5	සමස්ත ආයෝජන ආදායම (රුපි.මිලි.)	146	208	213	224	236
6	ආදායම් බදු (රුපි.මිලි.)	15	21	21	22	20
7	ආයෝජනය මත වාර්ෂික ප්‍රතිලාභ අනුපාතය (%)	13%	15%	13%	11%	10%
8	සාමාජිකයන්ට ප්‍රකාශිත පොළී අනුපාතය	12%	13%	11.5%	8%	9%
9	විශ්‍රාම වැටුප් ගෙවීම (රුපි.මිලි.)	8	12	12	17	17







ආදායම් විශ්ලේෂණය 2012

භාණ්ඩාගාර බැදුම්කර

ස්ථාවර තැන්පතු

22. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 89 - 96 වගන්ති යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ස්ථාපිත කරන ලද විශ්වවිද්‍යාල සේවක අර්ථසාධක අරමුදල විශ්ව විද්‍යාල සේවකයන්ගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කරන සැලැස්මකි. වඩාත් ඵලදායි කළමණාකාරීත්වය තුලින් විශ්‍රාම යන මොහොතේ හෝ සේවය අවසන්වන විටදී සාමාජිකයන් සඳහා වඩාත් හොඳ ප්‍රතිලාභ ලබා දීම විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදලේ අරමුණයි.

අරමුදලේ සාමාජිකයන් ඔවුන්ගේ වැටුපෙන් 10% ක්ද සේවා යෝජකයා විසින් සාමාජිකයාගේ වැටුපෙන් 15% ක්ද දායක මුදල් ලෙස ගෙවනු ලැබේ.

වරප්‍රසාද

- සේවකයා විශ්‍රාම යාමේදී සේවක අර්ථසාධක අරමුදල් ශේෂය විශ්‍රාම ප්‍රතිලාභයක් ලෙස හිමිවීම.
- රජයේ සේවකයන්හට ක්‍රියාත්මක කරන ආපදා ණය, වාහන ණය හා පරිගණක ණය සඳහා අවශ්‍ය වන ඇප පහසුකම් ලෙස අරමුදල් ශේෂය යොදාගත හැක.
- සාමාජිකයන්ට තම ගිණුමේ බැරට ඇති අරමුදල් ශේෂයෙන් 65% දක්වා ණය මුදල් ලබා ගත හැක.
- විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලයට හා අනෙකුත් විශ්වවිද්‍යාල සේවකයින්හට උසස් අධ්‍යාපන කටයුතු සඳහා රජයේ ශිෂ්‍යත්ව මත විදේශ ගතවීමේ දී උසස් අධ්‍යාපන ආයතනවල ඇති ඇප බැඳුම්කර සඳහා අරමුදල් ශේෂය යොදා ගත හැක.

මූල්‍ය සාරාංශය
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

		2007	2008	2009	2010	2011	2012
1.	සාමාජිකත්වය						
	ක්‍රියාකාරී සාමාජිකයන්	26,111	26,143	27,450	27,368	27,892	28,291
	අක්‍රීය සාමාජිකයන්	5,404	5,385	5,348	5,321	5,288	5,272
2.	ප්‍රතිලාභ ගෙවීම්						
	ප්‍රතිලාභ ගෙවන ලද සංඛ්‍යාව	2,071	2,544	2,302	2,847	2,663	2,349
	ප්‍රතිලාභ ගෙවීම් (රුපි. මිලි.)	604.4	866.9	961.3	1,002.0	997.2	1,031.0
3.	අරමුදලේ ශේෂය (රුපි. මිලි.)	12,433.2	13,761.3	15,515.1	16,906.6	18,502.0	20,832.0
4.	පොදු සංචිතය (රුපි. මිලි.)	156.5	162.5	49.4	74.8	123.7	391.0
5.	පොලී අනුපාත සැමයීම් ශේෂය (රුපි. මිලි.)	-	-	-	136.9	281.6	-
6.	වර්ෂය තුළ ලබා දුන් ණය මුදල (රුපි. මිලි.)	1,139.9	695.1	640.1	708.8	858.8	784.0
7.	සමස්ත ආයෝජන (රුපි. මිලි.)	9,028.9	9,955.6	11,350.5	12,547.0	13,582.0	15,682.0
8.	සමස්ත ආයෝජන ආදායම (රුපි. මිලි.)	978.3	1,189.0	1,627.4	1,553.8	1,560.6	1,762.0
9.	ආදායම් බදු (රුපි. මිලි.)	97.8	120.7	162.7	155.3	124.8	141.0
10.	ආයෝජන මත වාර්ෂික ප්‍රතිලාභ අනුපාතය (%)	10.84%	12.12%	14.34%	12.38%	11.50%	11.3%
11.	සාමාජිකයන්හට ප්‍රකාශිත පොලී අනුපාතය (%)	10.5%	12%	15.5%	10.5%	11.0%	11.0%









23. 2012 වර්ෂයේ දී නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතනික චක්‍රලේඛ ලිපි

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් සහ අදාල රාජ්‍ය ආයතන විසින් කරන ලද මග පෙන්වීම් ප්‍රකාර වැටුප්, බඳවා ගැනීමේ පරිපාටි, සේවක සංඛ්‍යා සහ ඒ සම්බන්ධ කරුණු පිළිබඳව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතන වල මනා ක්‍රියාකාරිත්වය අරමුණු කර ගෙන සමාලෝචිත වර්ෂයේදී, පහත සඳහන් කොමිෂන් සභා චක්‍රලේඛ සහ ආයතන චක්‍රලේඛ නිකුත් කරන ලදී.

(1) කොමිෂන් සභා චක්‍රලේඛ

චක්‍රලේඛ අංකය	කොමිෂන් සභා චක්‍රලේඛ නාමය	චක්‍රලේඛ දිනය
973	2012 අයවැය යෝජනා ප්‍රකාර රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ ව්‍යාපෘති කාර්ය මණ්ඩල සඳහා ලබාදෙන දීමනා සංශෝධනය කිරීම	04.01.2012
974	විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු වල පුරප්පාඩු පිරවීම	04.01.2012
975	2012 අයවැය යෝජනා ප්‍රකාර විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය කිරීම	13.01.2012
976	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ 18:12:1 වන ප්‍රකාර සේවකයන් පත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම	12.03.2012
977	විශ්වවිද්‍යාල විසින් පවත්වන ලද අභ්‍යන්තර විභාග සඳහා ගෙවීමේ පදනම	14.03.2012

චක්‍රලේඛ අංකය	කොමිෂන් සභා චක්‍රලේඛ නාමය	චක්‍රලේඛ දිනය
978	ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ ලකුණු සහ ශ්‍රේණි නැවත පරීක්‍ෂා කිරීම සඳහා විධි විධාන.	09.04.2012
979	අන්තර් විශ්වවිද්‍යාල උප-පාලකවරුන්ගේ වෘත්තිය සමිති සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර කාර්මික ආරවුල පිළිබඳව බේරුම්කරණ විනිශ්චය ක්‍රියාවට නැංවීම	09.04.2012
980	පරිඝනක තාක්ෂණ උපදේශක තනතුර (විශේෂ අවශ්‍යතා) (කායික සහ/හෝ දෘශ්‍ය ආබාධ සහිත අයදුම්කරුවන් සඳහා පමණක් බඳවා ගැනීමේ පරිපාටිය)	16.04.2012
981	විශ්වවිද්‍යාල විසින් පවත්වන අභ්‍යන්තර විභාග සඳහා ගෙවීමේ පදනම	23.04.2012
982	තේරීම් කමිටු සාමාජිකයන් සඳහා ගාස්තු ගෙවීම්	30.04.2012
983	වැඩ ප්‍රධානී තනතුරු (යන්ත්‍ර/අතුරු ඇමිණුම/පොත් බැඳීම) ඉහල ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	04.05.2012
984	පුස්තකාල සහායක තනතුර III ශ්‍රේණිය, II ශ්‍රේණිය, I ශ්‍රේණිය, මාණ්ඩලික සහකාර/පුස්තකාල සේවා සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර/ පුස්තකාල සේවා සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	08.05.2012
985	2012 අයවැය යෝජනා (වැටුප්) ප්‍රකාර අංක 30(1) කළමනාකරණ සේවා චක්‍රලේඛය මත පදනම්ව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ වැටුප් විෂමතා ප්‍රතිශෝධනය කිරීම.	15.05.2012
986	උපකරණ කාර්මික තනතුර, III ශ්‍රේණිය සහ ප්‍රවර්ධන ශ්‍රේණි සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	16.05.2012
987	ශාරීරික අධ්‍යාපන උපදේශක තනතුර III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	16.05.2012
988	නැටුම් හා නාට්‍යකරණ පීඨය සහ සංගීත සහ දෘශ්‍ය කලා පීඨය සඳහා උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	24.05.2012
989	අධ්‍යක්ෂක තනතුර/සැලසුම් සහ අධ්‍යක්ෂක/යටිතල පහසුකම් සංවර්ධනය - 2012.06.01 සඳහා බඳවා ගැනීමේ පටිපාටිය	29.05.2012
990	අධ්‍යයන නිවාඩු ලබා සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සමාජිකයන් සඳහා පර්යේෂණ දීමනා ගෙවීම්	31.07.2012
991	තේරීම් කමිටුවේ සේවය කිරීම සඳහා පත් කරන ලද කොමිෂන් සභා නියෝජිතයන්	06.08.2012
992	2003.09.09 දිනැති අංක 830 දරන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාර ගෙවන ලද පාඨමාලා ගාස්තු ප්‍රති ගෙවීම	23.08.2012
993	ක්‍රීඩාංගන සහායක තනතුර – පහළ ශ්‍රේණි සහ ඉහල ශ්‍රේණි සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	30.08.2012
994	පරිවාස කාලයේ පසුවන සේවකයන්ගේ සුහද මාරුවීම්	26.09.2012
995	ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග ගැළපීම සඳහා ආගණන උපාධි වර්ගීකරණය කිරීම	28.09.2012
996	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු II ශ්‍රේණිය (වෛද්‍ය/දන්ත වෛද්‍ය) සහ (වෛද්‍ය නොවන/දන්ත වෛද්‍ය) සඳහා බඳවා ගැනීමේ පරිපාටිය	09.10.2012
997	සංයුක්ත දීමනා ගෙවීම	21.12.2012

(1) **ආයතන චක්‍රලේඛ ලිපි**

ආයතන චක්‍රලේඛ ලිපි අංකය	**ආයතන චක්‍රලේඛ ලිපි නාමය**	**දිනය**
01/2012	විශ්වවිද්‍යාල සේවකයන් සඳහා විශේෂ අත්තිකාරකම් ගෙවීම	04.01.2012
02/2012	පරිවාස කථිකාචාර්යවරු සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු - සෘජු බඳවා ගැනීම් - සඳහා විදේශ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා මුල්‍ය සහාය	17.01.2012
03/2012	බඳවා ගැනීමේ පටිපාටියේ 4 වන කාණ්ඩය යටතේ කථිකාචාර්ය (පරිවාස) පත් කිරීම.	18.01.2012
04/2012	ගාල්ලේ සිට ඉදුවර දක්වා වන දුම්රිය මාර්ගය පිළිසකර කිරීම හේතුවෙන් දුෂ්කරතාවන්ට මුහුණපාන රාජ්‍ය සේවකයන් සඳහා සහන සැලසීම	27.01.2012
05/2012	ඇතැම් වෘත්තිය සමිති විසින් කරන ලද වෘත්තිය සමිති ක්‍රියාකාරකම්	22.02.2012
06/2012	සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා) සහ සහකාර ලේකම්/ සහකාර ලේඛකාධිකාරී (නීති හා ප්‍රලේඛන) තනතුරු උසස් කිරීම	30.03.2012
07/2012	බාහිර කථිකාචාර්ය කාර්ය මණ්ඩලයේ ගෙවීම් සහ ගමන් වියදම්	16.04.2012
08/2012	ප්‍රායෝගික පුහුණු සඳහා පොදු ආයතන වෙත පුහුණුවන්නන් අනුයුක්ත කිරීම	23.04.2012
09/2012	කථිකාචාර්ය (පරිවාස) සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු (සෘජු බඳවා ගැනීම) සඳහා විදේශයන්හි දී පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා මුල්‍ය සහාය	15.05.2012
10/2012	ඇතැම් වෘත්තිය සමිති විසින් සිදු කරන ලද වෘත්තිය සමිති ක්‍රියාමාර්ග	21.05.2012
11/2012	වෘත්තිය සමිති ක්‍රියාමාර්ග	30.05.2012
12/2012	නිල ඇඳුම් මැසීම සඳහා ගාස්තු	19.06.2012
13/2012	2012 - අයවැය යෝජනා ප්‍රකාර රාජ්‍ය සංස්ථා, ස්ථාපිත මණ්ඩල සහ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ දීමනා සංශෝධනය	23.07.2012
14/2012	2012 - රාමසාන් සමයේ දී විශේෂ නිවාඩු ලබාදීම	24.07.2012
15/2012	විශ්වවිද්‍යාලයක උපකුලපති සඳහා අදාල වැටුප් සහ දීමනා	17.09.2012
16/2012	පීඨාධිපතිවරයෙකු තෝරා ගැනීම	30.10.2012

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

	2012 රුපියල්	2011 රුපියල්
වත්කම්		
ජංගම නොවන වත්කම්		
දේපල පිරියත සහ උපකරණ	545,594,270	561,402,047
ආයෝජන	34,876,495	35,039,813
	580,470,765	596,441,860
ජංගම වත්කම්		
තොග	3,668,369	4,209,635
වෙළඳ හා අනෙකුත් ලැබීම්	63,757,518	37,341,873
ඉදිරියට කළ ගෙවීම් සහ තැන්පතු	3,383,369	2,239,413
මුදල් හා මුදල් සමාන දෑ	6,104,707	14,755,811
	76,913,961	58,546,732
මුළු වත්කම්	**657,384,726**	**654,988,593**
ස්කන්ධය සහ වගකීම්		
ඒකාබද්ධ අරමුදල		
විලම්භිත ප්‍රාග්ධන ලැබීම්	27,441,758	41,006,818
වියදම් නොවූ ප්‍රාග්ධන ප්‍රදාන	4,066,949	6,493,386
ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ ප්‍රදාන	1,126,076	2,616,135
වත්කම් ප්‍රත්‍යාගන අතිරික්තය	509,313,767	509,313,767
රඳවාගන්නා ලද අතිරික්තය (ඌණතාවය)	(22,137,450)	(29,455,544)
	519,811,100	529,974,562
ජංගම නොවන වගකීම්		
පර්යේෂණ අරමුදල	18,947,759	17,976,407
විදේශ ආධාර ව්‍යාපෘති	-	2,344,720
විශේෂ අරමුදල	9,881,435	8,222,781
විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව අරමුදල	18,258,844	18,334,472
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම්	35,696,924	38,014,686
	82,784,961	84,893,066
ජංගම වගකීම්		
විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා කළ යුතු ගෙවීම්	42,136,386	22,166,423
වෙළඳ සහ අනෙකුත් ගෙවීම්	7,892,499	8,684,565
කල් බදු- ශ්‍රී ලංකා මර්චන්ට	4,386,659	8,773,332
තැන්පතු	373,119	496,645
	54,788,664	40,120,965
මුළු ස්කන්ධය සහ වගකීම්	**657,384,726**	**654,988,593**

අත්සන් කළේ මහාචාර්ය එස්. එස්. එම්. කේ. කේ. හිරිඹුරේගම
සභාපතිනි

අත්සන් කළේ ආර් ඒ.යූ. රණවීර
ගණකාධිකාරී

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය -

	2012 රුපියල්	2011 රුපියල්
ආදායම්		
රජයේ ප්‍රදාන		
පුනරාවර්තන ලැබීම්	1,085,874,583	640,903,460
ස්ථාවර වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම	9,490,059	11,317,941
ක්‍රමක්ෂය කරන ලද ප්‍රාග්ධන ආධාර	22,991,495	9,221,251
දකුණු ආසියානු විශ්වවිද්‍යාලය සඳහා දායකත්වය	70,359,281	28,641,193
දැනුම වැඩි දියුණු කිරීම සහ ආයතනික සංවර්ධන සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	398,514,723	440,534,432
මුළු රජයේ ප්‍රදාන	**1,587,230,141**	**1,130,618,276**
අනෙකුත් ආදායම්	19,739,390	12,003,005
	1,606,969,531	**1,142,621,281**
අඩු කළා: වියදම්		
සේවක වේතන	112,104,960	104,030,831
ගමන් වියදම්	1,419,918	789,776
සැපයුම්	10,896,944	8,422,527
නඩත්තු සේවා	7,383,341	4,133,947
ගිවිසුම්ගත සේවා සඳහා වියදම්	22,421,462	19,607,399
වෙනත් වර්තන වියදම්	36,269,554	26,191,382
පුනරුත්ථාපන වියදම්	9,490,059	11,317,941
ස්ථාවර වත්කම් ක්ෂය වීම්	22,991,495	19,279,652
ශිෂ්‍ය මුලාධාර	384,860,380	483,898,368
විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතන සඳහා මුලාධාර	993,956,286	469,175,624
	1,601,794,400	**1,146,847,447**
අතිරික්තය /(ඌනතාවය) 2012 වර්ෂය සඳහා	5,175,131	(4,226,165)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශය -

	2012 රුපියල්	2011 රුපියල්
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය		
මෙහෙයුම් අතිරික්තය /(ඌනතාවය)	5,175,131	(4,226,165)
ගැලපීම්		
ක්ෂය වීම්	22,991,495	19,279,652
පාරිතෝෂිතය සඳහා වෙන් කිරීම්	3,610,826	11,440,386
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය/පාඩුව	1,442,719	(900,466)
පොලී වියදම්	912,773	912,773
ක්‍රමක්ෂය කරන ලද ප්‍රාග්ධන ආධාර	(22,991,495)	(20,539,192)
ක්‍රමක්ෂය කරන ලද පුනරුත්ථාපන ආධාර	(9,490,059)	-
මෙහෙයුම් අතිරික්තය /(ඌනතාවය)	**1,651,390**	**5,966,988**
කාරක ප්‍රාග්ධනය වෙනස් වීම		
තොගවල වැඩි වීම	541,266	(2,350,962)
ණයගැතියන්ගේ වැඩිවීම	(26,415,645)	6,755,474
ඉදිරියට කල ගෙවීම්වල වැඩි වීම	(1,143,956)	(379,241)
උසස් අධ්‍යාපන ආයතනවලට ගෙවිය යුතු වියදම් වැඩිවීම	19,969,963	2,113,399
වෙළඳ ණය හිමියන්ගේ අඩුවීම	(792,067)	(4,006,058)
තැන්පතු වල පහළ යාම	(123,526)	209,630
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුදල්	(6,312,574)	8,309,230
පාරිතෝෂිත ගෙවීම්	(3,785,625)	(7,505,093)
පොලී ගෙවීම්	(912,773)	(912,773)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(11,010,973)**	**(108,636)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල		
දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම්	(8,626,436)	(7,298,950)
ස්ථාවර වත්කම් ඉවත් කිරීම	-	2,103,800
ස්ථාවර තැන්පතු මත ආයෝජන	163,318	(2,336,749)
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙද වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(8,463,118)**	**(7,531,899)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල		
ප්‍රාග්ධන ආධාර ලැබීම්	8,000,000	2,000,000
පුනරුත්ථාපන ආධාර ලැබීම්	7,000,000	3,500,000
පර්යේෂණ අරමුදල්වල වැඩි වීම	971,352	541,666
වාහන සඳහා කල් බදු ගෙවීම	(4,386,668)	(4,386,668)
විදේශ ආධාර ව්‍යාපෘති වලින් ලැබීම්/ගෙවීම්	(2,344,720)	118,463
විශේෂ කාර්යයන් සඳහා අරමුදල් ලැබීම් / ගෙවීම්	1,658,654	1,044,364
ශිෂ්‍යත්ව අරමුදල් ලැබීම්	(75,628)	2,241,895
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල	**10,822,989**	**5,059,720**
ශුද්ධ මුදල් ප්‍රවාහය	**(8,651,103)**	**(2,580,817)**
01.01.2012 දිනට මුදල් ශේෂය	14,755,811	17,336,628
31-12-2012 දිනට මුදල් ශේෂය	**6,104,707**	**14,755,811**
සටහන 1		
ලංකා බැංකුව-2323284	(89,970,566)	8,879,569
ලංකා බැංකුව – විදේශ ව්‍යාපෘති	277,940	277,940
ලංකා බැංකුව – විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව අරමුදල	5,797,333	5,598,302
ලංකා බැංකුව ගිණුම් අංක 2323284 වෙත කරන ලද එක් දින තැන්පතු	90,000,000	
	6,104,707	**14,755,811**

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	ඒකාබද්ධ අරමුදල	රඳවාගන්නා ලද අතිරික්තය /(හිගය)	අතිරික්තය ප්‍රතිප්‍රමාණය කිරීම	එකතුව
2010 ජනවාරි 01 දිනට ශේෂය	56,138,127	(40,384,588)	515,365,273	**531,118,812**
ක්ෂයවීම් සඳහා ගැළපීම	-	5,184,568	-	**5,184,568**
වත්කම් ක්ෂයවීම් සඳහා ප්‍රදාන ක්‍රමක්ෂය	(6,021,788)	-	(6,051,506)	**(12,073,294)**
2010 වර්ෂය සඳහා මුළු ආදායම / අතිරික්තය/(හිගය)	-	9,970,641	-	**9,970,641**
31/12/2010 දිනට ශේෂය	**50,116,339**	**(25,229,379)**	**509,313,767**	**534,200,727**
2011 වර්ෂය සඳහා මුළු ආදායම / අතිරික්තය/(හිගය)	-	(4,226,165)	-	(4,226,165)
31/12/2011 දිනට ශේෂය	**50,116,339**	**(29,455,544)**	**509,313,767**	**529,974,562**
2012 ස්කන්ධය වෙනස්වීම				
සේවය හැර ගිය සේවකයන් වෙත පාරිතෝෂිත ගෙවීම සඳහා ප්‍රතිපාදන	-	2,142,963	-	2,142,963
වැඩි කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන	5,509,939	-	-	5,509,939
වත්කම් ක්ෂයවීම් සඳහා ප්‍රදාන ක්‍රමක්ෂය	(22,991,495)			(22,991,495)
2012 වර්ෂය සඳහා මුළු ආදායම / අතිරික්තය/(හිගය)	-	5,175,131	-	5,175,131
31/12/2012 දිනට ශේෂය	**32,634,783**	**(22,137,450)**	**509,313,767**	**519,811,100**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

UNIVERSITY GRANTS COMMISSION 10 OCT 2013 (1)
UNIVERSITY GRANTS COMMISSION 14 OCT 2013 SECRETARY (10)

මගේ අංකය / எனது இல / My No : ඊසී/බී/යූජීසී/එෆ්ඒ/2012
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date : 2013 ඔක්තෝබර් 09 දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12(5) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති.

පිටපත් :- 1. ලේකම් , උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් , මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No: ඊසී/බී/යූජීසී/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date: 2013 ඔක්තෝබර් දින

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12(5) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12(1), (4) සහ (7) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත 2013 ජුනි 19 දින නිකුත් කරන ලදී.

1:2. <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1:3. <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail: oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරීපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරීපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරීපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තිරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2:1. <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2:2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2:2:1. නීති රීති , රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරණු ලැබේ.

නීති රීති, යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2011 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය	යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණය සංශෝධනය කර ගැනීමකින් තොරව භාණ්ඩාගාරයේ එකඟත්වය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අධ්‍යයන දීමනාව, මුළු ඉපයීම් යන නිර්වචනය තුළට ඇතුළත් කර 2013 ජනවාරි 08 දින අංක 1000 දරන චක්‍රලේඛය නිකුත් කර තිබුණි. ඒ අනුව 2012 දෙසැම්බර් 31 දිනට මෙම අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට, විශ්‍රාම වැටුප් අරමුදලට හා සේවා නියුක්තිභාර අරමුදලට වැඩිපුර ගෙවා තිබූ අගය රුපියල් මිලියන 559.29 ක් විය.
(ආ) ආයතන සංග්‍රහයේ 8 පරිච්ඡේදයේ 10.1 ඡේදය සහ 1984 ජුනි 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 256 සහ 1997 පෙබරවාරි 03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/97	යොමුගත රෙගුලාසිවලට අනුකූල නොවන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිවාඩු දින වැඩ කිරීම වෙනුවෙන් දිනකට පැය 08 ක් සම්පූර්ණ කළ යුතුය යන වගන්තිය, දිනකට පැය 04 බැගින් දින 02 කදී ආවරණය කළ හැකි බවට සංශෝධනය කරමින් 1997 අප්‍රේල් 01 දිනැති අංක 707 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය නිකුත් කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් ගෙවීම් කර තිබුණු අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිළධාරීන්ට 2012 වර්ෂය තුළදී රු.45,573 ක් ගෙවා තිබුණි.
(ඇ) මුදල් රෙගුලාසි 71 හා 2003 ජුනි 02 දිනැති අංක පිරිඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 වගන්තිය	කොන්ත්‍රාත්, අනියම් හෝ වෙනත් පදනම් මත බඳවා ගැනීම් සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සේවකයන් හතරදෙනෙකු බඳවාගෙන 2012 වර්ෂයේදී එකතුව රු. 518,960 ක් ගෙවීම් කර තිබුණි.

3. <u>මූල්‍ය සමාලෝචනය</u>

3:1. <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.5,175,131 ක අතිරික්තයක් වූ අතර , ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂය සඳහා ඌණතාවය රු.4,226,165 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,401,296 ක වර්ධනයක් ඇතිවීම සඳහා පහත කරුණු විශේෂයෙන් බලපා තිබුණි.

2011 වර්ෂය හා සැසඳීමේදී පුනරාවර්තන ප්‍රදාන, ප්‍රාග්ධන ප්‍රදාන, දකුණු ආසියාතික විශ්වවිද්‍යාලවලට දායකය හා වෙනත් ආදායම් පිළිවෙලින් රු.444,971,123, රු.13,770,244, රු.41,718,088 හා රු.7,736,385 කින් වැඩිවීම මෙන්ම ශිෂ්‍ය මූල්‍ය සහාය (Student Financial Assistance) රු.99,037,988 කින් අඩුවීමද විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා මූල්‍ය සහාය රු.524,780,662 කින් වැඩිවීමද මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට විශේෂයෙන් බලපා තිබුණි.

3:2. <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

පසුගිය වර්ෂය හා සැසදීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.9,401,296 කින් එනම් සියයට 222 කින් වර්ධනය වී තිබුණි.ප්‍රධාන ආදායම් හා වියදම් විචලනයන් පහත දැක්වේ.

	2012 රු.	2011 රු.	විචලනය රු.	විචලනයේ ප්‍රතිශතය සියයට
<u>ආදායම</u>				
පුනරාවර්තන ප්‍රදාන	1,085,874,583	640,903,460	444,971,123	69
ප්‍රාග්ධන ප්‍රදාන	22,991,495	9,221,251	13,770,244	149
දකුණු ආසියාතික විශ්වවිද්‍යාල වලට දායකය.	70,359,281	28,641,193	41,718,088	146
දැනුම වැඩි දියුණු කිරීම සහ ආයතනික සංවර්ධනය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	398,514,723	440,534,432	(42,019,709)	(10)
වෙනත් ආදායම්	19,739,390	12,003,005	7,736,385	64
<u>වියදම</u>				
සැපයුම්	10,896,944	8,422,527	2,474,417	29
වෙනත් අයභාර වියදම්	36,269,554	26,191,382	10,078,172	38
ශිෂ්‍ය මූල්‍ය සහාය (Student Financial Assistance)	384,860,380	483,898,368	(99,037,988)	(20)
විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා මූල්‍ය සහාය	993,956,286	469,175,624	524,780,662	112

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය අධ්‍යයන වර්ෂ තුනක විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන්, බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒ ඒ වර්ෂ සඳහා නිදහස් කළ මුදල් සහ එක් ශිෂ්‍යයෙකු සඳහා නිදහස් කරන ලද සාමාන්‍ය මුදල් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

	2011/2012	2010/2011	2009/2010
විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව	141,411	142,516	125,284
විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීමට තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව	28,937	22,016	21,547
විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාලයට තෝරාගත් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස (සියයට)	20	15	17
	2012	2011	2010
වැය කල පුනරාවර්තන වියදම (රු.'000)	14,611,003	12,961,095	10,865,900
මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	72,937	77,640	73,398
එක් ශිෂ්‍යයෙකු සඳහා සාමාන්‍ය පුනරාවර්තන වියදම (රු)	200,323	166,938	148,040

2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 20 ක් පමණක් විශ්වවිද්‍යාලවලට බඳවා ගෙන තිබුණු අතර එක් ශිෂ්‍යයෙකු සඳහා සාමාන්‍ය පුනරාවර්තන වියදම රු.200,323 ක් වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාල වලට ඉල්ලුම් කර තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 49 ක් පමණක් විශ්වවිද්‍යාල සඳහා තෝරාගෙන තිබුණි.

(ආ). යාපනය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කිරීම.

යාපනය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයක් ස්ථාපිත කිරීමේ කටයුතු සඳහා වාර්තාවක් ලබා ගැනීමට මහාචාර්යවරයෙකු පත්කර 2010 නොවැම්බර් සිට 2011 ජූලි දක්වා රු.730,552 ක් ගෙවා තිබුණු අතර ඔහුගේ වාර්තාව අනුව ඉංජිනේරු පීඨයක් යාපනය විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කල යුතු බව හා 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් පනහක් බඳවා ගැනීම සිදු කළ යුතු බවත් 2013 වර්ෂය වන විට සිසුන් සියයක් දක්වා වර්ධනය කළ යුතු බවත් දක්වා තිබුණද 2011/2012 අධ්‍යන වර්ෂය සඳහා එම විශ්වවිද්‍යාලයට සිසුන් බඳවාගෙන නොතිබුණි.

(ඇ). විශ්වවිද්‍යාල වලට සිසුන් තෝරාගැනීම හා ඇතුළත් කර ගැනීම සඳහා මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම.

විශ්වවිද්‍යාල වලට සිසුන් තෝරා ගැනීම සඳහා මෘදුකාංග පද්ධතිය කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යාපනායතනය (University of Colombo School of Computing) වෙතින් ස්ථාපිත කර ගැනීමේ කොන්ත්‍රාත්තුව සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 80 ක් හෙවත් රු.1,520,000 ක මුදලක් 2012 අප්‍රේල් 03 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එම අධ්‍යාපනායතනයට ගෙවා තිබුණි. මෙම ගෙවීම 2012 පෙබරවාරි 09 දිනැති අංක 843.5.3 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, 21 වන සියවසට උසස් අධ්‍යාපන ව්‍යාපෘතියෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ). මධ්‍යගත අභ්‍යන්තර විගණන ක්‍රමයක් ඇති කිරීම.

විශ්ව විද්‍යාල පද්ධතිය තුල මධ්‍යගත අභ්‍යන්තර විගණන ක්‍රමයක් ඇති කිරීම වෙනුවෙන් කරුණු විමර්ශනය කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා 2007 මාර්තු 05 දින සිට මසකට 50,000 ක ගෙවීමක් මත මාස 06 ක් සඳහා රු.300,000 ක් වැය කර උපදේශකයකු පත්කර තිබුණි. උපදේශකවරයා 2007 අප්‍රේල් 11 දින සියළු කරුණු ඇතුළත් කර වාර්තාවක් ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇතත් මෙම වාර්තාව වසර 5 ක් තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂය අවසානයට සේවක සංවර්ධන අරමුදලේ රු.5,356,873 ක ශේෂයක් පැවතියද, එම මුදල් උපයෝගී කර නොගෙන සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද සේවක සංවර්ධන වැඩසටහන් සඳහා රජයේ අරමුදල්වලින් රු.933,122 ක් උපයෝජනය කර තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ). 2012 වර්ෂය සඳහා දැනුම වැඩි දියුණු කිරීම සහ ආයතනික සංවර්ධනය (KEID) වෙනුවෙන් උසස් අධ්‍යාපනික ආයතන 20 ක් සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එකතුව රු.396,994,000 ක මුදලක් ලබාදී තිබුණු නමුත් 2012 වර්ෂය අවසානයට උපයෝජනය සියයට 50 ට අඩු වූ අවස්ථා 13 ක් නිරීක්ෂණය විය.

(ආ). තෝරා ගත් ජාතික විශ්වවිද්‍යාල 6ක් ලෝක තත්ත්වයේ විශ්වවිද්‍යාල දක්වා නඟා සිටුවීම.

ලෝක තත්ත්වයේ විශ්වවිද්‍යාල දක්වා නඟා සිටුවීම සඳහා විශ්වවිද්‍යාල 06 කට, 2011 හා 2012 වර්ෂ සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 100 හා රුපියල් මිලියන 75 බැගින් ලබාදී ඇතත් මොරටුව සහ රුහුණු විශ්වවිද්‍යාලවල, 2011 වර්ෂයට වඩා 2012 වර්ෂයේ ලෝක තත්ත්වය පහල මට්ටමකට වැටී තිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

ගිවිසුම් කඩකිරීම්වලින් අය කරගත් මුදල් රජයේ ආදායමට බැර කිරීම වෙනුවට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 737 ට අනුව ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගේ අරමුදලක් එක් එක් විශ්වවිද්‍යාල විසින් නඩත්තු කරමින්, ඉන් ලැබෙන ආදායම විශ්වවිද්‍යාල වල විවිධ වියදම් සඳහා යොදා ගෙන තිබුණි. විශ්වවිද්‍යාල 19 ක් සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව මෙම අරමුදලේ එකතුව රු.548,714,372 ක් විය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගිවිසුම් බැඳුම්කර කඩකිරීමේ අරමුදලේ (Bond violation Fund)ශේෂය රු.843,258 ක් ව පැවතුණි.

4.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ). 2012 වර්ෂය අවසානයට වැය නොකල (ස්ථාවර වත්කම් මිලදී ගැනීම්) ප්‍රාග්ධන ප්‍රදාන (unspent F/A Account Grant) ශේෂය රු.4,066,949 ක් වූ අතර,2012 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට (ස්ථාවර වත්කම් මිලදී ගැනීමට) ලැබුණු ප්‍රග්ධන ප්‍රදානය හා වැය නොකල ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ඉදිරියට ගෙන ආ ශේෂයන්හි එකතුව වූ රු.6,493,386 හා සැලකීමේදී උපයෝජනය නොකල ප්‍රතිශතය සියයට 30 ක් විය.

(ආ). එකතුව රු.9,872,568 ක් වූ විශේෂ අරමුදල් 3 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පැවතුනද එම අරමුදල් ක්‍රියාකාරී මට්ටමක නොපැවතුණි.

(ඇ). එකතුව රු. 11,561,215 ක ශිෂ්‍යත්ව අරමුදල් 98 කින් 24 ක් පමණක් සක්‍රියව පැවති අතර රු.6,973,948 ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 74 ක් අක්‍රියව පැවතුණි.2012 වර්ෂය තුලදී ශිෂ්‍යත්ව 10 ක් පමණක් ලබා දී තිබුණි.

4.5. කාර්ය මණ්ඩල පරිපාලනය

කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 288 ක්ද තත්‍ය කාර්ය මණ්ඩලය 200 ක්ද වූ අතර සේවකයින් 88 දෙනෙකුගේ ඌනතාවයක් නිරීක්ෂණය විය.

4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

1997 ජනවාරි 24 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 116 හා අංක පීඊඩී/12 දරන හා 2003 ජුනි 02 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයේ 9.4 ඡේදයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවකයින් තුන්දෙනෙකු අමාත්‍යංශයේ රාජකාර් සඳහා යොදවා 2012 වර්ෂයේදී එම සේවකයින්ට රු.721,072 ක් වැටුප් වශයෙන් ගෙවීම් කර තිබුණි

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 16 වන වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී මාස 06 ක් ඉකුත්වීමට පෙර වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2011 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5.2 ප්‍රසම්පාදන සැලැස්ම

කොමිෂන් සභාව විසින් 2012 වර්ෂය සඳහා රු.8,626,436 ක ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ අනුමත ප්‍රසම්පාදන සැලස්මක් පිළියෙල කර නොතිබුණි.

5.3 අයවැය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පී.ඊ.ඩී. 12 දරන චක්‍රලේඛයේ 5.2.1 ප්‍රකාරව අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණු අතර අයවැයගත වියදම් හා සත්‍ය වියදම් අතර සියයට 42 සිට සියයට 93 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගි කර ගෙන නොතිබුණි.

6. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනය

(ඇ) සේවක බඳවා ගැනීම්

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරීත්වය
2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම 2.2.1 නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම නීති රීති, යනාදියට යොමුව (අ) 2011 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය	යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණය සංශොධනය කර ගැනීමකින් තොරව භාණ්ඩාගාරයේ එකඟත්වය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අධ්‍යයන දීමනාව, මුළු ඉපයීම් යන නිර්වචනය තුළට ඇතුළත් කර 2013 ජනවාරි 08 දින අංක 1000 දරන චක්‍රලේඛය නිකුත් කර තිබුණි. ඒ අනුව 2012 දෙසැම්බර් 31 දිනට මෙම අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට, විශ්‍රාම වැටුප් අරමුදලට හා සේවා නියුක්තිභාර අරමුදලට වැඩිපුර ගෙවා තිබූ අගය රුපියල් මිලියන 559.29 ක් විය.	එවකට පැවති අධ්‍යයන කාර්ය මණ්ඩල වැඩවර්ජන නිම කිරීම සඳහා වූ එකඟතාවයක් මත මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ 2012.12.21 දිනැති අංක DMS/E1/B4/7/313/2 දරණ ලිපිය අනුව අධ්‍යයන දීමනාව, මුළු ඉපයීම් යන නිර්වචනයට ඇතුලත් කර විශ්වවද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභවෙ විසින් 2013.01.08 දිනැති අංක 1000 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. මේ පිළිබඳව විශේෂ කැබිනට් අනුමැතියක් ලබා ගතයුතුද යන්න පිළිබඳව මහා භාණ්ඩාගාරයෙන් විමසා ඇති අතර ඒ පිළිබඳව තවම පිළිතුරු ලැබී නැත.	විශ්වවිද්‍යාල අධ්‍යාපන කාර්ය මණ්ඩලවල ඉල්ලීම හා යෝජනා අනුව සේවා නියුක්-තියන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අර්ථ නිරූපනයන්ට අනුව අධ්‍යයන දීමනාව ඉපයීමක් ලෙස සැලකිය හැකි බව ගරු නීතිපතිතුමා විසින් අංක E/307/2010 හා 2012.12.06 දිනැති ලිපියෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම් වෙත දැනුම් දී ඇති අතර ඒ අනුව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
			අධ්‍යයන දීමනාව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කිරීම සඳහා අදාල කරගතයුතු බව ලේකම්/මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් 2012.12.21 දිනැති ලිපිය මගින් උපදෙස් දී ඇත. ඒ අනුව භාණ්ඩාගාර ලේකම් විසින් ලබාදි ඇති උපදෙස් අනුව අදාල සේවකයන්ගේ අධි ගණනය කිරීම් අයකර ගැනීමේ අවශ්‍යතාවය පැන නොනගී. මේ සම්බන්ධව අවශ්‍ය විධිමත් අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේ-ශයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
(ආ) ආයතන සංග්‍රහයේ 8 පරිච්ඡේදයේ 10.1 ඡේදය සහ 1984 ජුනි 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 256 සහ 1977 පෙබරවාරි 03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/97.	යොමුගත රෙගුලාසි වලට අනුකූල නොවන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිවාඩු දින වැඩ කිරීම වෙනුවෙන් දිනකට පැය 08 ක් සම්පූර්ණ කළ යුතුය යන වගන්තිය, දිනකට පැය 04 බැගින් දින 02 කදී ආවරණය කළ හැකි බවට සංශෝධනය කරමින් 1977 අප්‍රේල් 01 දිනැති අංක 707 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන ප්‍රතිපාදන කොමිෂන් සභා දක්‍රලේඛය නිකුත් කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් ගෙවීම් කර තිබුණු අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරින්ට 2012 වර්ෂය තුළදී රු. 45,573 ක් ගෙවා තිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි පවතින රාජකාරිවල ස්වභාවය මත (විශේෂයෙන් විශ්වවිද්‍යාල තුලට ළමුන් ඇතුළත් කිරීමේ කටයුතු) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන් නිවාඩු දිනවල සේවයේ යොදවන අතර මසකට පැය 8 සීමාවකට යටත්ව නිවාඩු දින සඳහා වන ගෙවීම කරනු ලැබේ.	සභාව එක්ව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින්ජඩ අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කොට ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රවේශ අංශයේ විධායක නිලධාරීන් හට විශ්වවිද්‍යාල ප්‍රවේශ කටයුතු සිදුකරන කාලසීමාවේදී පමණක් අත්‍යවශ්‍ය රාජකාරි සඳහා ගෙවීමක් කළයුතු බැවින්, මෙය විශේෂ අවස්ථාවක් සේ සලකා ඉහත චක්‍රලේඛය අනුව දිනකට 1/20 ආදේශ කර කොමිෂන් සභා අනුමැතිය මත මෙම ගෙවීම කර ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
			විශ්වවිද්‍යාල ප්‍රවේශ කටයුතු කරන කාලසීමාව තුල යම් නිශ්චිත දිනකට සියලු අයදුම්පත් තෝරා සුදුසුකම් ලබන අයදුම්කරුවන් කඩිනමින් විශ්වවිද්‍යා වෙත යොමුකල යුතු හෙයින් අදාල ප්‍රවේශ අංශයේ මාණ්ඩලික නිලධාරීන් රාත්‍රි සේවයේ පවා යෙදවිය යුතුව ඇත. එම රාත්‍රි හා සති අන්ත නිවාඩු දින රාජකාරි සඳහා යම්කිසි දීමනාවක් කාර්ය සාදන පදනම මත ගෙවීමට යෝජනා කිරීමට මහා භාණ්ඩාගාරයේ අවසර ලබාදී ඇති අතර එය කෙටුම්පත් කෙරෙමින් පවතී.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
(ඇ) මුදල් රෙගුලාසි 71 හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 වගන්තිය	කොන්ත්‍රාත්, අනියම් හෝ වෙනත් පදනම් මත බඳවා ගැනීම් සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සේවකයන් හතරදෙනෙකු බඳවාගෙන 2012 වර්ෂයේදී එකතුව රු. 518,96 ක් ගෙවීම් කර තිබුණි.	2012 වර්ෂය තුළ කාර්යය පැවරුම් පදනම මත සේවකයින් කළමනාකරණ සේවා දෙපාරුතමේන්තුව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අනුමත කර ඇති සේවක සංඛ්‍යාවට යටත්ව සහ අදාල පුරප්පාඩු ඇතිවීමෙන් අනතුරුව, සේවයේ යොදවා ඇත. එම තනතුර සඳහා ස්ථිර සේවක භවතුන් බඳවා ගන්නා තෙක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියෙන් යුතුව සේවා අවශ්‍යතාවය මත මෙම පත්වීම් සිදු කරන ලදී. තවද, මේ සඳහා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ආවරණ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ඇත.	කාර්ය පැවරුම පදනම මත පත්කරන ලද මෙම සේවකයින් 04 දෙනාගේ සහ මාණ්ඩලික නිලධාරි පත්කිරීම් සහ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ ආවරණ අනුමැතිය ලබාගැනීම සඳහා ලිපියක් ඉදිරිපත්කර ඇති අතර එම අනුමැතිය ලැබී නැත. තවද, විගණකාධිපති අමතා 2013.04.08, යූජීසී/පී/2/5/33 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපතිතුමියගේ අත්සනින් යැවූ ලිපිය මගින් මේ වන විට කාර්යය

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
			පදනම මත බඳවා ගැනීම් අත්හිටුවා ඇති අතර ඉදිරියේදී එවැනි බඳවා ගැනීමට අවශ්‍යතාවයක් පැන නැගුනහොත් විගණකාධිපති විසින් පෙන්වා ඇති පරිදි අදාල බඳවා ගැනීම් කරනු ඇත.
3. <u>මූල්‍ය සමාලෝචනය</u>			
3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>	ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු. 5,175,131 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂය සඳහා ඌණතාවය රු. 4,226,165 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 9,401,296 ක වර්ධනයක් ඇතිවීම සඳහා පහත කරුණු විශේෂයෙන් බලපා තිබුණි.	එකඟ වේ	
	2011 වර්ෂය හා සැසඳීමෙදී පුනරාවර්තන ප්‍රදාන, ප්‍රාග්ධන ප්‍රදාන, දකුණු ආසියාතික විශ්වවිද්‍යාල වලට දායක හා වෙනත් ආදායම් පිළිවෙලින් රු. 444,971,123, රු. 13,770,244, රු. 41,718,088 හා රු. 7,736,385 කින් අඩුවීමද විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා මූල්‍ය සහාය රු. 524,780,662 කින් වැඩිවීමද මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට විශේෂයෙන් බලපා තිබුණි.	එකඟ වේ	

<table>
<tr><th>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්</th><th>විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු</th><th>පිළිතුරු හා නිරීක්ෂණ</th><th>ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරීත්වය</th></tr>
<tr><td>3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</td><td>පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 9,401,296 කින් එනම් සියයට 22 කින් වර්ධනය වී තිබුණි. ප්‍රධාන ආදායම් හා වියදම් විචලනයන් පහත දැක්වේ.
<table>
<tr><th></th><th>2012</th><th>2011</th><th>විචලනය</th><th>විචලනයේ ප්‍රතිශතය සියයට</th></tr>
<tr><td></td><td>රු.</td><td>රු.</td><td>රු.</td><td></td></tr>
<tr><td>ආදායම්</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>පුනරාවර්තන ප්‍රදාන</td><td>1,085,874,583</td><td>640,903,460</td><td>444,971,123</td><td>69</td></tr>
<tr><td>ප්‍රාග්ධන ප්‍රදාන</td><td>22,991,495</td><td>9,221,251</td><td>13,770,244</td><td>149</td></tr>
<tr><td>දකුණු ආසියාතික විශ්වවිද්‍යාල වලට දායකය</td><td>70,359,281</td><td>28,641,193</td><td>41,718,088</td><td>146</td></tr>
<tr><td>දැනුම වැඩි දියුණු කිරීම සහ ආයතනික සංවර්ධනය සඳහා ප්‍රාග්ධන ප්‍රධාන</td><td>398,514,723</td><td>440,534,432</td><td>(42,019,709)</td><td>(10)</td></tr>
<tr><td>වෙනත්</td><td>19,739,390</td><td>12,003,005</td><td>7,736,385</td><td>64</td></tr>
<tr><td>වියදම්</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>සැපයුම්</td><td>10,896,944</td><td>8,422,527</td><td>2,474,417</td><td>29</td></tr>
<tr><td>වෙනත් ආහාර වියදම්</td><td>36,269,554</td><td>26,191,382</td><td>10,078,172</td><td>38</td></tr>
<tr><td>ශිෂ්‍ය මූල්‍ය සහාය Student Financial Assistance)</td><td>384,860,380</td><td>483,898,368</td><td>(99,037,988)</td><td>20</td></tr>
<tr><td>විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා මූල්‍ය සහාය</td><td>993,956,286</td><td>469,175,624</td><td>524,780,662</td><td>112</td></tr>
</table></td><td>නිරීක්ෂණ සමඟ එකඟ වේ.</td><td></td></tr>
</table>

මූලා ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>			

4.1 <u>කාර්ය සාධනය</u>	පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.
	
	(අ) පසුගිය අධ්‍යයව වර්ෂ තුනක විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒ ඒ වර්ෂ සඳහා නිදහස් කල මුදල් සහ එක් ශිෂ්‍යයෙකු සඳහා නිදහස් කරන ලද සාමාන්‍ය මුදල් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.
	
	  — <u>2011/2012</u> — <u>2010/2011</u> — <u>2009/2010</u>
	විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව — 141,411 — 142,516 — 125,284
	විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාලයට තෝරාගත් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස (සියයට) — 20 — 15 — 17
	
	  — <u>2012</u> — <u>2011</u> — <u>2010</u>
	වැය කල පුනරාවර්තන වියදම (රු.'000) — 14,611,003 — 12,961,095 — 10,865,900
	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව — 72,937 — 77,640 — 73,398
	එක් ශිෂ්‍යයෙකු සඳහා සාමාන්‍ය පුනරාවර්තන වියදම (රු) — 200,323 — 166,938 — 148,040
		නිරීක්ෂණ සමඟ එකඟ වේ.	විශ්වවිද්‍යාල සඳහා තෝරාගනු ලැබූ සිසුන් විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ සිසුන්ගේ ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කිරීමට වඩා විශ්වවිද්‍යාල සඳහා අයදුම් කල සිසුන්ගේ ප්‍රතිශතයක් ලෙස පෙන්වීම වඩාත් තාත්වික වේ.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
	2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 20 ක් පමණක් විශ්වවිද්‍යාල වලට බඳවා ගෙන තිබුණු අතර එක් ශිෂ්‍යයෙකු සඳහා සාමාන්‍ය පුනරාවර්තන වියදම රු. 200,323 ක් වී තුබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාල වලට ඉල්ලුම් කර තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 49 ක් පමණක් විශ්වවිද්‍යාල සඳහා තෝරාගෙන තිබුණි. (ආ) <u>යාපනය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කිරීම</u> යාපනය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයක් ස්ථාපිත කිරීමේ කටයුතු සඳහා වාර්තාවක් ලබා ගැනීමට මහාචාර්ය වරයෙකු පත්කර 2010 නොවැම්බර් සිට 2011 ජූලි දක්වා රු. 730,552 ක් ගෙවා තිබුණු අතර ඔහුගේ වාර්තාව අනුව ඉංජිනේරු පීඨයක් යාපනය විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කලයුතු බව හා 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් පනහක් බඳවා ගැනීම සිදුකල යුතු බවත් 2013 වර්ෂය වන විට සිසුන් සියයක් දක්වා වර්ධනය කළයුතු බවත් දක්වා තිබුණද 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා එම විශ්වවිද්‍යාලයට සිසුන් බඳවාගෙන නොතිබුණි.	2011 නොවැම්බර් 05 දින සිට ක්‍රියාත්මක වන පරිදි යාපනය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ස්ථාපිත කර ඇත. ඒ සඳහා යටිතල පහසුකම් සැපයීමේ කටයුතු මේ වන විට කරගෙන යන අතර, රු. මිලියන 2400 වටිනාකමින් යුතු යටිතල පහසුකමු කැබිනට් මණ්ඩලය විසින් අනුමතකර ඇත.	යාපනය විශ්වවිද්‍යාලයේ අරවියර් නගරයෙහි යෝජිත යාපනය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ස්ථාපිත කිරීම සඳහා 2012.12.19 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, 2014 වර්ෂයේ ඉදිකිරීම කටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
	(ඇ) <u>විශ්වවිද්‍යාල වලට සිසුන් තෝරා ගැනීම හා ඇතුළත් කර ගැනීම සඳහා මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම</u> විශ්වවිද්‍යාල වලට සිසුන් තෝරා ගැනීම සඳහා මෘදුකාංග පද්ධතිය කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යාපනායතනය (University of Colombo School of Computing) වෙතින් ස්ථාපිත කර ගැනීමේ කොන්ත්‍රාත්තුව සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 80 ක් හෙවත් රු. 1,520,000 ක මුදලක් 2012 අප්‍රේල් 03 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එම අධ්‍යාපනායෙනයට ලෙවා තිබුණි. මෙම ගෙවීම 2012 පෙබරවාරි 09 දිනැති අංක 843.5.3 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, 21 වන සියවසට උසස් අධ්‍යාපන ව්‍යාපෘතියෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වේ. විශ්වවිද්‍යාල ප්‍රවේශ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමේදී පහත සඳහන් හේතූන් මත එය අපේක්ෂිත කාලසීමාව තුල අවසන් කිරීමට නොහැකි විය. * විශ්වවිද්‍යාල ප්‍රවේශ කාර්ය අතිශයින් සංකීර්ණ ක්‍රමවේදයක් වන බැවින් මෘදුකාංග පද්ධතිය පරීක්ෂා කිරීම සඳහා පසුගිය අධ්‍යයන වර්ෂයක් භාවිතා කිරීමට නොහැකි වීම හේතුවෙන් 2011/2012 අධ්‍යයන වර්ෂය වන තෙක් ප්‍රමාද වීම. * 2011 /2012 අධ්‍යයන වර්ෂය හා සම්බන්ධ ප්‍රවේශ ප්‍රතිපත්තිය/ක්‍රමවේදය ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවක් අනුව නැවත සැකසීමට සිදුවිය. මේ අයුරින් ප්‍රවේශ පද්ධතිය පරිගණක ගත කිරීම ප්‍රමාද වූ නිසා IRQUE ව්‍යාපෘති කාලසීමාව අවසන් කිරීමට ප්‍රථම ප්‍රතිපාදන ලබාගැනීමට නොහැකි විය.	නව ලෝක බැංකු ව්‍යාපෘතිය (HETC) මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි වෙනත් පරිගණක වැඩසටහන් වෙනුවෙන් එම ප්‍රතිපාදන ලබාදීම සඳහා සලකා බලන බව දැනුම් දී ඇත.

මූලා ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
	(ඇ) <u>මධ්‍යගත අභ්‍යන්තර විගණන ක්‍රමයක් ඇති කිරීම</u> විශ්වවිද්‍යාල පද්ධතිය තුල මධ්‍යගත අභ්‍යන්තර විගණන ක්‍රමයක් ඇති කිරීම වෙනුවෙන් කරුණු විමර්ශනය කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා 2007 මාර්තු 05 දින සිට මසකට 50,000 ක ගෙවීමක් මත මාස 06 ක් සඳහා රු. 300,000 ක් වැය කර උපදේශකයකු පත්කර තිබුණි. උපදේශකවරයා 2007 අප්‍රේල් 11 දින සියළු කරුණු ඇතුළත් කර වාර්තාවක් ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇතත් මෙම වාර්තාව වසර 5 ක් තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	නිරීක්ෂණ සමඟ එකඟ වේ	විශ්වවිද්‍යාල පද්ධතිය තුල මධ්‍යගත අභ්‍යන්තර විගණන ක්‍රමයක් ඇති කිරීම සඳහා වූ උපදේශක වාර්තාවේ නිර්දේශ පියවරින් පියවර ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ.
4.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>	පහත සඳහන් කරුණු නිරීක්ෂනය විය. (අ) 2012 වර්ෂය සඳහා දැනුම වැඩි දියුණු කිරීම සහ ආයතනික සංවර්ධනය (KEID) වෙනුවෙන් උසස් අධ්‍යාපනික ආයතන 20 ක් සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එකතුව රු. 396,994,000 ක මුදලක් ලබාදී තිබුණු නමුත් 2012 වර්ෂය අවසානයට උපයෝජනය සියයට 50 ට අඩුවූ අවස්ථා 13 ක් නිරීක්ෂණය විය.	නිරීක්ෂණ සමඟ එකඟ වේ	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මුදලින් ලබාදුන් ප්‍රතිපාදන වියදම් කිරීම සම්බන්ධ පසු විපරම් කරනු ලබන අතර, 2012.12.31 වන දිනට මුදල් උපයෝජනයට අදාල වාර්තා ඇමුණුම - 1 යටතේ ඇතුලත් කර ඇත.

මූලාා ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
	(ආ) තෝරාගත් ජාතික විශ්වවිද්‍යාල 6 ක් ලෝක තත්වයේ විශ්වවිද්‍යාල දක්වා නගා සිටුවීම ලෝක තත්වයේ විශ්වවිද්‍යාල දක්වා නගා සිටුවීම සඳහා විශ්වවිද්‍යාල 06 කට, 2011 හා 2012 වර්ෂ සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 100 හා රුපියල් මිලියන 75 බැගින් ලබාදී ඇතත් මොරටුව සහ රුහුණු විශ්වවිද්‍යාල වල 2011 වර්ෂයට වඩා 2012 වර්ෂයේ ලෝක තත්වය පහල මට්ටමකට වැටී තිබුණි.	උක්ත ව්‍යාපෘතිය යටතේ පේරාදෙණිය, මොරටුව, කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, කැළණිය සහ රුහුණ යන විශ්වවිද්‍යාල සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු. මිලියන 450 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. එම මුදල් අදාල ව්‍යාපෘතිය සඳහා උපයෝජනය කිරීමේ වගකීම ඒ ඒ විශ්වවිද්‍යාපයට පැවරී ඇති අතර ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබාගැනිමටද අදාල විශ්වවිද්‍යාල කටයුතු කලයුතුවේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උක්ත ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචන කාර්යය සඳහා අදාල විශ්වවිද්‍යාල සඳහා වන ජාත්‍යන්තර විශ්වවිද්‍යාල දර්ශකය (World University Rank) ද එක් නිර්නායකයක් වශයෙන් උපයෝගී කරගෙන ඇති අතර එම තොරතුරු ඇමුණුම 2 යටතේ දැක්වේග	අර්ධවාර්ෂික හා වාර්ෂික ප්‍රගති සමාලෝචන වාර්තා හා රැස්වීම් මගින් අදාල ප්‍රගතිය සොයා බලන අතර, අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
4.3 <u>මතභේදයට තුඩුදෙන ගණුදෙනු</u>	ගිවිසුම් කඩකිරීම් වලින් අයකරගත් මුදල් රජයේ ආදායමට බැර කිරීම වෙනුවට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 7373 ට අනුව ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගේ අරමුදලක් එක් එක විශ්වවිද්‍යාල විසින් නඩත්තු කරමින් ඉන් ලැබෙන ආදායම විශ්වවිද්‍යාල වල විවිධ වියදම් සඳහා යොදාගෙන තිබුණි. විශ්වවිද්‍යාල 19 ක් සම්බන්ධයෙන් සිදුකල නියැදි පරීක්ෂාවට අනුව මෙම අරමුදලේ එකතුව රු. 548,714,372 ක් විය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගිවිසුම් බැදුම්කර කඩකිරීමේ අරමුදලේ (Bond Violation Fund) ශේෂය රු. 843,258 ක් ව පැවතුණි.	මහා භාණ්ඩාගාරයේ අනුමැතියට යටත්ව මෙම අරමුදල පිහිටුවා ඇත.	අරමුදලේ ශේෂය ආයෝජනය කිරීමට කටයුතු යොදා ඇත.
4.4 <u>අරමුදල් ඌණ උපයෝජනය</u>	පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. (අ) 2012 වර්ෂය අවසානයට වැය නොකල (ස්ථාවර වත්කම් මිලදී ගැනීම්) ප්‍රාග්ධන ප්‍රදාන (unspent F/A Account Grant) ශේෂය රු. 4,066,949/- ක් වූ අතර, 2012 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට (ස්ථාවර වත්කම් මිලදී ගැනීමට) ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ඉදිරියට ගෙන ආ ශේෂයවිහා එකතුව වූ රර. 6,493,386/- හා සැලකීමේදී උපයෝජනය නොකල ප්‍රතිශතය සියයට 30 ක් විය.	ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා වන ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ වැය නොකල ප්‍රතිපාදන වටිනාකම රු. 3,560,652/- ක් වන අතර වර්ෂය තුල වියදම රු. 8,620,436/- ක් වේ. ආරම්භක ශේෂය සහ වර්ෂය තුල ලද ප්‍රතිපාදන වල එකතුව රු. 12,187,089/- කි. ඒ අනුව වියදම් නොකරන ලද ප්‍රතිශතය 29% ක් වේ	අදාල ගැලපීම් ගිණුම් වල සටහන් කොට ඇත.

<table>
<tr><th></th><th></th><th></th><th></th></tr>
<tr><th>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්</th><th>විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු</th><th>පිළිතුරු හා නිරීක්ෂණ</th><th>ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය</th></tr>
<tr><td></td><td>(ආ) එකතුව රු. 9,872,568/- ක් වූ විශේෂ අරමුල් 3 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පැවතුනද එම අරමුදල් ක්‍රියාකාරී මට්ටමක නොපැවතුනි.</td><td>නිරීක්ෂණ සමග එකඟ නොවේ.
<table>
<tr><th>අරමුදලේ නම</th><th>හේතුව</th></tr>
<tr><td>1. මධ්‍යම පර්යේෂණ අරමුදල (Central Research)</td><td rowspan="2">මෙම අරමුදල් 2012 වර්ෂය තුලදී ක්‍රියාකාරීව නොපැවතුන අතර, මේ වන විට එම අරමුදල් උපයෝජනය සඳහා සැලසුම් සකස් කරමින් පවතී.</td></tr>
<tr><td>2. ශ්‍රීමතී ඉන්ද්‍රානි අනුස්මරණ අරමුදල</td></tr>
<tr><td>3. සේවක සංවර්ධන අරමුදල</td><td>මෙම අරමුදලේ මුදල් ආයෝජනයෙන් ලැබෙන ආදායම සේවක සංවර්ධන වැඩසටහන් සඳහා යොදාගනු ලබන අතර මෙම අරමුදල අඛණ්ඩවම සේවක සංවර්ධන වැඩ කටයුතු සඳහා උපයෝජනය වෙමින් පවතී.</td></tr>
</table></td><td>මෙම සියලු අරමුදල් ඒවා පිහිටුවීමේ අරමුනට අනුව අදාල කටයුතු සිදුකරනු ඇත. සේවක සංවර්ධන අරමුදල මඟින් විවිධ සේවක සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.</td></tr>
</table>

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
		4. ජාතික විද්‍යා පදනම — විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ජාතික විද්‍යා පදනමෙන් ලැබුනු ප්‍රතිපාදන ඉතිරිය මෙයින් නියෝජනය වන අතර මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආදායමට ගැනීමට කටයුතු යොදා ඇත.	අදාල ගැලපීම් අවසන් ගිණුම් වල සිදුකර ඇත.
	(ඇ) එකතුව රු. 11,561,215 ක ශෂ්‍යාත්ව අරමුල් 98 කින් පමණක් සක්‍රියව පැවති අතර, රු. 6,973,948 ක වූ ශිෂ්‍යාත්ව අරමුදල් 74 ක් අක්‍රියව පැවතුනි. 2012 වර්ෂය තුලදී ශිෂ්‍යාත්ව 10 ක් පමණක් ලබාදී තිබුනි.	මේ වනවිට සක්‍රියව නෙපවතින සියළුම ශිෂ්‍යාත්ව අරමුදල් එකතුකර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නමින් පොදු ශිෂ්‍යාත්ව අරමුදලක් පිහිටුවා ඇති අතර, එහි ආදායම පදනම් කරගෙන වාර්ෂිකව ශිෂ්‍යාත්ව ප්‍රදානය කිරීමට සැලසුම් කර ඇත.	2013.02.02 දින පැවති 867 වැනි කොමිෂන් සභා රැස්වීමේදී 2012.12.31 දිනට අක්‍රියව පැවති ශිෂ්‍යාත්ව අරමුදල් ඒකාබද්ධ කොට පොදු ශිෂ්‍යාත්ව අරමුදලක් පිහිටුවීමට අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව එම අරමුදල පිහිටුවා ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
			2011/2012 වර්ෂයේ සිට රු. 2500/- මාසික වාරික වටිනාකමකින් යුත් ශිෂ්‍යත්ව 10 ක් පිරිනැමීමට කටයුතු යොදා ඇත.
4.5 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>	කොමිෂන් සභාවෙ 2012 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩල 288 ක් ද තත්‍ය කාර්ය මන්ඩල 200 ක් ද වූ අතර සේවකයින් 88 දෙනෙකුගේ ඌනතාවයක් නිරීක්ෂණය විය.	එකඟවේ	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අවශ්‍යතාවය පරිදි පුරප්පාඩු පිරවීමේ කටයුතු කරගෙන යනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
4.6 <u>වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්</u>	1977 ජනවාරි 24 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 116 හා අංක පීඊඩී/12 දරන හා 2003 ජූනි 02 දානැති භාණ්ඩාගාර චක්‍රලේඛ 9ශ4 ඡේදයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවකයින් තුන්දෙනෙකු අමාත්‍යාංශයේ රාජකාරි සඳහා යොදවා 2012 වර්ෂයේදී එම සේවකයින්ට රු. 721,072 ක් වැටුප් වශයෙන් ගෙවීම් කර තිබුණි.	වර්තමානයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සහ උසස් අධ්‍යාපන ආයතන වලට බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය මත කොමිෂන් සභා චක්‍රලේඛ අංක 876 ට අනුව පහත සඳහන් සේවකයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවය සඳහා බඳවා ගන්නා ලදී. 1. අයි. එන්. දයාරත්න මෙය - ලිපිකරු 2. ඩබ්ලිව්. ජී. හේමපාල - කම්කරු 3. සුමුදු ලක්මාලි - පරිගණක යෙදුම් සහකාර ඉහත සඳහන් සේවක මහත්ම මහත්මීන් තිදෙනා උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ ඉල්ලීම මත හා කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ අමාත්‍යතුමාගේ කාර්යාලයේ සේවය සඳහා අනුයුක්ත කරනු ලැබ ඇත. ඒ අනුව එකී තනතුරු වලට අදාළව වැටුප් ගෙවීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සිදු කර ඇත.	ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ ඉල්ලීම පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය මත කම්කරුවන් දෙදෙනෙකු උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිදහස් කර ඇත. එයින් එක් කම්කරුවෙකු තවදුරටත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවයේ නියුතුව සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
5. <u>ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය</u>			
5.1 <u>වාර්ෂික වාර්තා සභාගත කිරීම</u>	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 26 වන වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී මාස 06 ක් ඉකුත්වීමට පෙර වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2011 විර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුනි.	නිරීක්ෂණ සමඟ එකඟ නොවේ	මේ වනවිට 2011 වාර්ෂික වාර්තාව සභාගත කර ඇත.
5.2 <u>ප්‍රතිසම්පාදන සැලස්ම</u>	කොමිෂන් සභාව විසින් 2012 වර්ෂය සඳහා රු. 8,626,436 ක ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ අනුමත ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුනි.	එකඟ නොවේ 2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත.	2014 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුම් සකස්-කොට ඇත.
5.3 <u>අයවැය පාලනය</u>	2003 ජූනි 02 දිනැති අංක පී.ඊ.ඩී. 12 දරන චක්‍රලේඛයේ 5.2.1 ප්‍රකාරව අයවැය ලේඛණය පිළියෙල කර නොතිබුණු අතර අයවැය ගත වියදම් හා සත්‍ය වියදම් අතර සියයට 42 සිට සියයට 93 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛණය ලේඛණය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුනි	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අයවැය ලේඛණය පාලන ක්‍රමයක් ලෙසින් සෑම විටම උපයෝගී කරගනු ලැබේ.	

මූලාශ්‍ර ප්‍රකාශන පිළිබඳ බලපෑම්	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	පිළිතුරු හා නිරීක්ෂණ	ගෙන ඇති පියවර හා එහි වර්තමාන තත්වය හා ක්‍රියාකාරිත්වය
6. <u>පද්ධති හා පාලනයන්</u>	විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය. (අ) ගිණුම්කරණය (ආ) ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනය (ඇ) සේවක බඳවා ගැනීම්	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින එහි පද්ධති හා පාලන පිළිබඳව වරින් වර විශ්ලේෂණ කරන අතර, එම පද්ධති හා පාලන නිරන්තරයෙන් වැඩි දියුණු කිරීමට කටයුතු කරනු ලැබේ.	

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල
2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

	2012 රුපියල්	2011 රුපියල්
ජංගම නොවන වත්කම්		
ආයෝජන		
භාණ්ඩාගාර බැඳුම්කර	550,129,273	601,477,514
ස්ථාවර තැන්පතු	1,898,828,833	1,399,000,000
	2,448,958,106	2,000,477,514
ජංගම වත්කම්		
ලැබිය යුතු දායක මුදල්	54,476,918	16,013,582
ලැබිය යුතු ආයෝජන ආදායම	250,377,117	234,842,312
කෙටිකාලීන තැන්පතු	5,000,000	-
මුදල් සහ මුදල් සමාන අයිතම	1,298,524	6,929,521
	311,152,559	257,785,415
මුළු වත්කම්	2,760,110,665	2,258,262,929
නියෝජනය වන්නේ		
සාමාජික අරමුදල් සහ සංචිත		
දායක අරමුදල	2,432,210,621	1,957,687,424
විශ්‍රාම අරමුදල	78,674,647	76,114,209
සමුච්චිත ආදායම	220,253,446	201,906,600
	2,731,138,714	2,235,708,233
ජංගම වගකීම්		
විවිධ ණයහිමියෝ	138,000	105,000
ගෙවිය යුතු ආදායම් බදු	24,374,301	20,051,910
සාමාජිකයන්ට ගෙවිය යුතු මුදල්	4,395,380	2,397,786
විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වෙත ගෙවිය යුතු මුදල්	64,270	-
	28,971,951	22,554,696
මුළු වගකීම්	2,760,110,665	2,258,262,929

අත්සන් කළේ තිස්ස නන්දසේන
ලේකම්

අත්සන් කළේ ආර් ජී.යු රණවීර
ගණකාධිකාරී

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

2012 දෙසැම්බර් 31 දිනට අවසන් වු වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය

		සටහන	2012 රුපියල්	2011 රුපියල්
ආදායම				
ආයෝජන ආදායම්		9	235,596,188	224,093,091
අඩු කළා:	ආදායම් බදු		20,113,517	18,661,713
			215,482,671	205,431,378
අඩු කළා :	වියදම්			
	දායක අරමුදල් සඳහා පොලිය		189,115,287	138,335,257
	විශ්‍රාම අරමුදල් සඳහා පොලිය		6,153,684	4,583,812
	විශ්‍රාම අරමුදලේ ගැලපීම			
	විවිධ වියදම්	10	1,755,904	1,303,638
	බැංකු ගාස්තු	11	100,200	45,704
			10,750	11,568
			197,135,825	144,279,979
	වියදම ඉක්ම වු ආදායම		18,346,846	61,151,399
	පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙනා ශේෂය		201,906,600	140,755,201
	ශේෂ පත්‍රයට මාරු කළ ශේෂය		**220,253,446**	**201,906,600**

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල (රුපියල්)	විශ්‍රාමිකයන්ගේ අරමුදල (රුපියල්)	දායකයන්ගේ අරමුදල (රුපියල්)	එකතුව (රුපියල්)
2010 දෙසැම්බර් 31 දිනට ශේෂය	140,755,201	59,972,666	1,632,516,673	1,833,244,540
2011 වර්ෂය සඳහා අතිරික්තය	61,151,399			61,151,399
සාවද්‍ය දායකත්වය මත ලැබූ පොලිය			26,694	26,694
පවත්නා වර්ෂයේ ආදායමෙන් වන හුවමාරු		1,303,638		1,303,638
විශ්‍රාමිකයන්ගේ ගිණුම් වලින් ලැබුණු දායකත්ව අරමුදල්		157,698		157,698
පවත්නා වර්ෂයේ දායකත්ව අරමුදල්			222,020,068	222,020,068
එකවර ගෙවන ලද මුදල් ආපසු ලබාදීම			(7,798,240)	(7,798,240)
දායක අරමුදල/විශ්‍රාම අරමුදල වෙත මාරු කිරීම්		26,963,680	(26,963,680)	-
වි.වි. අර්ථසාධක අරමුදල වෙත මාරු කිරීම්			(449,347)	(449,347)
2011 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් ගෙවීම		(16,867,284)		(16,867,284)
විශ්‍රාම අරමුදලේ / දායක අරමුදලේ පොලිය		4,583,812	138,335,256	142,919,068
2011 දෙසැම්බර් 31 දිනට ශේෂය	201,906,600	76,114,210	1,957,687,424	2,235,708,234
2012 වර්ෂය සඳහා අතිරික්තය	18,346,846			18,346,846
පවත්නා වර්ෂයයේ ආදායමෙන් වන හුවමාරු		1,755,904		1,755,904
සාවද්‍ය දායකත්වයන් නිවැරදි කිරීම			(1,136)	(1,136)
පවත්නා වර්ෂයයේ දායකත්ව අරමුදල			317,109,810	317,109,810
එකවර ගෙවන ලද මුදල් ආපසු ලබාදීම			(17,744,027)	(17,744,027)
දායක අරමුදල/විශ්‍රාම අරමුදල වෙත මාරු කිරීම්		12,145,935	(12,145,935)	-
වි.වි. අර්ථසාධක අරමුදල වෙත මාරු කිරීම්			(1,810,802)	(1,810,802)
වර්ෂයේ දී විශ්‍රාම වැටුප් ගෙවීම		(17,495,086)		(17,495,086)
විශ්‍රාම අරමුදලේ / දායක අරමුදලේ පොලිය		6,153,684	189,115,287	195,268,971
2012 දෙසැම්බර් 31 දිනට ශේෂය	**220,253,446**	**78,674,647**	**2,432,210,621**	**2,731,138,714**

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2012 (රුපි)	2011 (රුපි)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය		
මෙහෙයුම් අතිරික්තය /(ඌනතාවය)	**18,346,846**	**61,151,399**
ගැලපීම්		
ආයෝජන ආදයම	(235,596,188)	(224,093,091)
මෙහෙයුම් අතිරික්තය /(ඌනතාවය)	**(217,249,342)**	**(162,941,692)**
කාරක ප්‍රාග්ධනය වෙනස් වීම		
ලැබිය යුතු දායකත්ව මුදල් (වැඩිවීම)/ අඩුවීම	(38,463,336)	(7,870,860)
ලැබිය යුතු පොළිය (වැඩිවීම)/ අඩුවීම	(15,534,805)	(75,975,507)
කෙටි කාලීන තැන්පතු (වැඩිවීම)/ අඩුවීම	(5,000,000)	25,000,000
විවිධ ණයගැතියන්ගේ (අඩු වීම)/ වැඩිවීම	33,000	(13,239)
ගෙවිය යුතු ආදායම් බදු (අඩුවීම)/ වැඩිවීම	4,322,391	3,035,732
සාමාජිකයන් වෙත කළ යුතු ගෙවීම් (අඩුවීම)/ වැඩිවීම	1,997,594	288,789
වි.වි.ප්‍ර.කො.ස. සහ උ.අ.ආ. වෙත ගෙවීම් (අඩුවීම)/ වැඩිවීම	64,270	
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(269,830,228)**	**(218,476,777)**
මුල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය		
සාමාජික සහ විශ්‍රාමික අරමුදල් වැඩිවීම	477,083,635	341,286,337
මුල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**477,083,635**	**341,286,337**
අයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය		
භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනිම	51,348,241	5,913,269
ස්ථාවර තැන්පතු මිලදී ගැනිම	(499,828,833)	(352,000,000)
ආයෝජන ආදායම	235,596,188	224,093,091
අයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(212,884,404)**	**(121,993,640)**
ශුද්ධ මුදල් ප්‍රවාහය	(5,630,997)	815,920
01-01-2012 දිනට මුදල	6,929,521	6,113,601
31-12-2012 දිනට මුදල	**1,298,524**	**6,929,521**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: ඊඩී/බී/පීඑන්එෆ්/එෆ්ඒ/2012
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date: 2013 ඔක්තෝබර් 23 දින

සභාපති,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති

පිටපත් :-
1. ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් , මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: එසී/බී/පීඑන්එෆ්/එෆ්එ/2012
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date: 2013 ඔක්තෝබර් 23 දින

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12(5) උපවගන්තිය අනුව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1:2. <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3. <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

2.2.1 <u>ලැබිය යුතු ගිණුම්</u>

2012 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා විශ්වවිද්‍යාලවලින් විස්තර ගෙන්වාගෙන විශ්‍රාම වැටුප් අරමුදලට සේවක අර්ථසාධක අරමුදලින් ලැබිය යුතු ජීවන වියදම් දීමනාවට අදාල වූ රු.32,137,660 ක් අයකර ගෙන නොතිබුණි.

2.2.2 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 1999 අප්‍රේල් 09 දිනැති අංක අමප/99/0438/11/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය.	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නිලධාරීන් වෙනුවෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන සියයට 25 ක මුදලින් සියයට 10 ක් විශ්‍රාම වැටුප් අරමුදලට බැර කළ යුතු වේ. එහෙත් 1999 ජුනි 10 දිනැති අංක 747 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාර සේව්‍යයා විසින් අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන සියයට 15 ක දායක මුදලින් 8/15 ක ප්‍රමාණයක් විශ්‍රාම වැටුප් අරමුදලට බැර කිරීමට කටයුතු කර තිබුණි. 2011 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් 2013 මාර්තු 07 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදීද මෙම ගැටළුව විසදා ගැනීමට කටයුතු කරන ලෙස නියෝග කළද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 97 වගන්තිය.	2012 වර්ෂයේදී විශ්‍රාම වැටුප් අරමුදලේ පිළිවෙලින් රු.207,724,261 ක හා රු.197,135,825 ක ආදායම් හා වියදම් ගිණුම්ගත කර තිබුණද, අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි.
(ඇ) 2005 ජනවාරි 28 දිනැති අංක පා/ආයතන/2004 දරන කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ලිපිය	2011 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සංශෝධනය කිරීමට කටයුතු කිරීමකින් තොරව භාණ්ඩාගාර එකඟත්වය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අධ්‍යයන දීමනාව, මුළු ඉපයීම් යන නිර්වචනය තුළට ඇතුළත් කර 2013 ජනවාරි 08 දින අංක 1000 දරන චක්‍රලේඛය නිකුත් කර තිබුණි. යථෝක්ත චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර අධ්‍යයන දීමනාව

	ඇතුළත් කිරීම හේතුවෙන් විශ්‍රාම වැටුප් අරමුදලට වැඩිපුර ලැබුණු රුපියල් මිලියන 248.57 පියවීමට හෝ විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට 2012 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.
(ඇ) 1999 ජුනි 10 දිනැති අංක 747 දරන විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛය.	විශ්‍රාම වැටුප් ක්‍රමය සෑම අවුරුදු 3 කට වරක්ම ඇගයීමකට ලක් කර නව සාමාජිකයන්ගේ දායකවීම් / ප්‍රතිලාභ ගෙවීම් නිර්ක්ෂණය කළයුතු වුවද, එම ඇගයීම් 2008 දෙසැම්බර් 31 දිනෙන් පසුව සිදුකර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ රු.10,588,436 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.61,151,399 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.50,562,963 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආයෝජන ආදායම රු.3,744,687 කින් වැඩිවී තිබියදී සාමාජික හා විශ්‍රාමික ගිණුම් සඳහා පොළී ගෙවීම් පිළිවෙලින් රු.50,780,030 කින් හා රු.1,569,872 කින් වැඩිවීමද, විශ්‍රාමික අරමුදල් ගැලපීම රු.452,266 කින් වැඩිවීම යන කරුණු එම පිරිහීම කෙරෙහි විශේෂයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.50,562,963 කින් එනම් සියයට 83 කින් අඩු වී තිබුණි. ප්‍රධාන ආදායම් හා වියදම් විචලනයන් පහත දැක්වේ.

	2012	2011	විචලනය	විචලනයේ ප්‍රතිශතය
	රු.	රු.	රු.	සියයට
ආයෝජන ආදායම	227,837,778	224,093,091	3,744,687	2
සාමාජික ගිණුම් සඳහා පොළී	189,115,287	138,335,257	50,780,030	37
විශ්‍රාම ගිණුම් සඳහා පොළී	6,153,684	4,583,812	1,569,872	34
විශ්‍රාමික අරමුදල් ගැලපීම	1,755,904	1,303,638	452,266	35

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1999 සැප්තැම්බර් 01 දින පිහිටවූ විශ්‍රාම වැටුප් අරමුදලේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයන්ගේ සංඛ්‍යාව 121 ක් වූ අතර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ විශ්‍රාම වැටුප් මුදල රු.17,495,086 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයේදී විශ්‍රාමිකයන්ගේ අරමුදලේ බැරට තිබුණු ශේෂය රු.78,674,647 ක් වූ අතර එම ශේෂයෙන් ඉදිරි කාලයට විශ්‍රාම වැටුප් ගෙවිය හැකි වනුයේ ඉදිරි වර්ෂවල පැවතිය හැකි වගකීම් නොසලකා දළ වශයෙන් වර්ෂ 4 1/2 ක කාලයක් සඳහා පමණක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විශ්‍රාමිකයින්ගේ පෞද්ගලික ගිණුම්වල ශේෂයක් නොතිබියදී එකතුව රු.1,755,904 ක මුදලක් සාමාජිකයන් 15 දෙනෙකුට විශ්‍රාම වැටුප් ලෙස ගෙවා තිබුණි. 2008 වර්ෂය හා සලකා බැලීමේදී ගිණුම්වල පෞද්ගලික ශේෂ නොතිබියදී විශ්‍රාම වැටුප් ගෙවූ සේවක සංඛ්‍යාව සියයට 400 කින් වැඩි වී තිබුණු අතර ඒ සඳහා සිදුකළ වියදමද 2008 වර්ෂය හා සලකා බැලීමේදී සියයට 1,105 කින් වර්ධනය වී තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

1999 ජූනි 10 දිනැති අංක 747 දරන කොමිෂන් සභා චක්‍රලේඛය මගින් විශ්වවිද්‍යාල සඳහා පිහිටුවා තිබූ විශ්‍රාම වැටුප් අරමුදලේ වියදම් ලෙස පොළී, විගණන ගාස්තු හා බැංකු ගාස්තු පමණක් ගිණුම් ගත කර තිබුණු අතර අනෙකුත් පරිපාලන හා වෙනත් වියදම් විශ්‍රාම වැටුප් අරමුදල යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකල යුතුය.

(අ) විශ්‍රාම වැටුප් ගෙවීම

(ආ) විශ්‍රාම වැටුප් ක්‍රමය ඇගයීම

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

වැඩබලන විගණකාධිපති.

විෂය	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපතිවෙත ඉදිරිපත් කිරීමට ඇති අදහස්	වර්තමාන තත්වය
2.2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම 2.2.1 ලැබිය යුතු ගිණුම්	2012 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා විශ්වවිද්‍යාලවලින් විස්තර ගෙන්වා ගෙන විශ්‍රාම වැටුප් අරමුදලට සේවක අර්ථ සාධක අරමුදලින් ලැබිය යුතු ජීවන වියදම් දීමනාවට අදාලව රු. 32,137,660/- ක් අයකර ගෙන නොතිබුණි.	2013.03.15 දින වන විට සියලුම මුදල් අය කර ගෙන ඇත.	2013.03.15 දිනවන විට සියලුම මුදල් අයකර ගෙන ඇත.
2.2.2 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම (අ)1999 අප්‍රේල් 09 දින හා අංකඅමප/99/0438/11/033 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය.	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නිළධාරීන් වෙනුවෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන 25% ක මුදලින් 10 % ක් විශ්‍රාම අරමුදලට බැර කල යුතු වේ. එහෙත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 මඟින් සේවායා විසින් අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන 15% ක දායක මුදලින් 8/15 ක ප්‍රමාණයක් විශ්‍රාම අරමුදලට බැර කිරීමට කටයුතු කර තිබුණි. 2011 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් 2013 මාර්තු 07 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදීද මෙම ගැටළුව විසඳා ගැනීමට කටයුතු කරන ලෙස නියෝග කලද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.	උසස්අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, භාණ්ඩාගාර ලේකම් තුමා සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව සකස් කළ කැබිනට් සංදේශය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2013/07/03 දින ඉදිරිපත්කර ඇත.	විශ්‍රාම වැටුප්දායක මුදලෙහි ප්‍රතිශතය සංශෝධනය කිරීම සම්බන්ධව වරින් වර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා මහා භාණ්ඩාගාර නියෝජිතයින් සමඟ සාකච්ඡා වට කීපයක් පවත්වන ලදී. ඒ අනුව සකස් කල අමාත්‍ය මණ්ඩල සංදේශය 2014/05/12 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දී ඇත.
(ආ) 1978 අංක 16 දරණ විශ්විද්‍යාල පනතේ 97 වගන්තිය.	2012 වර්ෂයේදී විශ්‍රාම වැටුප් අරමුදලේ පිළිවෙලින් රු. 207,724,261 ක හා රු. 197,135,825 ක ආදායම් හා වියදම් ගිණුම් ගත කර තිබුණද, අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමණාකාරීත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි.	එකඟවේ.	සකස් කරන ලද කෙටුම්පත් නියමාවලිය 2014/07/15 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

විෂය	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපතිවෙත ඉදිරිපත් කිරීමට ඇති අදහස්	වර්තමාන තත්වය
2.2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම 2.2.1 ලැබිය යුතු ගිණුම්	2012 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා විශ්වවිද්‍යාලවලින් විස්තර ගෙන්වා ගෙන විශ්‍රාම වැටුප් අරමුදලට සේවක අර්ථ සාධක අරමුදලින් ලැබිය යුතු ජීවන වියදම් දීමනාවට අදාලව රු. 32,137,660/- ක් අයකර ගෙන නොතිබුණි.	2013.03.15 දින වන විට සියලුම මුදල් අය කර ගෙන ඇත.	2013.03.15 දිනවන විට සියලුම මුදල් අයකර ගෙන ඇත.
2.2.2 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම (අ)1999 අප්‍රේල් 09 දින හා අංකඅමප/99/0438/11/033 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය.	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නිළධාරීන් වෙනුවෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන 25% ක මුදලින් 10 % ක් විශ්‍රාම අරමුදලට බැර කල යුතු වේ. එහෙත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 මඟින් සේව්‍යයා විසින් අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන 15% ක දායක මුදලින් 8/15 ක ප්‍රමාණයක් විශ්‍රාම අරමුදලට බැර කිරීමට කටයුතු කර තිබුණි. 2011 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් 2013 මාර්තු 07 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදීද මෙම ගැටළුව විසඳා ගැනීමට කටයුතු කරන ලෙස නියෝග කලද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.	උසස්අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, භාණ්ඩාගාර ලේකම් තුමා සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව සකස් කළ කැබිනට් සංදේශය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2013/07/03 දින ඉදිරිපත්කර ඇත.	විශ්‍රාම වැටුප්දායක මුදලෙහි ප්‍රතිශතය සංශෝධනය කිරීම සම්බන්ධව වරින් වර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා මහා භාණ්ඩාගාර නියෝජිතයින් සමඟ සාකච්ඡා වට කීපයක් පවත්වන ලදී. ඒ අනුව සකස් කල අමාත්‍ය මණ්ඩල සංදේශය 2014/05/12 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දී ඇත.
(ආ) 1978 අංක 16 දරණ විශ්විද්‍යාල පනතේ 97 වගන්තිය.	2012 වර්ෂයේදී විශ්‍රාම වැටුප් අරමුදලේ පිළිවෙලින් රු. 207,724,261 ක හා රු. 197,135,825 ක ආදායම් හා වියදම් ගිණුම් ගත කර තිබුණද, අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමණාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි.	එකඟවේ.	සකස් කරන ලද කෙටුම්පත් නියමාවලිය 2014/07/15 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

විෂය	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපතිවෙත ඉදිරිපත් කිරීමට ඇති අදහස්	වර්තමාන තත්වය
(ඇ) 2005 ජනවාරි 28 දින භාඅංක පා/ආයතන/2004 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය	2011/03/23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සංශෝධන කිරීමෙන් තොරව භාණ්ඩාගාර එකඟත්වයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2013/01/08 දිනැති අංක 1000 දරණ චක්‍ර ලේඛය නිකුත් කිරීම. මෙම චක්‍ර ලේඛය නිකුත් කිරීමට පෙර අධ්‍යයන දීමනාව ඇතුලත් කිරීම නිසා විශ්‍රාම වැටුප් අරමුදලට වැඩිපුර ලැබුණු රු.මි. 248.57 පියවීමට කටයුතු කර නොතිබුණි.	එවකට පැවති අධ්‍යයන කාර්යමණ්ඩල වැඩවර්ජනය නිම කිරිම සඳහා වූ එකඟතාවයක් මත මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ 2012.12.21 දිනැති අංක DMS/E1/B4/7/313/2 දරණ ලිපිය අනුව අධ්‍යයන දීමනාව, මුළු ඉපයීම් යන නිර්වචනයට ඇතුලත් කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2013.01.08 දිනැතිඅංක 1000 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. මෙ පිළිබඳව විශේෂ කැබිනට් අනුමැතියක් ලබා ගත යුතුද යන්න පිළිබඳව මහා භාණ්ඩාගාරයෙන් විමසා ඇති අතර ඒපිළිබඳව් පිළිතුරු අපේක්ෂාවෙන් සිටියි.	2005.07.01 දිනට පෙර සේවයට බඳවා ගන්නා ලද අධ්‍යයන කාර්ය මණ්ඩලයට අදාලව විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට හා සේවා නියුක්තිනයන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කිරීමේදී අධ්‍යයන දීමනාද සැලකිල්ලට ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගනු ලැබූ තීරණයට 2014 මැයි 29 දින අමාත්‍ය මණ්ඩල රුස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.
(ඇ) 1999 ජුනි 10 දිනැති අංක 747 දරණ විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍ර ලේඛය	විශ්‍රාම වැටුප් ක්‍රමය සෑම අවුරුදු 3 ට වරක්ම ඇගයීමට ලක් කර නව සාමාජිකයන්ගේ දායක විම්/ප්‍රතිලාභ ගෙවීම් නිරීක්ෂණය කල යුතු වුවද, එම ඇගයීම් 2008 දෙසැම්බර් 31 දිනෙන් පසුව සිදුකර නොතිබුණි.	2013/01/01 දිනට ජීව දත්ත ගණක වරයකු විසින් ඇගයීමට ලක් කර ඇත.	2012/12/31 දිනට ජීව දත්ත ගණක උපදේශක වරයකු විසින් ඇගයීමට ලක්කර ඇත. ඔහු විසින් දෙනු ලබන නිර්දේශ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

විෂය	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපතිවෙත ඉදිරිපත් කිරීමට ඇති අදහස්	වර්තමාන තත්වය
3. මූල්‍ය සමාලෝචන 3.1 මූල්‍ය ප්‍රතිඵල	ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ රු. 10,588,436 අතිරික්තය ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත්වර්ෂය සඳහා වූ අතිරික්තය රු. 61,151,399 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 50,562,963 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආයෝජන ආදායම රු.3,744,687 කින් වැඩි වී තිබියදී සාමාජික හා විශ්‍රාමික ගිණුම් සඳහා පොළී ගෙවීම් පිළිවෙලින් රු. 50,780,030 කින් හා රු. 1,569,872 කින් වැඩිවීමද, විශ්‍රාමික අරමුදලේ ගැලපීම රු. 452,266 කින් වැඩිවීම යන කරුණු එම පිරිහීම කෙරෙහි විශේෂයෙන් බලපා තිබුණි.	එකඟ වේ.	මූල්‍ය ප්‍රතිඵලසම්බන්ධයෙන් විගණකාධිපති වරයාගේ අදහස් සමඟ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එකඟ වේ.
4.මෙහෙයුම් සමාලෝචනය 4.1 කාර්ය සාධනය	(අ) 1999 සැප්තැම්බර් 01 දින පිහිට වූ අරමුදලේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව 121 ක් වූ අතර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ විශ්‍රාම වැටුප්රු. 17,495,086 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයේ දී විශ්‍රාමිකයන්ගේ අරමුදලේ බැරට ඇති ශේෂය රු. 78,674,647 ක් වූ අතර එම ශේෂයෙන් ඉදිරියට විශ්‍රම වැටුප ගෙවිය හැකිවනුයේ ඉදිරි වර්ෂවල පැවතිය හැකි වගකීම් නොසලකා වුවද දළ වශයෙන් වර්ෂ 4 1/2ක කාලයක් සඳහා පමණක්වී තිබුණි.	එකඟ වියනොහැක. විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප් ගෙවීම කරනුයේ පොදු විශ්‍රාම අරමුදලින් වන අතර මෙම පොදු විශ්‍රාම අරමුදලට වාර්ෂිකව බැර වන අතිරික්තය නිසා අරමුදල තව දුරටත් වර්ධනය වේ. තවද සමුච්චිත ආදායමද මේ සඳහා යොදා ගත හැකි වේ.	විශ්‍රාම වැටුපට බැරවන දායක මුදල් ගණනය කර ඇත්තේ 1999 වර්ෂයේදී ජීව ගණක විසින් කළ නිර්දේශ අනුවය. 2013 වර්ෂයේදී ලබා දුන් ජීව ගණක වාර්තාවේ නිර්දේශ කළමණාකරණ කමිටුව වෙත ඉදිරිපත් කොට තිබේ. ඉන් ලබා දෙන තීරණ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

විෂය	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපතිවෙත ඉදිරිපත් කිරීමට ඇති අදහස්	වර්තමාන තත්වය
		(2012/12/31 සමුච්චිතආදායම රු.212,495,036/-කි)	තවද විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවන ලද්දේ සමස්ථ සේවක සංඛ්‍යාව සැලකීමෙනි. ඒ අනුව සමස්ථ අරමුදල වර්ධනය වන බව පැහැදිලිය.
	(ආ) සමාලෝචිත වර්ෂයේ විශ්‍රාමිකයන්ගේ පෞද්ගලික ගිණුම් වල ශේෂයක් නොතිබියදී රු. 1,755,904 ක මුදලක් සාමාජිකයන් පහලොස් දෙනෙකුට විශ්‍රාම වැටුප් ලෙස ගෙවා තිබුණි. 2008 වර්ෂයහා සලකා බැලීමේ දී ගිණුම්වල පෞද්ගලික ශේෂ නොතිබියදී විශ්‍රාම වැටුප් ගෙවූ සේවකසංඛ්‍යාව 400%න් වැඩිවී තිබුණු අතර ඒ සඳහා සිදුකල වියදමද 2008 වර්ෂය හා සලකාබැලීමේදී 1,105% කින් වර්ධනය වී තිබුණි.	විශ්‍රාම වැටුපට බැරවන දායක මුදල් ගණනය කර ඇත්තේ 1999 වර්ෂයේදී ජීව ගණක විසින් කළ නිර්දේශ අනුවය. මේවන විට ජීව ගණකගේ නිර්දේශ ලැබී ඇති අතර ඒවා පදනම් කරගෙන වර්තමානයේ කටයුතු කරනු ලැබේ.	
4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා	1999 ජුනි 10 දිනැති අංක 747 දරණ කොමිෂන් සභා චක්‍ර ලේඛය මගින් විශ්වවිද්‍යාල සඳහා පිහිටුවා තිබූ විශ්‍රාම වැටුප් අරමුදලේ වියදම් ලෙස පොළී, විගණන ගාස්තු හා බැංකු ගාස්තු පමණක් ගිණුම් ගත කර තිබුණු අතර අනෙකුත් පරිපාලන හා වෙනත් වියදම් විශ්‍රාමඅරමුදල යටතේ ගිණුම් ගත කර නොතිබුණි.	විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල 1978 අංක 16 දරණ පනත මගින් පිහිටුවා ඇති අතර ඒ අනුව එහි පරිපාලන කටයුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් වන බැවින් පරිපාලන සහ වෙනත් වියදම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දරනු ලැබේ.	විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල 1978 අංක 16 දරණ පනත මගින් පිහිටුවා ඇති අතර ඒ අනුව එහි පරිපාලන කටයුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් වන බැවින් පරිපාලන සහ වෙනත් වියදම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දරනු ලැබේ.

විෂය	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපතිවෙත ඉදිරිපත් කිරීමට ඇති අදහස්	වර්තමාන තත්වය
5. පද්ධති හා පාලන	විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින් වර දන්වනලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකළ යුතුය. (අ) විශ්‍රාම වැටුප් ගෙවීම (ආ)විශ්‍රාම වැටුප් ක්‍රමය ඇගයීම	විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල් පද්ධති පාලනය කාලීනව පසු විපරමකට ලක්කිරීම හා අවශ්‍ය නිවැරදි කිරීම් කරනු ලැබේ.	කාලීනව පසු විපරමකට යටත්ව, අවශ්‍ය අවස්ථාවන්හිදී උපදෙස් මාලාවක් නිකුත් කරනු ලැබේ.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
2012.12.31 දිනට මූල්‍ය තත්ත්වය

	2012 වර්ෂය රු.	2011 වර්ෂය රු.
ජංගම නොවන වත්කම්		
දිගුකාලීන ආයෝජන	15,612,171,387	13,581,720,288
ණය	4,174,979,575	4,031,338,395
	19,787,150,962	17,613,058,683
ජංගම වත්කම්		
තොග	137,247	93,427
ලැබියයුතු පොලිය	1,692,094,329	1,269,239,876
ලැබියයුතු දායක මුදල්	133,563,334	111,913,193
ලැ/යුතු අර්ථසාධක ණය වාරික	28,831,961	23,218,056
වෙනත් අත්තිකාරම්	1,000	1,000
මුදල් හා මුදල් සමාන වත්කම්	5,107,417	13,435,521
	1,859,735,288	1,417,901,073
අඩුකළා : ජංගම වගකීම්		
බදු	123,550,316	103,109,648
ණයහිමියෝ	429,456	405,886
ගෙවියයුතු අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ	20,732,015	20,107,753
ගෙවියයුතු ජීවන වියදම් දීමනා හිඟ දායකමුදල්	270,399,312	0
ගෙවියයුතු මුද්දර බදු	37,050	19,075
	415,148,149	123,642,362
ශුද්ධ ජංගම වත්කම්	1,444,587,139	1,294,258,711
මුළු ශුද්ධ වත්කම්	**21,231,738,101**	**18,907,317,394**
මූල්‍යයනය වන්නේ,		
සාමාජික ගිණුම් ශේෂ	20,832,082,627	18,501,983,566
අක්‍රීය ගිණුම් සඳහා ප්‍රතිපාදන	3,000,000	8,000,000
පොලී අනුපාත සමාන කිරීමේ සංචිතය	0	281,650,220
රඳවාගත් ලාභ	396,655,475	115,683,608
අර්ථසාධක අරමුදලේ ශුද්ධ වටිනාකම	**21,231,738,102**	**18,907,317,394**

අකලේ තිස්ස නන්දසේන
ලේකම්

අ.කලේ උභයකුල රණවීර
ගණකාධිකාරී

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල

ආදායම් ප්‍රකාශය

2012-12-31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	2012 වර්ෂය රුපියල්	2011 වර්ෂය රුපියල්
ආදායම්		-
ආයෝජන ආදායම්	1,751,143,838	1,560,635,215
අඩු කළා : ආදායම් බදු	(140,091,507)	(124,850,817)
මුළු දළ ආදායම	**1,611,052,331**	**1,435,784,398**
මෙහෙයුම් වියදම්	(123,770)	(175,141)
මෙහෙයුම් ලාභය	**1,610,928,561**	**1,435,609,257**
එකතු කළා :		
පොලී අනුපාතය සමාන කිරීමේ සංචිත	281,650,220	(144,706,452)
අක්‍රිය ගිණුම් සඳහා වෙන්කිරීම්	5,000,000	(3,000,000)
ආදායමට ගැලපීම	9,030,091	8,650,171
පසුගිය වසරේ රඳවාගත් ලාභය	115,683,608	69,847,336
බෙදාහැරීම සඳහා ශුද්ධ ආදායම	**2,022,292,480**	**1,366,400,312**
සාමාජික ගිණුම් සඳහා පොලිය	(1,623,471,262)	(1,247,223,701)
අක්‍රිය ගිණුම් සඳහා වර්ෂයේ පොලිය	(2,047,720)	(3,493,003)
ඉදිරියට ගෙන යන ශේෂය	396,773,498	115,683,608

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2012 වර්ෂය රු.	2011 වර්ෂය රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්</u>		
ආයෝජන ආදායම්	1,751,025,815	1,560,635,215
සාමාජික ගිණුම් වලට බැරකල පොලිය	(1,625,518,982)	(1,250,716,704)
අනෙකුත් ගෙවීම්	(123,770)	(175,141)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**125,383,063**	**309,743,370**
<u>වත්කම්වල (වැඩිවීම) / අඩුවීම</u>		
තොගය	(43,820)	1,322
ලැබියයුතු දායක මුදල්	(21,650,141)	(28,500,259)
ලැබියයුතු ණය වාරික	(5,613,905)	(2,875,536)
ලැබියයුතු පොලිය	(422,854,453)	(400,374,900)
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ණය	(143,641,180)	(232,578,936)
<u>වගකීම් වල වැඩිවීම / (අඩුවීම)</u>		
ගෙවියයුතු හිඟ ජීවන වියදම් දීමනා දායක මුදල්	270,399,312	-
ණයහිමියෝ	23,570	151,342
නොගෙවූ ප්‍රතිලාභ	624,262	3,382,331
මුද්දර බදු	17,975	(15,375)
	(322,738,380)	**(660,810,011)**
බදු වලට පෙර මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ද මුදල් ප්‍රවාහය	**(197,355,317)**	**(351,066,641)**
වර්ෂය තුල ගෙවන ලද ආදායම් බදු	**(119,650,840)**	**(131,655,503)**
බදු වලට පසු මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(317,006,157)**	**(482,722,144)**
<u>ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය</u>		
භාණ්ඩාගාර බැඳුම්කර	2,886,249,517	(484,925,065)
අධිමිල බැඳුම්කර	4,999,384	0
ස්ථාවර තැන්පත්	(4,921,700,000)	(595,870,000)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(2,347,457,256)**	**(1,080,795,065)**
මූල්‍ය කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය		
වැඩිවූ සාමාජික මුදල්	2,330,099,061	1,595,345,513
ආදායමට ගැලපීම්	9,030,091	8,650,171
මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**2,339,129,152**	**1,603,995,684**
මුදල් හා මුදල් සමාන වත්කම්වල ශුද්ධ වැඩිවීම	(8,328,104)	40,478,475
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන වත්කම්	13,435,521	(27,042,954)
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන වත්කම්	**5,107,417**	**13,435,521**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

UNIVERSITY GRANTS COMMISSION (9) 14 OCT 2013 SECRETARY

UNIVERSITY GRANTS COMMISSION (2) 14 OCT 2013 CHAIRMAN

මගේ අංකය / எனது இல / My No: එස්/බී/යුජීඑෆ්/එෆ්එ/2012   ඔබේ අංකය / உமது இல / Your No.   දිනය / திகதி / Date: 2013 ඔක්තෝබර් 11 දින

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

Accountant
M. to prepare a report on each of the items ...

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති.

පිටපත් :- 1. ලේකම් , උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් , මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No : ඊසී/බී/යුජිඑෆ්/එෆ්ඒ/2012 | මබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date : 2013 ඔක්තෝබර් // දින

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12(5) උපවගන්තිය අනුව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2. <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1:3. <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone : 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. : oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 <u>තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළයුතු ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ ශේෂය රු.20,832,082,627 ක් වූ අතර එහි ඇතුළත් වූ රු.6,851,305 ක් වූ හඳුනා නොගත් ශේෂය හඳුනාගෙන අදාළ ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි.

(ආ) 2012 ජනවාරි 01 දිනට රු.8,000,000 ක්වූ අක්‍රීය සාමාජික වෙන් කිරීමේ ගිණුමේ ශේෂයෙන් වර්ෂය තුළදී විධිමත් අනුමැතියකින් තොරව රුපියල් මිලියන 05 ක මුදලක් සංචිත නමින් ආදායමට ගෙන තිබුණි.

(ඇ) හිඟ ජීවන වියදම් පියවීම සඳහා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල වෙත ලැබුණු රුපියල් මිලියන 500 කින් රුපියල් මිලියන 270.4 ක මුදලකට අදාල හිඟ ජීවන වියදම් දීමනාව ගණනය කර විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජික ගිණුම් වෙත බැර කිරීමට කටයුතු නොකර ගෙවිය යුතු ගිණුම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.3 ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) රු.20,732,055 ක් වූ ගෙවියයුතු අර්ථසාධක අරමුදල් (Refunds Payable) ශේෂය සකස් වී තිබුණේ සේවය අවසන් වී ඇති නමුත් සාමාජික අරමුදල් සඳහා හිමිකම් නොපෑ ශේෂයන්ගේ එකතුවෙනි. මෙම ශේෂයන් සඳහා ලියූ චෙක්පත් අවලංගු කර ඇති මුත් රු.19,437,750 ක් වර්ෂ 01 සිට 11 දක්වා කල් ඉකුත් වූ චෙක්පත් වටිනාකම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පනතේ 93 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණු අතර ලැබෙන පොළිය රාජ්‍ය ආදායමට බැර කිරීම වෙනුවට සාමාජික ගිණුම්වලට බැර කරන බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 41,600 ක ණයහිමි ශේෂයේ කාල විශ්ලේෂණය අවුරුදු 03 සිට අවුරුදු 09 දක්වා විහිදී තිබුණි.

2.2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කෙරේ.

නීති,රීති, යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2011 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය	2011 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සංශෝධනය කිරීමට කටයුතු කිරීමකින් තොරව භාණ්ඩාගාර එකඟත්වය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අධ්‍යයන දීමනාව, මුළු ඉපයීම් යන නිර්වචනය තුළට ඇතුළත් කර 2013 ජනවාරි 08 දින අංක 1000 දරන චක්‍රලේඛය නිකුත් කර තිබුණි. යථෝක්ත චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර අධ්‍යයන දීමනාව ඇතුළත් කිරීම හේතුවෙන් අර්ථසාධක අරමුදලට වැඩිපුර ලැබුණු රුපියල් මිලියන 217.49 දායකය පියවීමට හෝ විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට 2012 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.
(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 91 වගන්තිය	2012 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදලේ පිළිවෙලින් රු.1,610,934,308 ක හා රු.1,625,642,752 ක ආදායම් හා වියදම් ගිණුම්ගත කර තිබුණද අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරීත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි.
(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2001 පෙබරවාරි 02 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 3/2001	කිසියම් මාසයකට අදාළ අර්ථසාධක දායක මුදල් ඊළඟ මාසයේ 10 වෙනිදාට පෙර හෝ එදින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත ලැබිය යුතු වුවද විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන වෙතින් මාසයට අදාල සියලුම චෙක්පත් නියමිත දිනට එවා ඇද්ද යන්න හා එම චෙක්පත් අප්‍රමාදව බැංකුගත කලේද යන්න හඳුනාගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් අනුගමනය නොකරන බව විගණනයේදී අනාවරණය විය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම රු.2,022,174,457 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා බෙදාහැරීමට ඇති ශුද්ධ ආදායම රු.1,366,400,312 ක් විය.ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.655,774,145 ක වර්ධනය සඳහා ආයෝජන ආදායම රු.190,390,600 කින් වැඩිවීම සහ පොළී අනුපාත සමාන කිරීමේ සංචිත ගිණුම (Interest rate Equalization Reserve) හා අක්‍රීය සාමාජික වෙන්කිරීමේ ගිණුමෙන් පිළිවෙලින් රු.281,650,220 ක් හා රු.5,000,000 ක් නැවත ආදායමට ගැනීම විශේෂයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් විශ්වවිද්‍යාල සඳහා පිහිටුවා තිබූ අර්ථසාධක අරමුදලේ වියදම් ලෙස පොළී, විගණන ගාස්තු, බැංකු ගාස්තු හා ලිපි ද්‍රව්‍ය පමණක් ගිණුම් ගත කර තිබුණු අතර අනෙකුත් පරිපාලන හා වෙනත් වියදම් අර්ථසාධක අරමුදල යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාර සැලැස්ම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පිහිටුවා ඇති අරමුදලකි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ක්‍රියාකාර සැලැස්මෙහි, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සැලසුම්ගත කාර්යයන් පෙන්නුම් කරයි. 2011 / 2012 ක්‍රියාකාර සැලැස්ම අනුව වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇතිකර ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණද එම කාර්‍යය 2012 දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

6. <u>පද්ධති හා පාලනයන්</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකල යුතුය.

(i) සාමාජික අරමුදල් ලැබීම් හා නිදහස් කිරීම.

(ii) මුදල් හා බැංකු

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව

යොමුව	විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු	විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ	ගෙන ඇති පියවර වර්තමාන තත්වය 2014.01.21. දිනට
2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම			
2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළයුතු ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	2013 වර්ෂයේ ගිණුම් සමඟ ඉදිරිපත් කරනු ලැබේ.
2.2.2 ගිණුම්කරණ අඩුපාඩු	පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ. (අ) 2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ ශේෂය රු.20,832,082,627 ක් වූ අතර එහි ඇතුළත්වූ රු.6,851,305 ක්වූ හඳුනා නොගත් ශේෂය හඳුනාගෙන අදාල ගිණුම් වලට ගැලපීම් කර නොතිබුණි.	(අ) මෙ සම්බන්ධව පත්කල කමිටුවක් මගින් විමර්ශන කටයුතු සිදුවෙමින් පවතී.	කමිටු වාර්තාව ලැබුන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව අදාල නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබේ.
	(ආ) 2012 ජනවාරි 01 දිනට රු.8,000,000 ක්වූ අක්‍රීය සාමාජික වෙන් කිරීමේ ගිණුමේ ශේෂයෙන් වර්ෂය තුළදී විධිමත් අනුමැතියකින් තොරව රුපියල් මිලියන 05 ක මුදලක් සංචිත නමින් ආදායමට ගෙන තිබුණි.	(ආ) අවසන් ගිණුම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා නිසා මෙම කරුණුද එම අනුමැතියට යටත්වේ.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2012 වර්ෂයේ අවසන් ගිණුම් 2013.03.21 දිනැති 870 වන සැසිවාරය වෙත ඉදිරිපත් කර ඇත

යොමුව	විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු	විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ	ගෙන ඇති පියවර වර්තමාන තත්වය 2014.01.21 දිනට
	(ඇ) හිඟ ජීවන වියදම් පියවීම සඳහා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල වෙත ලැබුණු රුපියල් මිලියන 500 කින් රුපියල් මිලියන 270.4 ක මුදලකට අදාල හිඟ ජීවන වියදම් දීමනාව ගණනය කර විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජික ගිණුම් වෙත බැර කිරීමට කටයුතු නොකර ගෙවිය යුතු ගිණුම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	(ඇ) ජීවන වියදම් දීමනාවට අදාලව ගෙවියයුතු හිඟ අර්ථසාධක අරමුදල් දායකය විශ්වවිද්‍යාල වෙතින් ගණනයකර විගණනය කිරීමෙන් අනතුරුව අප වෙත එවූ පසු පමණක් සාමාජික ගිණුම් වලට බැර කිරීමට කටයුතු කර ඇති අතර, ඉතිරිය ගෙවියයුතු ගිණුම් ලෙස ගිණුම් ගතකර ඇත.	2013 වර්ෂය තුලදී හා ඉන්පසුව ද විශ්වවිද්‍යාල වලින් ලද ගණනය කිරීම් මත සාමාජික ගිණුම් වෙත හිඟ මුදල් බැර කරන ලද අතර 2013.12.31 දිනට ගෙවිය යුතු මුදල රු.මිලියන 117 කි.
2.2.3 ගෙවිය යුතු ගිණුම්	පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ. (අ) රු.20,732,055 ක්වූ ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් (Refund Payable) ශේෂය සකස්වී තිබුණේ සේවය අවසන්වී ඇති නමුත් සාමාජික අරමුදල් සඳහා හිමිකම් නොපෑ ශේෂයන්ගේ එකතුවෙනි. මෙම ශේෂයන් සඳහා ලියූ චෙක්පත් අවලංගු කර ඇති මුත් රු.19,437,750 ක් වර්ෂ 01 සිට 11 දක්වා කල් ඉකුත්වූ චෙක්පත් වටිනාකම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පනතේ 93 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණු අතර ලැබෙන පොලිය රාජ්‍ය ආදායමට බැර කිරීම වෙනුවට සාමාජික ගිණුම් වලට බැර කරන බව නිරීක්ෂණය විය.	(අ) එකඟ නොවේ. හිමිකම් නොපෑ ශේෂයන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පනතේ 93(1) වගන්තියට අනුව ගිණුමක් වසන අවස්ථාවේ වන ශේෂය හා ඊට අදාල පොලිය සමඟ ගෙවීමට කටයුතු කර ඇත. නමුත් සාමාජිකයා හිමිකම් නොපෑම නිසා ගිණුම වසන දින සිට පොලිය ගණනය කරනු නොලබන අතර පොලිය සාමාජිකයාට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමක් සිදු නොවේ.	-
	(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.41,600 ක ණයහිමි ශේෂයේ කාල විශ්ලේෂණය අවුරුදු 03 සිට අවුරුදු 09 දක්වා විහිදී තිබුණි.	(ආ) රු.41,600/- ක ශේෂය විශ්වවිද්‍යාල දෙකකට ගෙවිය යුතු ණය හිමි ශේෂ දෙකක් වුවත් එම විශ්වවිද්‍යාලවලඑවැනි ශේෂයක් ලැබිය යුතු ලෙස ගිණුම් පොත්වල සටහන්ව නොමැති බව තහවුරුකර දන්වා ඇත. එබැවින් එම ශේෂය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ.	2013 වර්ෂයේදී අදාල පරිදි කටයුතු කර ඇත.

යොමුව	විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු	විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ	ගෙන ඇති පියවර වර්තමාන තත්වය 2014.01.21 දිනට
2.2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම	පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කෙරේ.		
<u>නීති,රීති යනාදියට යොමුව</u> (අ) **2011 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය**	(අ) 2011 මාර්තු 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය සංශෝධනය කිරීමට කටයුතු කිරීමකින් තොරව භාණ්ඩාගාර එකඟත්වය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අධ්‍යයන දීමනාව, මුළු ඉපයීම් යන නිර්වචනය තුළට ඇතුළත් කර 2013 ජනවාරි 08 දින අංක 1000 දරන චක්‍රලේඛය නිකුත් කර තිබුණි. යථෝක්ත චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර අධ්‍යයන දීමනාව ඇතුළත් කිරීම හේතුවෙන් අර්ථසාධක අරමුදලට වැඩිපුර ලැබුණු රුපියල් මිලියන 217.49 දායකය පියවීමට හෝ විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට 2012 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.	(අ) ඉහත කරුණු සියල්ල ආවරණය වන පරිදි කැබිනට් පත්‍රිකාවක් පිළියෙල කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත.	කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමෙන් පසු උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යවා ඇත.

යොමුව	විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු	විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ	ගෙන ඇති පියවර වර්තමාන තත්වය 2014.01.21 දිනට
	නියමාවලිය		
(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 91 වගන්තිය,	(ආ) 2012 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදලේ පිළිවෙලින් රු.1,610,934,308 ක හා රු.1,625,642,752 ක ආදායම් හා වියදම් ගිණුම්ගත කර තිබුණද අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලිය සකස් කර නොතිබුණි.	(ආ) කෙටුම්පත් නියමාවලිය සකස්කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.	නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණය යටතේ පවතී.
(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2001 පෙබරවාරි 02 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 3/2001,	(ඇ) කිසියම් මාසයකට අදාළ අර්ථසාධක දායක මුදල් ඊළඟ මාසයේ 10 වෙනිදාට පෙර හෝ එදින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත ලැබිය යුතු වුවද විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන වෙතින් මාසයට අදාල සියළුම චෙක්පත් නියමිත දිනට එවා ඇද්ද යන්න හඳුනාගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් අනුගමනය නොකරන බව විගණනයේදී අනාවරණය විය.	(ඇ) අදාල චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් කිසියම් මාසයකට අදාල අර්ථසාධක දායක මුදල් හා ණය පියවීම් චෙක්පත් ඊළඟ මස 10 වන දිනට පෙර එවීමට කටයුතු කර ඇති අතර, මේ ගැන නිරතුරුව පසු විපරම් කරනු ලැබේ. එසේම, අර්ථසාධක අරමුදල් වෙත පෙ.ව.11.00ට පෙර ලැබෙන චෙක්පත් එදිනම බැංකු ගතකිරීම සහ පෙ.ව. 11.00 ට පසු ලැබෙන චෙක්පත් පසුදින බැංකුගත කිරීම අනිවාර්යයෙන්ම සිදුවේ. මේ සම්බන්ධව නිලධාරියකුගේ අධීක්ෂණය ඇතිව ක්‍රමවත් වැඩපිළිවෙලක් අනුගමනය කෙරේ.	අදාල පරිදි අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මකවේ.

යොමුව	විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු	විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ	ගෙන ඇති පියවර වර්තමාන තත්වය 2014.01.21 දිනට
3. මූල්‍ය සමාලෝචනය 3.1 මූල්‍ය ප්‍රතිඵල 4. මෙහෙයුම් සමාලෝචන	.	එකඟවේ.	
4.1 කාර්ය සාධනය	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් විශ්වවිද්‍යාල සඳහා පිහිටුවා තිබූ අර්ථසාධක අරමුදලේ වියදම් ලෙස පොළී, විගණන ගාස්තු, බැංකු ගාස්තු හා ලිපි ද්‍රව්‍ය පමණක් ගිණුම් ගතකර තිබුණු අතර අනෙකුත් පරිපාලන හා වෙනත් වියදම් අර්ථසාධක අරමුදල යටතේ ගිණුම් ගත කර නොතිබුණි.	විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල 1978 අංක 16 දරණ පනත මගින් පිහිටුවා ඇති අතර ඒ අනුව එහි පරිපාලන කටයුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් වන බැවින් පරිපාලන සහ වෙනත් වියදම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දරනු ලැබේ.	පරිපාලන හා වෙනත් වියදම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දරනු ලැබේ.
5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය			

යොමුව	විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද කරුණු	විගණකාධිපති වෙත යොමුකර ඇති පිළිතුරු සහ නිරීක්ෂණ	ගෙන ඇති පියවර වර්තමාන තත්වය 2014.01.21 දිනට
5.1ක්‍රියාකාරී සැලැස්ම	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පිහිටුවා ඇති අරමුදලකි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්මෙහි, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සැලසුම්ගත කාර්යයන් පෙන්නුම් කරයි. 2011 / 2012 ක්‍රියාකාරී සැලැස්ම අනුව වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇතිකර ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුනද එම කාර්යය 2012 දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සේවකයන් සඳහා වෛද්‍ය රක්‍ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී.	මේ සම්බන්ධව කමිටුවක් පත්කරන ලද අතර එම කමිටුව විසින් අදාල කටයුතු අධ්‍යයනය කරමින් පවතින අතර ඉදිරියේදී අවශ්‍ය පියවර ගැනීමට සැලසුම්කර ඇත.
6. පද්ධති හා පාලනයන්	විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින්වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකල යුතුය.		
	(i) සාමාජික මුදල් ලැබීම් හානිදහස් කිරීම.	(i) **සාමාජික මුදල් නිදහස් කිරීම** - 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන මත ක්‍රියාකරනු ලැබේ.	සාමාජික මුදල් ලැබීම් නිදහස් කිරීම හා මුදල් හා බැංකු කටයුතු ක්‍රමවත්ව සිදුවේ.
	(ii) මුදල් හා බැංකු	(ii) මුදල් හා බැංකු කටයුතු ක්‍රමවත්ව සිදුවන බව කාරුණිකව දැනුම් දෙමු.	